# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2022 අගෝස්තු 31 වන බදාදා
දෙවන කාණ්ඩය තිස් නවවන කලාපය
මිල රු. 70 යි

ධරණී ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

ඇහිඳගෙන කනවා කියලා හිතුවට කිකිළියෝ කන්නෙත් 5 ස්ටාර්වලින්

පස්ස ලොකු කරල පෙන්නන්න ගිහින් පස්සේ පසුතැවෙනවා එහෙම නෙවෙයි!

ත්‍රස්තවාදීන්ගෙන් ඇහුවත් පවුල් කන විදිය ස්ත්‍රීවාදීන්ගෙන් අහන්න එපා

අලුත්නුවර සිට මහනුවරට සුරනිමල එක්ක පයින් ගිය සුනබයා

මරාගෙන මැරෙන්න බලාගෙන හිටපු අයට මූණ සුදුවෙන ක්‍රීම් ගාන්න හිතිලා

ආචාර්ය පබිලිස් සිල්වාගේ කෑම වට්ටෝරු පොතක් නොමිලේ






ව්‍යවසායිකා (Redpierrot)

**දුලීකා රත්නායක**

ඡායාරූපය ප්‍රදීප් දඹරගේ | පසුතලය ගාන්ධාර - කොළඹ 6

# NILNETHU CAKE & ACADEMY කේක් නිර්මාණ ප්‍රදර්ශනය ද








කිරිබත්ගොඩ පිහිටි 'NILNETHU CAKE & ACADEMY' හි සිසු සිසුවියන්ගේ දක්ෂතා එළිදැක්වීම, උපාධි ප්‍රදානෝත්සවය සහ කේක් නිර්මාණ ප්‍රදර්ශනය පසුගිය අගෝස්තු 21 වෙනිදා උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා කොළඹ 07, බණ්ඩාරනායක සම්මන්ත්‍රණශාලා (BMICH) පරිශ්‍රයේදී පැවැත්විණි. එහිදී කේක් පාඨමාලා හැදෑරූ සිසු සිසුවියන්ගේ සුවිශේෂී දක්ෂතා දැකබලා ගැනීමට හැකියාව ලැබුණු අතර ඔවුන්ගේ පාඨමාලාවල අවසානයද එසේ සනිටුහන් විය.

සිව්වැනි වරටත් සංවිධානය කර තිබූ එම උත්සවය පැවැත්වුණේ 'NILNETHU CAKE & ACADEMY' හි ප්‍රධාන උපදේශිකා ලසන්ති දිනේෂා කුමාරි විතානගේ මහත්මියගේ මූලිකත්වයෙනි. ඊට එහි වත්මන් සිසු සිසුවියන් මෙන්ම ආදි සිසු සිසුවියන්, දෙමව්පියන් ඇතුළු නරඹන්නන් විශාල පිරිසක් සහභාගී වූ බව දක්නට ලැබුණි. මෙම උත්සවයේ විද්‍යුත් මාධ්‍ය අනුග්‍රහය 'TV දෙරණ' විසින් ලබාදුන් අතර මුද්‍රිත මාධ්‍ය අනුග්‍රහය ලබාදුන්නේ 'ධරණී' පුවත්පත මගිනි.





# දෙවැනි ගමනට හැඩවුණු මනාලී



2022.08.24 දින 'ධරණී මනාලිය' පිටුවේ පළවූ මනාලියගේ ඡායාරූප ලබාගත් ඡායාරූප ශිල්පියා සචින්ද මාතාංජනයි. ඔහුගේ නම වෙනුවට පසුගිය කලාපයේ වෙනත් නමක් පළවීම සම්බන්ධයෙන් අපගේ කණගාටුව පළකර සිටිමු.

හැඩගැන්වීම: රූපලාවණ්‍ය ශිල්පිනී සබීනා මුතුකුඩ





ඡායාරූප: ලක්මාල් වික්‍රමසිංහ

සම්බන්ධීකරණය : ක්‍රිෂාන්ත පුෂ්පකුමාර



අද 'ධරණී මනාලිය' පිටුවෙන් ඉදිරිපත් කරන්නේ දෙවැනි දවස සඳහා මනාලියකට සුදුසු මංගල විලාසිතාවකි. විවාහ ගිවිසගැනීමක් සඳහාද මේ විලාසිතාව සුදුසුය.

"මම අද මගේ නිරූපිකාව වශයෙන් තෝරාගෙන තියෙන්නේ නිපුනි ප්‍රමෝද්. ඇය සිහින් සිරුරක් හිමි පැහැපත් තරුණියක්. සරල මේකප් ක්‍රමයක් භාවිතා කරල තියෙනවා වගේම අයි මේකප් එක සඳහා මෙරූන් පාට සහ ගෝල්ඩ් පාට යොදාගෙන තියෙනවා. ඇගේ සාරිය ඉතාම චාම් එකක්. සාමාන්‍ය සාරිය අන්දන ක්‍රමයට වඩා වෙනස් ක්‍රමයකට තමයි අන්දවලා තියෙන්නේ. ස්වීකුයින්ස් ඇල්ලූ රෙද්දකින් නිමකරලා තියෙන සාරියේ ජැකට් එකේ අත් දිගට දාල මහලා තියනවා. කොණ්ඩා විලාසිතාව සඳහා චාම් විලාසිතාවක් යොදාගෙන ඇති අතර හිස් පළඳනාව සඳහා කෘත්‍රිම රෝස මල් යොදාගෙන ඇත. මල් කළඹ සඳහා ස්වාභාවික නෙලුම් මල් යොදාගෙන ඇති අතර නෙලුම් මලේ පෙති නමා රෝස මලක් ආකාරයට සකසා ඇත. තවද වේලාගත් ස්වාභාවික මලක් වූ බේබිස්බ්‍රෙත් මල් වර්ගය දමා තවත් අලංකාර කර ඇත. රන් ආලේපිත සිහින් මංගල කරමාලයක් හා එයටම ගැලපෙන කරාබු දෙකක් සහ බැංගල් එකක් යොදාගෙන ඇත. විශේෂයෙන් රාත්‍රී සාදයකට වඩා සුදුසු යැයි සිතන මෙම විලාසිතාව සිහින් උස යුවතියන් සඳහා වඩාත් සුදුසය."

# ඇහිඳගෙන කනවා කියලා හිතුවට කිකිළියෝ කන්නෙත් 5 ස්ටාර්වලින්



පසුගිය කාලයේ වැඩිපුර කතා වුණේ අන්තරේ ගැනය. එහෙත් අද බොහෝදෙනා කතා කරන්නේ බිත්තරේ ගැනය. දුප්පත්ම එකාගේ බත්පතේ පවා සැනසිල්ලට තිබුණේ බිත්තරය වුවත්, කිකිළියන් දාන්නේ රත්තරන් බිත්තරදැයි සිතෙන තරමට දැන් ඒවායේ මිලද ඉහළ ගිහින්ය.

ඒ නිසා බිත්තරයක් අලෙවි කළ හැකි උපරිම සිල්ලර මිල නියම කරමින් රජය අතිවිශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කළේය. ඒ ඉකුත් 20 වනදා සිට ක්‍රියාත්මක වන පරිදිය. ඒ අනුව සුදු බිත්තරයක් රුපියල් 43ක මිලකටත්, රතු (දුඹුරු) බිත්තරයක් රුපියල් 45ක මිලකටත් ලෙස උපරිම සිල්ලර මිලක් නියම කෙරිණි.

දැන් ඒ මිලට ගන්නට තබා බිත්තරයක් දකින්නටවත් නැත. මීට මාස කිහිපයකට කලින් බිත්තරේ මිල තිබුණේ රුපියල් දහඅටට, විස්සටය. එය ඉකුත් කාලයේ රුපියල් හැටට, හැටපහට ඉහළ නැංවුණේ ඒ වැඩිවීම කොතැනින් කෙළවර වේ දැයි සිතාගත නොහැකි පසුබිමක් තුළය. පාරිභෝගික සේවා අධිකාරිය බිත්තර පාරිභෝගිකයන් වෙනුවෙන් ඉදිරිපත් වුණේ එවන් තත්ත්වයක් තුළය.

**“අපේ ගෙදර ළමයි තුන්දෙනාට බිත්තරය ගානේ දෙන පුරුද්දක් කාලයක ඉඳන් තිබුණා. හැබැයි බිත්තර මිල හැටට, හැටපහට ගියහම ඒ පුරුද්ද අත් හරින්න වුණා. ඉඳලා හිටලා තමයි ගෙදරට බිත්තර ගෙනාවේ. දැන් ළඟපාත කඩේකවත් ආසාවට ගන්න බිත්තරයක් නැහැ. මිල අඩුවුණු එක නම් හොඳයි. මොකද දරුවෝ කැමැත්තෙන් කෑවේ බිත්තරේ. අපිට ළමයින්ට දෙන්න පුළුවන් දෙයක් විදියට තිබුණෙත් බිත්තරේ විතරයි. දැන් ඒකත් නැහැ.”**

ඒ දෙමටගොඩ, සහස්පුර පදිංචි රෝස් මැතලිනා මහත්මියයි. ඇය වාගේම බොහෝ දෙමාපියන් පාසල් යන දරුවන්ට උදේට බිත්තරයක් තම්බා දෙන්නේ ඉන් ලැබෙන පෝෂණය වැඩෙන දරුවෙකුට ඉතා වැදගත් බැවිනි. අඩුම ආදායමක් ලබන මවකට පියෙකුට වුව දරුවා වෙනුවෙන් බිත්තරයක් මිලදී ගන්නට අවස්ථාව තිබුණි. එහෙත් අද එය කරගන්නට බැරි මාපියන් බොහොමයකි. කිරිපිටි ටිකද ගිනි ගණන්ය. මස්, මාළු ද එසේය. අනෙකුත් බඩු භාණ්ඩවල මිලද එසේය. ඉතින් දරුවන්ගේ පෝෂණයද දැන් කොට උඩය.

**“බිත්තර නිෂ්පාදකයෝ අපිට බිත්තරයක් දෙන්න කැමති රුපියල් පනස්පහට, පනස්හයට. මොකද එයාලා කියන විදියට බිත්තරේක නිෂ්පාදන මිල පනහක් වෙනවා. නිෂ්පාදකයා අපිට බිත්තරයක් දෙන්න කැමති ඒ මිලට. එතකොට රුපියල් හතළිස්තුනට, හතළිස්පහට බිත්තරයක් විකුණන්න අපිට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ දවස් ටිකේ බිත්තර ගත්තේ නැහැ. පාරිභෝගිකයෝ ඇවිත් අහන්නෙත් අඩු මිලට බිත්තර ගන්න තියෙනවද කියලයි. අපි විකුණන්නෙත් පොලුයි, බිත්තරයි විතරයි. දැන් බිත්තර නැති නිසා පොල් විතරක් විකුණනවා.”**

ඒ බත්තරමුල්ලේ වෙළඳසැලක් පවත්වාගෙන යන එම්.බණ්ඩාර ‘ධරණී’ට කී දේ ය. බිත්තර මිල සම්බන්ධයෙන් ඇතිවී ඇති ගැටලුව ගැන සමස්ත ලංකා බිත්තර නිෂ්පාදකයින්ගේ සංගමයේ සභාපති සරත් රත්නායක මහතාගෙන්ද අප කරුණු විමසුවෙමු.

**“අපි බිත්තරයකට මිල නියම කරන්නේ එහි නිෂ්පාදන වියදමත් සලකා බලලයි. ඉකුත් කාලයේ මෙම කර්මාන්තය විශාල වශයෙන් පාඩු ලබපු කර්මාන්තයක්. ඒ බව වගකිව යුතු පාර්ශව දන්නවා. මොකද සෑම මාස තුනකට වරක්ම පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් පිරිවැය වාර්තාවක් නිකුත් කිරීම කරනවා. ඒ අනුව අගෝස්තු මාසයේ මැද වෙනකොට බිත්තරයක නිෂ්පාදන පිරිවැය රුපියල් පනහකට ආසන්න අගයක් විදියට දැක්වුණා. ඒ ගැන වෙළඳ ඇමතිවරයාත් දැනුවත්වයි හිටියේ. ඒ වගේම රුපියල් හැටට, හැටපහට බිත්තරේ මිල ඉහළ යාම සමඟ රුපියල් පහකින් මිල අඩු කරන්නත් අපි සාකච්ඡා කරලා තිබුණේ. එහෙම පසුබිමක් තියෙද්දී මේ විදියට උපරිම සිල්ලර මිලක් නියම කර ගැසට් පත්‍රයක් නිකුත් කිරීම ඉතාම ගැටලුසහගතයි. මොකද සත්ව ආහාර සඳහා යොදාගන්න බඩඉරිඟු සොයාගැනීමේ ගැටලු තියෙනවා. ඒ ගැන අපි වෙළඳ ඇමතිවරයා සමඟ සාකච්ඡා කළා. මේ සිද්ධියෙන් පස්සේ රුපියල් පනහටවත් බිත්තරයක් අලෙවි කරන්න එතැනදී කතාවුණා. එහෙම කතා වුණෙත් මේ ගැටලුවට ස්ථිර විසඳුමක් ලැබෙනතුරුයි.**

**ඒ වගේම මේ ව්‍යාපාරයට අධික විදියට මුදල් වැයවෙනවා. කුකුළු ගොවිපොළක් නඩත්තු කරනෙක ලේසි පහසු නැහැ. බෙහෙත් වර්ග, විටමින් වර්ග, කිකිළියන්ට දෙන ඉන්ජෙක්ෂන්වලට ලොකු මුදලක් වැයවෙනවා. එහෙම ගනිද්දී බිත්තරයක් හදන්න දරුවෙක් හදන්න වගේ මහන්සි වෙන්න වෙනවා. මේ වෙලාවේ බිත්තරයක් පනහකටවත් අලෙවි කරන්න ඕන කියන්නේ ඒකයි.”**

**අද දරුවන්ට කිරිපිටිත් නෑ, මස් මාළු කන්නත් බෑ. අඩුවට තිබුණු බිත්තරෙත් නෑ**

බිත්තර මිල පහල යාමත් සමඟ බිත්තර ආප්පයේ මිල, බිත්තර කෑම එකේ මිල පහල යනු ඇතැයි අපේක්ෂා කළද, තාමත් එවැන්නක් සිදු වී නැත. ඒ වෙනුවට වුණේ බිත්තර වෙළඳපොළෙන් අතුරුදන් වීමය. එහෙත් බිත්තරයක් සති දෙකකට වඩා කල් තබාගැනීමේ හැකියාවක් නැත. සුපිරි වෙළඳසැල්වල අලෙවි කරන්නට තබා ඇති බිත්තරවල කල් ඉකුත්වන කාලය දෙසතියක් ලෙස සටහන්ව තිබේ. ලේබල් කළද නොකළද බිත්තර නිෂ්පාදකයාට බිත්තර තොග වෙළඳපොළට නිකුත් නොකොට තබාගත හැක්කේ එතරම් කලක් පමණි. එසේනම් දැනට උද්ගතව ඇති ගැටලුව ඉක්මනින් විසඳගැනීම අවශ්‍යය. නැත්නම් බිත්තර කර්මාන්තය වාගේම පුද්ගලයෙකුට බිත්තරයෙන් ලබාගත හැකි පෝෂණයද අහිමිව යන්නේය.

බිත්තරේ අද කතාව එසේ වුවත්, බිත්තරේ ගුණ ගැන අප දන්නේ කලක පටන්ය. ඒ වාගේම අද ඇතිවී ඇති බිත්තර හිඟය තුළ ඒ ආශ්‍රිත කර්මාන්ත බොහොමයක් කරගෙන යාමට නොහැකි වී තිබේ. ඒ අතර කේක් කර්මාන්තය මූලිකය. තවද රූපලාවණ්‍ය නිෂ්පාදන සඳහාද අමුද්‍රව්‍යයක් ලෙස බිත්තර භාවිතා කෙරේ.

මේ තරම් වටිනා කියන බිත්තරේ ගැන, පෝෂණවේදිනී වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මියගෙන් අප කරුණු විමසුවෙමු.

**“ඇත්තටම දිනපතා මහන්සි වෙලා වැඩ කරන පුද්ගලයෙකුට වගේම පාසල් යන වයසේ දරුවෙකුට දිනකට බිත්තරයක් ලබාදීම දෛනික ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් වැඩි කොටසක් සම්පූර්ණ කරන්න හේතු වෙනවා. බිත්තර සුදු මදයේත්, කහ මදයේත් පෝෂ්‍ය පදාර්ථ රැසක් තිබෙනවා. විශේෂයෙන්ම වැඩෙන වයසේ සිටින දරුවෙකුගේ මාංසපේෂි වර්ධනයට අත්‍යවශ්‍ය පෝෂ්‍ය පදාර්ථයක් වන ප්‍රෝටීන් ලබාගන්න පහසුම ක්‍රමයක් ලෙස බිත්තර සුදු මදය හඳුන්වන්න පුළුවන්. ඊට අමතරව බිත්තර සුදු මදයේ ඇමයිනෝ අම්ල අඩංගුයි. කොලෙස්ටරෝල් රෝගියෙකුට නම් බිත්තර කහ මදය සුදුසු නැහැ. ඊට අමතරව ගර්භණී මවකට වුවත් අවශ්‍ය පෝෂණ සංඝටක රැසක් බිත්තරේ තියෙනවා. ඒ අතර ප්‍රෝටීන්, විටමින්, ඛණිජ ලවණ වගේම අත්‍යවශ්‍ය මේද අම්ල තියෙනවා. මෙය ආසාත්මිකතා නැති ආහාරයක්.”**

**නිෂ්පාදන වියදම එක්ක රුපියල් හතළිස් තුනට බිත්තර දෙන්න බැහැ. නිෂ්පාදන වියදමම රුපියල් පනහට වැඩියි**



ආසාත්මිකතා ඇතිවන්නේ බිත්තර මිල ඇසූ විටය. එනම් දරන්නට බැරි මිලකට පාරිභෝගිකයාට බිත්තර මිලදී ගත නොහැකිය. කිකිළියට කරන සත්කාර සමඟින් බිත්තරයක් ගැසට්ටුවේ මිලට ලබාදීමටද නොහැකිය. එසේනම් බිත්තර කර්මාන්තකරුවාත්, පරිභෝගිකයාත් ආරක්ෂා කරමින් කර්මාන්තය රැකගන්නට රජය මැදිහත් විය යුතුය. නැත්නම් රත්තරන් ආහාර වළඳ රන් බිත්තර දැමීම කිකිළියන් නවතා දැමිය යුතුය.

**දීපා වසන්ති එදිරිසිංහ**

# පාකර් පෑනෙන් ලියපු අඩි විස්සක් දිග ආදර හසුන
# අදටත් මගේ කොට්ටේ යට තියෙනවා

අද මෙන් ජංගම දුරකතන නොතිබුණු එදා, පෙමින් බැඳුණු සිත්වල ප්‍රේමණීය හැඟුම් එහා මෙහා ගියේ හසුන්පත් අස්සේ රිංගාගෙනය.

එසේ පිටු ගණන් ලියූ පෙම් හසුනක මතක උණුසුම විඳිමින් අදටත් ජීවිතය විඳින අපූරු ප්‍රේමවන්තියක් මාතලේදී අපට මුණගැසුණි. ඈ දැන් අසූහත්වන වියේය. දරු මුණුබුරන්ගේ ආදරය විඳිමින් කල් ගෙවීවත් එදා ලැබුණු අඩි විස්සක් දිග ආදර හසුන අද අගේ ජීවිතය සන්තකව ඇති ලස්සනම සිහිවටනයයි.

**"මම ඒ කාලේ ඉගෙනීම හමාර කරලා නැටුම් ගුරුවරියක් විදියට පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ සේවය කළා. ඒ දවස්වල ඉතින් හැඩට රූවට හිටියට පෙම්වතෙක් එහෙම හිටියේ නැහැ. ඔය කාලේ 'චලන චිත්‍ර' කියන සිනමා පත්තරේක පෑනේ මිතුරු සංගමයක් තිබුණා. මාත් ඒකට මගේ විස්තර යැව්වා. ඉතින් ටික දවසක් යද්දි මගේ නමට ලියුම් ගොඩක් ආවා."**



ඒ ආ ලියුම් ගොන්න අතරේ තිබූ එක හසුන්පතක් ළඟ හැඩකාර බ්‍රියට්‍රිස් ජයතිලකගේ නෙත නතර වුණේය. ලිපියේ ලියා තිබූ වදන්වල හෘදයාංගම බව හමුවේ ඈ ද නොදැනුවත්වම ප්‍රේමයේ නාමයෙන් හදවතේ දොරගුළු විවර වෙමින් තිබිණි. සිකුරා ඇය වෙත බැල්ම හෙලන්නට පටන්ගත්තේ එහෙමය. මේ ලියුමේ අයිතිකාරයා වූයේ දෙන් ධර්මසිරි තිලක් අබේසේකර ය.

**"එයාගේ අදහස් මගේ හිතට ඇල්ලුවා. යාළුවෙක් විදියට මම මුලදි ලියුම් ලිව්වා. එයත් දිගටම ලියුම් එව්වා. ඔහොම ටික කාලයක් ලියුම් ලියාගෙන යද්දි එයාට මාව බලන්න ඕන කියලා තිබුණා. ඉතින් මම අම්මටත් මේ ලියුම් හුවමාරුව ගැන කියලයි තිබුණේ. එයා අපේ ගෙදර ඇවිත් කතාබහ කරලා ගියා. ඒ ගිහිල්ලත් ආයෙම ලිපි ලිව්වා. මාත් මග බලාගෙන ඉන්නවා ඉතින් එයාගේ ලියුමක් එනකල්. ඔය විදියට එයා කිහිපවරක් අපේ ගෙදර ආවා ගියා. එතකොට ඉතින් අපි දෙන්නා පෙම්වතුන්. අපේ ගෙදරිනුත් කැමැත්ත දීලයි තිබුණේ.**

**ඔය අතරේ මම එයාට දිග ලිවුම් එවන්නේ නැහැ කියලා දොස් කියලා මට ලිපියක් එවලා තිබුණා. මට ඒ ලියුම දැක්කම හොඳටම කේන්ති ගියා. මම පිළිතුරු ලිපියක් ලිව්වා, අපි මේ සම්බන්ධය නවත්තමු, මම ලියපු ලිපි ටික මට ආපහු එවන්න කියලා. මම එහෙම කිව්වේ 1958 අවුරුද්දේ දවසක. ඒ ලියුම තැපැල් කරලා ටික දවසක් ගියා. ලියුමක් ගිහින් පිළිතුරු ලිපියක් එන්නත් ඒ කාලේ හැටියට සතියක් දෙකක් ගතවෙනවා. කොහොමහරි මට පිළිතුරු ලිපියක් ආවා. ඒ ලියුම ඒ4 කොළ එක පෙළට අලවලා අඩි විස්සක් දිග ලියුමක්. එක පැත්තක එයාගේ හිතේ මං ගැන තියෙන ආදරය ගැන ලියලා තිබුණා. අනෙක් පැත්තේ ලියලා තිබුණේ කවි. ඒ හැකියාව එයාට පිහිටලා තිබුණා. කොහොමහරි හොඳම දේ තමයි ඒ ලියුම ලියලා තිබුණේ මම එයාගේ උපන්දිනේට තෑගි දුන්නු පෑනෙන්. ඒ කාලේ ලංකාවේ තිබුණු ජනප්‍රිය වටිනා පෑනක් තමයි පාකර් පෑන."**

බ්‍රියට්‍රිස්ගේ දෙනෙත තුළ ඒ ආදර කතාවේ රූප රාමු අදටත් ජීවමාන යැයි හැඟෙන්නේ ඇගේ



දෙනෙත ඒ මතක සමඟ අදටත් දිලිසෙමින් ඇති හෙයිනි. තමන් එවූ ලිපියට ඔහු බලාපොරොත්තු වූයේ දිගු පිළිතුරු ලිපියක් වුවත් බ්‍රියට්‍රිස් ඔහුට ආයෙත් බැන්නේ 'ඇයි මෙච්චර දිග ලියුමක් එව්වේ' කියායි.

**"මං එහෙම බැන්නට ඒ ලියුමෙන් පස්සේ අපි දෙන්නා ආයෙත් යාළු වුණා. ආදරේ කරන්න**

> **මම පිළිතුරු ලිපියක් ලිව්වා, අපි මේ සම්බන්ධය නවත්තමු, මම ලියපු ලිපි ටික ආපහු එවන්න කියලා. ඒ ලියුම තැපැල් කරලා ටික දවසක් ගියා. ලියුමක් ගිහින් පිළිතුරු එන්නත් ඒ කාලේ හැටියට සතියක් දෙකක් ගතවෙනවා**

**ගත්තා. අපේ ආදරේ තවත් ශක්තිමත් වුණා. ඒ විදියට අපි අවුරුදු දහයක් ආදරය කරලා 1961 දී තමයි විවාහ වුණේ. විවාහවෙලා මාතලේ පලාපත්වල පදිංචියට ආවා. එතකොට මගේ වයස අවුරුදු විසිහයයි. මහත්තයත් මාත් හරිම සතුටින් ජීවිතය ගතකළා. ඒ ජීවිතය ඇතුළේ අපි හරි අවබෝධයෙන් කටයුතු කළා. අපිට පුත්තු තුන්දෙනෙක් ලැබුණා. අතීතේ මතක් කරද්දී ඉතින් අපි දෙන්නගේ රස කතාව තමයි ගොඩක් වෙලාවට මේ ලියුම. ඒ අතීතය අදටත් මිහිරියි."**

බුදු පිළිම නෙළීම ජීවනෝපාය කරගත් ඔහු පින් අතේ වැඩද කරන්නට කැමැත්තක් දැක්වූ අයෙකි. ඔහු 1964 වසරේ කොළඹ මහරෝහලේ සියලු වාට්ටු සඳහා එකල බුදු පිළිම පරිත්‍යාග කොට තිබේ. ඒ ඔහුගේ පරිත්‍යාගශීලී හිතේ එක් අවස්ථාවක් පමණි.

**"2013 දවසක මහත්තයා හදිසියේ අසනීප වුණා. ඉක්මනින් රෝහලට එක්ක ගියත් ඔහු අපිව දාලා ගියා. ඒ මොහොත මට දැනුණේ මගේ මුළු ලෝකයම කඩාගෙන වැටුණා වගේයි. මම ඒ දුකින් ඉන්නකොට මාව කුස්සියේ ඇදගෙන වැටිලා කකුලක් කැඩුණා. ඒකට ප්‍රතිකාර කළා.**



**ඒත් කකුල හරියටම සුව කරගන්න බැරි වුණා. දැන් කකුල තරමක් කොටයි. ඉතින් මම වැඩිපුරම ඉන්නේ ඇඳට වෙලා. හැබැයි හිතට තනිකමක් නැහැ. මගේ මහත්තයා දීපු දිගු ලියුමයි එයා ඒ ලියුම ලියපු පෑනයි කොට්ටේ යට තියාගෙන තමයි මම නිදාගන්නෙත්. ඒ දේවල් මම පණ වගේ ආරක්ෂා කරනවා. මගේ මහත්තයා මියයන්න කලින් දවසක පුතාලට කියලා තියෙනවා අම්මව ආදරෙන් බලාගන්න කියලා. මම අද දරුවන්ගේ ඒ ආදර සැලකිලි ලබමින් සතුටින් කාලය ගත**

> **අද එයා නැතත්, ඒ ආදරයයි දරුවන්ගේ ආදරයයි එක්ක මං සතුටින් ඉන්නවා**

**කරනවා. මගේ ලොකු පුතා ධම්මික මගේ සියලු උපස්ථාන කටයුතු කරනවා වගේම එයා තාත්තා කළ බුදු පිළිම නෙළා අලෙවි කිරීමේ රැකියාවත් දිගටම කරගෙන යනවා."**

බ්‍රියට්‍රිස් මාතාව එසේ කියා ඒ දිගු ලියුම නැවත කියවන්නට වූවාය. එය අද වනවිට කොතෙක් වාරයක් කියවූයේ දැයි කියන්නට ඇයවත් දන්නේ නැත.

අද බොහෝ පෙම් කතාවන් එක එස්.එම්.එස්. එකෙන් ඇරඹේ. ඊට ඕනෑ 'හායි' කියන්නට පමණි. එසේ ඇරඹෙන පෙම් කතාවක ආයු කාලය දවසදැයි දෙකදැයි කියන්නට කිසිවෙක් දන්නේ නැත. ඒ අතරේ අර්ථවත් ආදර කතාද නැතුවාම නොවේ.

**"අද සමහර තරුණ ළමයින්ට හොඳ ශක්තිමත් ආදරයක් ගොඩනගාගන්න බැරි විවිධ පටු අරමුණු නිසයි. සමහරුන්ගේ කපටිකම් වැඩියි. ඒත් අලුත් පරම්පරාවට අවබෝධයක් තියෙන්න ඕන තමන්ගේ ආදර සම්බන්ධය කොහොමද ඉදිරියට ගෙනයන්නේ කියලා. ඇත්තටම අනාගතයට සහකරුවෙක් සහකාරියක් තෝරගන්නවා කියන්නේ අද විවාහ වෙලා හෙට දික්කසාද වෙනවා කියනෙක නෙවෙයිනේ. ඉතින් බොහොම කල්පනාවෙන් තමන්ට ගැලපෙන කෙනා සොයාගන්න ඕන."**

ඇය එසේ කියන්නේ සිය ජීවන අත්දැකීම් ඇසුරිනි. ආදරණීය සැමියා අද ළඟ නැතත්, ඔහු දුන් ආදරය, සෙනෙහස අදටත් ඇගේ සිතේ සනිටුහන්ව ඇත්තේ කවියක් ලෙසිනි. ඒ දිගු ලියුමේ අකුරුවැල් අදටත් ඇගේ හදවත ආදරයෙන් ආමන්ත්‍රණය කරන බව එම දෙනෙත්හි අපූරුවට ලියැවී තිබේ.

**හේමන්ත ලියනපතිරණ**



# ලොවම පිළිගත් වෘත්තීමය සහතිකයක් සමඟින් බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ රැකියාවකට මං පෙත් විවර කර ගැනීමට

IBSL
INSTITUTE OF BANKERS OF SRI LANKA
CREATING STARS

## ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

සමඟින් එකතු වන්න.



**අප ආයතනයේ විශේෂත්වය වන්නේ -**

- ☑ 1979 අංක 26 දරණ පාර්ලිමේන්තු පනත මගින් බැංකු හා මූල්‍ය කටයුතු පිළිබඳ අධ්‍යයනය සඳහා පිහිටුවා ඇති එකම ආයතනය වීම
- ☑ ජාත්‍යන්තර පිළිගැනීම සහිත IABF සහ DABF පාඨමාලා
- ☑ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම විභාගය පැවැත්වීම
- ☑ අවම ගාස්තු අය කිරීම
- ☑ වර්ෂයකට දෙවතාවක් විභාග පැවැත්වෙන බැවින් අවම කාලසීමාවක් තුළදී පිළිගත් වෘත්තීයමය සුදුසුකමක් ලබාගත හැකිවීම
- ☑ බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ රැකියා සඳහා ප්‍රමුඛතාවයෙන් පිළිගැනීම

**ලියාපදිංචි වීමට අමතන්න**

අරුණ - 0740 166 121 හෝ සසී - 0740 166 116

## ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

1979 අංක 26 දරණ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (සංස්ථාපනය) පනත යටතේ පිහිටුවා, ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී බැංකු, සම්මාන හා ආශ්‍රිත සාමාජිකයින් නියෝජනය වන පාලක මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලබන ආයතනයකි.

80A, ඇල්විටිගල මාවත, කොළඹ 08 ☎ 01124 25 777 www.ibsl.lk facebook.com/ibsl.lk

## ත්‍රස්තවාදීන්ගෙන් ඇහුවත්

# පවුල් කන විදිය ස්ත්‍රීවාදීන්ගෙන් අහන්න එපා



මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා
**රත්නා පුෂ්ප කුමාරි**

විශ්වාස කරන්න අමාරු අමුතු පහේ කතාන්දර අහන්න දකින්න ලැබෙන එක මනෝ වෘත්තිකයෙකුට සාමාන්‍ය දෙයක්. නදීශාගේ කතාවත් මට එහෙම අමතක නොවුණු ටිකක් විශේෂ කතාවක්.

මේ කාන්තාව පිළිගත්තු වෘත්තියක නිරතවෙන ටිකක් ප්‍රසිද්ධ කාන්තාවක්. නදීශා කුඩා කාලෙදිම ඇගේ දෙමාපියන් වෙන්වෙලා. දික්කසාදෙන් පස්සේ දෙමව්පියෝ විදේශගත වෙච්චි නිසා ඇයව රැකබලාගෙන තියෙන්නේ ඇගේ නැන්දණිය.

තමන් කවදාවත් විවාහ වෙන්නේ නැහැ කියලා අම්මයි තාත්තයි වෙන්වුණු දවසේ නදීශා හිතාගත්තාලු. එහෙම හිතුවට මොකද උසස් අධ්‍යාපනය අහවර කළ හැටියේ හදිස්සියේම ඇය විවාහ වෙලා. හැබැයි සැමියා තමන්ට නීතිරීති දනවා වැඩියි කියලා අවුරුද්දක් යන්නත් කලින් නදීශා ඔහුගෙන් වෙන්වෙලා.

වසරකට පස්සේ නදීශා තවත් විවාහයක් කරගෙන. ඔහු වෙනත් ජාතියක අයෙක්. මේ පුද්ගලයා ඇයගේ ආගමික කටයුතු කරන ගමන් ඔහුගේ ආගමික කටයුතුවලටත් සම්බන්ධ වෙන්න කියලා දිගින් දිගටම ඇගෙන් ඉල්ලීම් කළාලු. මේ කාරණාව නොරිස්සූ නිසා නදීශා ඔහුගෙනුත් වෙන්වෙලා. නදීශා තුන්වනුවට විවාහවෙලා තියෙන්නේ ඇගේම වෘත්තීය සගයෙක්ව. ඇය රැකියාවෙන් ඉහළට යනවට ඔහු අකමැති බව හිතුණු නිසා ඔහුගෙන් වෙන්වෙන්න තීරණය කරලා. හැබැයි නීත්‍යානුකූලව වෙන්වෙන්න කලින් හදිසි අනතුරකින් ඔහු මියගිහින්.

නදීශා මේ වෙනකොට ඉන්නේ හතරවැනි සැමියා එක්ක. ඔහු සමඟ ඇතිකරගත්තු ගැටුමක් නිසා ඔහුගෙනුත් වෙන්වෙන්න ඇය තීරණය කරලා. නදීශගේ ඔය හතරවැනි

> **තමන්ගේ වැරදි නිසා පවුල රැකගන්න බැරිවෙන ගොඩක් ගෑනු උදවිය කරන්නේ පිරිමි සංහතියටම බැන බැන දැඩි ස්ත්‍රීවාදිනියන් විදියට සමාජයේ කැපිලා පේන්න දඟලන එක. එහෙම අයගෙන් පවුල් උපදෙස් අරගන්න ගියාම පවුල් කැඩෙන එක අහන්න දෙයක් නෙමෙයි**

> **හිසේ ඇම්මට කොට්ටෙ මාරු කරනවා වගේ මිනිස්සු මාරු කරලා කසාද ජීවිතේ ප්‍රශ්න විසඳන්න බෑ**

සැමියා තමයි ඇයව මගේ ළඟට එක්කරගෙන ආවේ.

බැලූ බැල්මටම නදීශා ටිකක් වෙනස් කාන්තාවක් බව මට තේරුණා. දික්කසාදයකයට යන්න තරම් මහා පරිමාණ වැරදි ඇගේ පැරණි සැමියන්ගෙන් මම දැක්කේ නැහැ. වරදක් තිබ්බත් උපදේශනයෙන්වත් කතාබහ මඟින්වත් ඒ වැරදි නිවැරැදි කරගන්න ඇය උත්සාහ කරලත් නැහැ. තමන් රැකියාවක් කරන බොහොම ස්වාධීන කාන්තාවක්, තමන්ට පුංචි වැරැද්දක් කළත් ඒ මනුස්සයව අතඇරලා දාන්න ඕනේ වගේ මතයක තමයි ඇය හිටියේ.

නදීශා බොහොම තද ස්ත්‍රීත්වාදිනියක් බවත් මට තේරුණා. අර ඊනියා ස්ත්‍රීවාදීන් කියන්නේ. පිරිමි සංහතිය එක්කම වෛරයෙන් ඉන්න එක තමයි නියම ගෑනුකම කියලානේ ඒ වගේ උදවිය හිතන්නේ. හැබැයි එහෙමයි කියලා තනියම ජීවත් වෙන්න නදීශා උත්සාහ කරලත් නැහැ.

නදීශාගේ ඔලුවට මේ වගේ අදහස් කාවැදිලා තිබුණේ ඇගේ නැන්දණිය නිසා. ඇය ස්ත්‍රීන් වෙනුවෙන් හඬ නගන මොකක්දෝ සංවිධානයත් ඉන්නවලු. මේ කාන්තාවත් දෙපාරක්ම දික්කසාද වුණු කාන්තාවක්. තමන්ගේ වැරදි නිසා පවුල රැකගන්න බැරිවෙන ගොඩක් ගෑනු උදවිය කරන්නේ පිරිමි සංහතියටම බැන බැන දැඩි ස්ත්‍රීවාදිනියන් විදියට සමාජයේ කැපිලා පේන්න දඟලන එක. එහෙම අයගෙන් පවුල් උපදෙස් අරගන්න ගියාම පවුල් කැඩෙන එක අහන්න දෙයක් නෙමෙයි.

සැමියා සැරෙන් වචනයක් කිව්වත් තමන්ට සීමා දනවාය, යටත් කරගන්නවාය කියලා හිතලා දික්කසාද වෙන්න හිතනවා නම් එක ස්ත්‍රීවාදයවත් ස්වාධීනත්වයවත් නෙමෙයි. මෝඩකම.

මේ ලෝකේ සීයට සීයක් සම්පූර්ණ මිනිස්සු නැහැ. ඉතින් කසාද බැඳලා ටික කාලයක් යනකොට දෙන්නට දෙන්නාගේ අඩුපාඩු පේන්න ගන්න එක සාමාන්‍යයි. කරන්න ඕනේ දෙන්නා එකතුවෙලා ඒ අඩුපාඩු හදාගෙන ඉස්සරහට යන එක මිසක සේරටෝම කලින් දික්කසාදේ ඉස්සරහට දාගෙන නටන එක නෙමෙයි.

බිරිඳක් වුණාම සැමියට යටත්වෙලා ඉන්න ඕනේ නැහැ. හැබැයි සැමියාව යටත් කරගන්න ඕනත් නැහැ. ස්වාධීන කාන්තාවක් කියන එක අනවශ්‍ය විදියට ඔලුවට ගන්න බිරින්දෑවරු සැමියව යටත් කරගන්න, පාලනය කරන්න උත්සාහ කරන බව මම දැකලා තියෙනවා. එහෙම දාගෙන ඉන්න කණ්ණාඩිය ගලවලා මධ්‍යස්ථ විදියට කාරණා දිහා බලනවා නම් දෙන්නට සමබරව පවුල ඉස්සරහට අරගෙන යන්න පුළුවන් බව මම නදීශාට පැහැදිලි කළා. දෙවැනි කෙනා බැන්දම පළවැනි කෙනා ඊට හොඳයි කියලා හිතුණා. හතරවැනි කෙනා බැන්දම ඊට කලින් හිටි තුන්දෙනාම ඔහුට වඩා හොඳයි කියලා හිතුණා කියලා එක්තැනකදී ඇය කිව්වා. ඉතින් පුංචිවට රණ්ඩු සරුවල් මතුවුණු තැන්වලදිම උපදේශනයට ගියා නම් නදීශාගේ ජීවිතේ මේ තරම් සංකීර්ණ නොවෙන්න ඉඩ තිබුණු බවයි මගේ මතය. මොන වැරැද්ද තිබුණත් බැඳගත්තු බෙරේ ගහන්න ඕනේ කියලා එහෙම නෙමෙයි මේ කතාවෙන් මට කියන්න අවශ්‍ය වුණේ. අතාරින්න ඉක්මන් වෙන්න කලින් වැරදි හදාගන්න උත්සාහ කරන්න. අනවශ්‍ය විදියට ස්වාධීන නැත්තම් ස්ත්‍රීවාදී කණ්ණාඩි දාගෙන පවුල් කන්න අමාරුයි. ඒ නිසා හැම කාරණාවක් දිහාම මධ්‍යස්ථව බලන්න. නිතරම මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන්න කියලනේ බුදුහාමුදුරුවොත් දේශනා කළේ. පවුල් ජීවිතේටත් ඒක අදාළයි.

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**



# අනිත් අයට නැති විදියේ ජීවිත කතාවක් මට තියෙනවා

## අනාථ නිවාසයකින් බිහිවුණු ඔස්ට්‍රේලියානු ක්‍රිකට් කණ්ඩායමේ නායිකාව

### ලීසා ස්ටාලේකර්

පූනේ, ඉන්දියාවේ මහාරාෂ්ට ප්‍රාන්තයේ විශාලතම නගරය. ඓතිහාසික අතින් විශාල වටිනාකමක් තියෙන නගරයක් වුණාට මේ නගරයේ දුප්පත්කම තියෙන්නේ ඒ වටිනාකම්වලට වඩා ඉහළින්. ඉතින් 1979 අගෝස්තු 13 වෙනිදා මේ කියන පූනේ නගරයේ අහසට වහලක්වත් නැති මුල්ලක ලස්සන කෙල්ලෙක් ඉපදෙනවා. අදටත් ඉන්දියාවේ සමහරු දුවකගේ ඉපදීම පිළිගන්න කැමති නැහැ. ඉතින් මේ කියන ගෑනු ළමයගේ දෙමාපියොත් ඇයව පිළිගන්න කැමති වුණේ නැහැ. ඒ පිළිගත්තත් ඇයට කන්න කෑම වේලක් දෙන්නවත් ඔවුන්ට වත්කමක් තිබුණේ නැහැ. ඒ නිසා ඉපදිලා මාසයක් යන්න කලින් මේ




දෙමාපියෝ ඇයව පූනේ ශ්‍රීවාස්තව ළමා නිවාසෙට බාරදුන්නා. ළමා නිවාසෙන් පුංචි දෝණිට නම තිබ්බේ 'ලයිලා' කියලා.

හරේන් සහ සූ ස්ටාලේකර් ජීවත්වුණේ ඇමරිකාවේ මිචිගන්වල. හරේන් ඉන්දියානු ජාතිකයෙක්. සූ බ්‍රිතාන්‍ය ජාතික කාන්තාවක්. පවුලට බරක් කරගෙන සමහරු දරුවන්ව පාරට විසි කරද්දී මේ දෙන්නා දරුවෙක්ගේ සුරතල් බලන්න අවස්ථාවක් දෙන්න කියලා දිවා රෑ දෙවියන් වැන්දා. දෙවියන් ඒ ප්‍රාර්ථනාවලට කන් නොදුන් නිසා ඔවුන් දුප්පත් බංග්ලාදේශ දියණියක්ව දරුකමට හදාගත්තා.

**"දුවෙක් වගේම මට පුතෙකුත් ඕනේ."**

සූ ඊළඟට පැතුවේ පුතෙක්ව. ඉතින් මේ යුවළ පූනේ ශ්‍රීවාස්තව ආශ්‍රමයට යන්නේ පිරිමි පුතෙක් හොයාගෙන. ඒ වෙලාවේ ආශ්‍රමයේ පුංචි පුතෙක් නොහිටි නිසා සූගේ ඇස් දෙක ඉබේටම වගේ ලයිලාගේ දිහාවට හැරුණා.

**"මෙන්න බලන්නකෝ. මේ කෙල්ලගේ මූණ අහිංසක පාටයි, ඇස් දෙක තරු දෙකක් වගෙයි."**

සූ හරේන්ගේ කනට කරලා කිව්වා.

නීතිමය වශයෙන් ලයිලව දරුකමට හදාගන්න ගත්තු ස්ටාලේකර් යුවළ ඇයට ලීසා ස්ටාලේකර් කියලා අලුත් නමක් දුන්නා. පසුව ඔවුන් ඇමරිකාවෙන් ඔස්ට්‍රේලියාවේ පදිංචියට ගියා.

අනුන්ගේ දරුවන්ට තමන්ගේ ලේ වලින් හදපු දරුවන්ට වගේ සලකන්න පුළුවන් මිනිස්සු මේ ලෝකේ ඉන්නවා. හරේන් සහ සූත් ලීසාට සැලකුවේ එහෙම. හරේන් උපතේ ඉඳලා ක්‍රිකට්වලට ආදරේ කළ මනුස්සයෙක්. ඉතින් ඔහු ලීසාවත් පුංචි කාලේ ඉඳලම ක්‍රිකට්වලට යොමු කළා. පාසල් කාලේ ඉඳලා ක්‍රිකට් ක්‍රීඩා කරපු ලීසා ඒ අතරම සිඩ්නි විශ්වවිද්‍යාලයෙන් මනෝවිද්‍ය ශාස්ත්‍රපති උපාධියත් සම්පූර්ණ කෙරුවා.

මනෝවිද්‍යාව ඉගෙනගත්තත් ලීසාට අවශ්‍ය වුණේ ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඉහළට යන්න. ඉන්දියානුවන්ගේ ලේ වල ක්‍රිකට් ක්‍රීඩාව තියෙන බව ඈ නිතරම විශ්වාස කළා. 1997 දී පන්දු යවන්නියක් විදියට ඔස්ට්‍රේලියානු ක්‍රිකට් ලීගයට ඇතුළුවෙන ලීසා ඇගේ මංගල තරඟයේදීම හොඳින් දස්කම් පෙන්නුම් කළා. ඊටපස්සේ ක්‍රීඩා කරපු හැම තරඟයකම හොඳින් ක්‍රීඩා කළ නිසා 2000 වර්ෂයේදි ඇයට ඔස්ට්‍රේලියානු ජාතික කාන්තා ක්‍රිකට් කණ්ඩායමට ඇතුළු වෙන්න වාසනාව ලැබුණා.

ලීසාගේ මංගල ජාත්‍යන්තර තරඟය පැවැත්වෙන්නේ එංගලන්තෙට එරෙහිව. ඔය තරඟෙදිත් ඇය නරඹන්නන් පුදුමවෙන තාලේ පිතිහරඹක නිරත වුණා. ඊටපස්සේ 2001 අවුරුද්දේ ඔස්ට්‍රේලියානු කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ ඉදිරි පෙළ තරඟකාරියක් විදියට ක්‍රීඩා කළා. 2005 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියේ දෙවැනි තරඟෙදි නොදැවී ලකුණු 120ක් ගහන ලීසා ඒ තරඟාවලියේ හැම තරඟයකම වාර්තාගත විදියට විකට් දවාගන්නවා. ඔය දස්කම් නිසාම 2007දී ඔස්ට්‍රේලියානු ජාතික කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වය පූනේ ළමා නිවාසෙන් ඔස්ට්‍රේලියාවට ගිය ලීසාට ලැබෙනවා.

තුන් ඉරියව් ක්‍රීඩිකාවක් වෙච්චි ලීසා ස්ටාලේකර් ලෝකයේ ප්‍රමුඛතම තුන් ඉරියව් ක්‍රීඩිකාව විදියට ශ්‍රේණිගත වෙලා තියෙනවා. ඒ විතරක් නෙමෙයි එක්දින තරඟවලදී ලකුණු 1000ක් සහ කඩුලු 100ක් දවාගත් පළමු ක්‍රිකට් ක්‍රීඩිකාව ඇයයි.

2013 ඔස්ට්‍රේලියාව කාන්තා ලෝක කුසලානය දිනාගනිද්දී ලීසාත් ක්‍රිකට් කණ්ඩායමට තරඟ කළා. කොහොම නමුත් 2013 අවුරුද්දෙදී ක්‍රිකට් ක්‍රීඩාවට සමුදෙන්න ලීසා තීරණය කළා. ක්‍රිකට් ක්‍රීඩාවට සමුදෙනකොට ඇය ක්‍රීඩා කරලා තියෙන ජාත්‍යන්තර තරඟ ප්‍රමාණය 187ක්. මේ වෙනකොට ඇය ඔස්ට්‍රේලියානු තරඟ විස්තර විචාරිකාවක් විදියට කටයුතු කරනවා.

**"අරන් හදාගත්තු කෙනෙක් කියලා දැනගත්තම සමහරු පුදුමෙන් වගේ මගේ දිහා බලනවා. දරුකමට හදාගත්තු කෙනෙක්ද කියන එකට වඩා ඒ කෙනාගෙන් ලෝකෙට වෙන සේවයයි වටින්නේ. අනික අනිත් යාළුවොත් එක්ක බැලුවහම මට කියන්න විශේෂ කතාවක් තියෙනවා. ඒ ගැන මට සතුටුයි."**

ලීසා කියන්නේ අර ලස්සන ඇස්වලින් හිනාවෙවී. ලෝකයේ විශිෂ්ටතම ක්‍රිකට් ක්‍රීඩිකාවක් විදියට අද ඇගේ නම ක්‍රිකට් ඉතිහාසයේ ලියැවිලා. උත්සාහය කැපවීම තියෙනවා නම් කාගේ කවුද, එන්නේ කොතැනින්ද කියන එක අදාළම නැහැ කියන එක නෙමෙයිද ලීසා අපිට කියලා දෙන පාඩම?

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**



ධරණී

# ඇස් දෙක නොපෙනුනාට

# ඔයාලා කියන ඕන තැනකට එන්නම්

**රටේ ඕනෑම තැනකට ගොස් පුටු වියන සහ ඒ උපයන මුදලින් ජීවත්වෙන විපුල සරත් ප්‍රනාන්දු සහ කමලා රණසිංහ යුවළ ගැනයි මේ කතාව. මේ දෙදෙනාම දෑස් නොපෙනෙන අයවලුන් වීමයි ඔවුන්ගේ කතාවේ විශේෂත්වය**

සරත් ටියුෂන් ගුරුවරයෙකි. 2002 වසරේ මේ කියන දවසේත් ඔහු සිටියේ සුපුරුදු පරිදි ටියුෂන් පන්තියක උගන්වන ගමන්ය. දෑස් දෙකම නොපෙනුණත් පන්තියට ළමයින්ගේ හිඟයක් නොතිබුණේ හතළිස් වියැති සරත් ඉගැන්වීමේ කාර්යයෙහි සූරයෙකු වූ නිසාය. එදා එලෙස පන්තියේ උගන්වමින් සිටියදී සරත්ගේ අතිජාත මිත්‍රයෙක් ඔහු සොයාගෙන පන්තිය ළඟට ආවේය. රැයක් දවාලක් නැතිව හොඳට සූර් වෙන්නෙකු වශයෙන් මිතුරන් අතරේ නම් දරා සිටි ඒ මිත්‍රයා පැමිණ තිබුණේ සරත්ගෙන් පුංචි අතමාරුවක් කරගන්නටයි.

**"යාළුවා ඇවිත් දවල්ට බත් එකක් කන්න**

> **යාළුවගේ බත් එක ඔතලා තිබුණු පත්තර පිටුව අපේ ජීවිත සම්පූර්ණයෙන්ම වෙනස් කළා**

**කියලා රුපියල් සීයක් ඉල්ලුවා. මේ හාදයා කරටි කැඩෙන්න බොන බව දන්නා නිසා මට සැක හිතුණා කන්න කියලා සල්ලි ඉල්ලන්නේ බොන්නවත්ද කියලා. පස්සේ මං කිව්වා රුපියල් සීයක් දෙන්නම්, හැබැයි කෑවේ බත් කියලා ඔප්පු කරන්න බත් එක ඔතලා තියෙන පත්තර පිටුව මට ගෙනැත් පෙන්නන්න කියලා. ඉතින් ඒ කිව්ව විදියට එදා බත් එක කාලා මිනිහා පත්තර පිටුවත් අරගෙන මාව හොයන් ආවා."**

ඒ පත්තර පිටුව සරත්ගේ ජීවිතය මුළුමනින්ම වෙනස් කරන්නට යන එකක් බව මිතුරා තියා සරත්වත් දැන සිටියේ නැත. නිකමට මෙන් එහි පළකර තිබූ මංගල යෝජනාවකට පිළිතුරු ලියා ඇගේ පාර්ශවයෙන් ඊට ප්‍රති උත්තරයක් ලැබෙන තෙක් සරත් බලා සිටියේය. දින කීපයක ඇවෑමෙන් ඒ පිළිතුරු ලිපියත් ඇගෙන් ලැබුණි. මොරටුවේ විපුල සරත් ප්‍රනාන්දුත් කුරුණෑගල, වාරියපොල කමලා රණසිංහත් එක වහලක් යටට පැමිණියේ එහෙමය.

**"කමලගේ එක ඇහැක් සම්පූර්ණයෙන්ම පේන්නේ නෑ. අනෙක් ඇහැත් තියෙන්නේ පේන නොපෙනෙන ගණනට. මමත් උපතින්ම අන්ධ කෙනෙක් නෙවෙයි. මගේ එක ඇහැක් හොඳට පෙනුණා. එකයි නොපෙනුණේ. ඒත් පොඩි කාලේ එක දවසක් මගේ පෙනීම තිබුණු ඇහේ අපේ නංගිගේ ඔළුව තදින්ම වැදුනා. ඒ වෙලාවේ ඒක වැඩිය ගාණක් වුණේ නෑ. ඒක නිසා නාලා කාලා දවල් ටිකක් නිදාගත්තා. අනේ දෙයියනේ ඇහැරෙද්දි මගේ ඒ ඇහැත් පේන්නෙ නෑ. අම්මලා පෙනුම ගන්න මාව අරන් නොගිය තැනක් නෑ. ඒත් වැඩක් වුණේ නෑ. ඊටපස්සේ ඉතින් අවුරුදු දහතුනේ ඉඳන් මං සම්පූර්ණයෙන්ම අන්ධයි."**

විවාහය කොතරම් රසවත් වුවද සරත්ටත් කමලාටත් ඊළඟට ආ නීරසම ප්‍රශ්නය ස්ථිර ආදායම් මාර්ගයක් නැතිකමය. අන්ධභාවය සහ වයස්ගතවීම එක්ක ටියුෂන් පන්ති කෙරිල්ලත් හිතන තරම් පහසුවක් වුණේ නැත. ඇරත් එය ස්ථිර රැකියාවක්ද නොවේ. එනිසා මේ දෙදෙනා එක්ව අලුත් වැඩකට අතගැසුවෝය. ඒ පුටු විවීමටය.

**"ඒ කාලේ අපේ අම්මලා අක්කලා එහෙම කැඩුණු පුටු වියනවා. එතකොට මං පුංචියි. ඉතින් මං ඒ දිහා බලාගෙන ඉඳලා කොහොම හරි පුටු වියන වැඩේ ඉගෙනගත්තා. කමලටත් පුරුදු කළා. ඊටපස්සේ දෙන්නම ගමක් ගමක් ගාණේ ගිහින් පුටු වියන රස්සාව පටන්ගත්තා."**

මුලදී ඔවුන්ට එය ලේසිවුණේ නැත. ඔවුන්ගේ අන්ධභාවය නිසා එවැනි වැඩක් භාරදෙන්නට මුලදී ඇතැමුන් අදිමදි කළහ. එහෙත් සියල්ල කණපිට පෙරලුණේ මොහොමඩ් ෆවුසාන් නමැති මුස්ලිම් තරුණයෙකු ඔවුන්ගේ කතාව දුරකතන අංකයක්ද සමඟ මුහුණුපොතට එකතු කිරීමත් සමඟිනි.

**"එයින් පස්සේ හෝ ගාලා අපට වැඩ එන්න පටන්ගත්තා. සමහර දවස් තිබුණා දවසට කෝල් හතළිහ පනහ ආවා. මගේ පොඩි ෆෝන් එකක් තියෙන්නේ. ඒ ෆෝන් එකේ කෝල් රෙකෝඩ් වෙන්න චිප් එකක් දාලා හදාගෙන තියෙන්නේ. ඉතින් එන කෝල් ආයේ ආයේ අහලා වැඩවලට යනවා. ඒ හැමදේටම කමලගේ ඇහැ පෙනෙන ටික ගොඩාක් උදව් උපකාර වෙනවා."**

එහෙම කියන්නේ 60 හැවිරිදි සරත්ය. ඔහු එසේ කියද්දී ඔහුගේ 59 හැවිරිදි බිරිඳ ද ඊට අඩුවැඩිය එකතු කළේ මෙලෙසිනි.

**"අපිට දරුවෝ නෑ. මමයි මහත්තයයි ජීවත්වෙන්නේ මේ රස්සාවෙන්. දැන් අපිට හොඳට වැඩ තියෙනවා. ලංකාවේ කොහේ වැඩක් තිබුණත් අපි දුර ගැන නොහිතා යනවා. මොරටුවේ ඉඳන් නුවරඑළි, ගාල්ල, මාතර පවා ගියපු අවස්ථා තියෙනවා. හැබැයි කොහේ ගියත් බස්වල තමයි යන්නේ."**





මේ උදා වී ඇත්තේ දිනෙන් දිනම හැමදේම මිල ඉහළ යන කාලයකි. ඒ නිසාම දැන් පුටු වියන්නට අය කරන මිල ගැනද අපි ඇගෙන් නිකමට ඇසුවෙමු.

**"පුටුවේ ප්‍රමාණය එක්ක තමයි මිල ගණන් තීරණය වෙන්නේ. එහෙමයි කියලා මහා ලොකු ගණන් නම් කියන්නේ නෑ. හාන්සි පුටුවක් වගේ**

> **සමහරු අපිට ගොඩාක් අනුකම්පා කරනවා. ඒත් අපි ඒකට ආස නෑ**

**නම් තුන්දාහක් වගේ ගන්නවා. ඇඳි පුටුවක් වියන්න දෙදාස් අටසීයක් වගේ. කෑම මේසයක පුටුවක් වගේ නම් එක්දාස් පන්සීයකට විතර වියන්න පුළුවන්."**

ඇය එසේ මිල ගණන් කියාගෙන යද්දී ඔවුන්ගේ අසරණකම ප්‍රයෝජනයට ගෙන ඔවුන්ව අමාරුවේ දැමූ මිනිසුන් නැද්දැයි යන්න අපි විමසුවෙමු. ඊට ඇය සිනාසී දුන්නේ මෙවන් පිළිතුරකි.

**"එහෙම මිනිස්සු නම් තාම මුණගැහිලා නෑ. මුණගැහෙන්නත් එපා. දැනට අපිට වැඩ දීපු මිනිස්සු නම් හරි කරුණාවන්තයි. අපේ මිල හාරදාස් පන්සීයයි නම් එයාලා පන්දාහක්ම දෙනවා. කවදාවත් මිල අඩුකරන්න අරක මේක කියලා නාහෙන් අඬන්නේ නෑ. සමහර ගෙවල්වලින් කන්න බොන්න ටික පවා ලැබෙනවා."**

සින්මාස්ටික් වැල්වලින් පුටුවක් විවීම හිතන තරම් ලේසිපහසු නැත. එහි පළපුරුදුකාරයෙකුට වුවද ඊට ගතවෙන කාලය බොහෝය. එහෙත් දෑස් නොපෙනෙන සරතුත් ඔහුගේ බිරිඳත් ඒ වැඩේට රුසියෝය. එසේ කියන්නේ අප නොව සරත්මය.

**"පුටු වියනවා කියන එක ලේසි නෑ. මට පේන්නෙත් නැති නිසා සමහරු අහනවා කොහොමද මෙච්චර හොඳට වියන්නේ කියලා. මං හිතන්නේ ඒක මගේ පළපුරුද්ද. ඒ වගේමයි පුටුවක් වියන්න ඉවසීමයි, මානසික ඒකාග්‍රතාවයි, කල්පනා ශක්තියයි හොඳට තියෙන්නත් ඕනේ."**

මේ වනවිට දෙනෙත් නොපෙනෙන ඔහුත් ඇයත් කා ඇඳ ඉන්නේ පුටු වියා අරගන්නා මුදලිනි. ඔවුන් පවසන්නේ දෙදෙනාට ජීවත්වීමට තරම් එයින් ප්‍රමාණවත් මුදලක් අතට ලැබෙනා බවකි. ඇස් කන් හොඳින් පෙනෙන ඇතැමුන් පවා අතට රැකියා ලැබෙනකල් බලා සිටින කාලයක මේ යුවළගේ ධෛර්යය ගැන අප ආඩම්බර විය යුතුය. නමුත් පමණට වඩා අනුකම්පාවට නම් දෙදෙනාගේම කැමැත්තක් නැත. අපට ඒ වගක් තේරුණේ අවසාන මොහොතේ සරත් මහතා කී කතාවෙනි.

**"සමහරු අපිට ගොඩාක් අනුකම්පා කරනවා. ඒත් අපි ඒකට ආස නෑ. අපි අන්ධ බව ඇත්ත. ඒත් අපි අන්ධයි කියලා අපිට හිතිලා නෑ. මමයි කමලයි පුදුම ආසාවකින් මේ පුටු වියන්නේ. එහෙම පුටුවක් වියලා හම්බකරන කීයෙන් කීයෙන් හරි තමයි බත් කටක් කාලා අපි දෙන්නා ඊයේ බැඳපු ජෝඩුවක් වගේ සතුටින් හිනාවෙලා ඉන්නේ. පත්තරේ අපේ කතාව කියවන හැමෝගෙන්ම මං ඉල්ලනවා ඔබේ ගෙදරත් කැඩුණු පුටු තියෙනවා නම් අපිට කියන්න කියලා. කොච්චර දුරක හිටියත් එක පුටුව වියලා දෙන්න හරි අපි දෙන්නා ගෙදරටම එනවා. මොකද එක පුටුවත් අපිට සෑහෙන්න වටිනවා."**



රුවන් එස්.සෙනවිරත්න

# ළමයා හොඬවැලක් එක්ක ඉපදුණොත් වගකීම මම ගන්නම්



අලි කතා

තොරතුරු -
මහාචාර්ය
අශෝක දංගොල්ල
(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මිනිසුන්ගේ පෙම් පලහිලව්වලට උදව් උපකාර කරන සතුන් කොතෙකුත් ඇත. චිංගීස් අයිත්මාතව් රචනා කළ ‘සමුගනිමු ගුල්සාරි’ කෘතිය ඊට උදාහරණයකි. එහිදී සිය ස්වාමියා තනබායි, රෑ පානේ පෙම්වතියගේ නිවසට යනවිට මුර වැඩේ කළේ ගුල්සාරි නම් අශ්වයාය. එක අතකින් පෙම්වතිය තනබායි කෙරේ බැඳෙන්නට ගුල්සාරිගේ හැඩද හේතු වන්නට ඇත. අශ්වයන් හිඟ අපේ රටේ එවැනි මගුල් කපුකම් කරන්නෝ වෙත්නම් බොහෝදුරට ඒ අලි ඇතුන්ය. අලි ඇතුන්ට පෙම් බඳින ඇතැම්හු ඔවුන්ගේ හිමිකරුවන්ට මෙන්ම ඇත්ගොව්වාටද ආල වඩන අවස්ථා නැතුවාම නොවේ. බොහෝවිට ඒවායේ කෙළවර ඇතිවන ජරමරද එසේ මෙසේ ඒවා නොවේ. මේත් එවැනි කතාවකි.

මෙම අත්දැකීමට මුහුණදුන්නේ රත්නපුරේ අලි හිමියෙකි. රාජකාරියක් වෙනුවෙන් ඔහුගේ අලියෙකු තරමක් දුර බැහැර වූ වැඩපොළකට පිටත්කර යැවීමට සිදුවිය. ඒ, සති කිහිපයක කාලසීමාවක් වෙනුවෙනි. ඇත්ගොව්වාද අලියා සමඟ ගියේය. හෙතෙම ඉතා මිත්‍රශීලී තැනැත්තෙක් නිසා ගම්මුන් සමඟ කිට්ටු සබඳතාවක් ගොඩනගා ගැනීමට ඔහුට අපහසු නොවීය. අලියා සමඟ සිටීම නිසාම ඔහුට හිමිවූ ආකර්ෂණයද සුළුපටු නැත. එලෙස ඉඟිබිඟි කළ ගමේ ගැටිස්සියක් කෙරෙහි ඇත්ගොව්වාගේ හිත ගියේය. ඈ සමඟ පෙමින් බැඳුණු ඇත්ගොව්වා අලියා සමඟ ආ කාරිය කරන අතරේ පෙම් කාරියද හොඳටම කළේය. මේ අතරතුර අලියා වැඩපොළෙහි සිටියදී ඇත්ගොව්වා තරුණියගේ නිවසට නිතර යාමට ඒමට පටන්ගත්තේය. ඇතැම් දිනවල ඔහු රාත්‍රිය ගතකළේද එහිය. මේවා දැක දැක අලියා මුනිවත රැක්කේය. හෙතෙම සිය සගයාගේ ප්‍රේමයට අකුල් හෙලන්නට ගියේ නැත. ඒ වෙනුවට තමාගේ රාජකාරිය නිසි පරිදි ඉටු කළේය. කිසිවකුගෙන් චෝදනාවක් නොලබා අලියා තම කාරිය ඉටුකළ නිසා කොලුවාගේ කාරියටද කාගෙන්වත් බාධාවක් නොවීය.

මෙලෙස සති කිහිපයක් ගතවිය. අලියාගේ වැඩකටයුතු අවසන්ය. එනිසා තවදුරටත් එහි රැඳී සිටීමේ අවශ්‍යතාවක් නැත. එහෙමයි කියා අලියා තනියෙන් නිවෙස කරා යැවිය නොහැකිය. ඇත්ගොව්වාද ඒ සමඟ පිටත් විය යුතුය. අලියා සහ ඇත්ගොව්වා ගම්බිම් බලා ගියහ. ප්‍රේමයට තාවකාලික විරාමයක් ලැබුණි. තරුණිය වෙන්වීම දරාගත්තේ අසීරුවෙනි.

සිදුවීමෙන් අනතුරුව දින සති මාස ගෙවී ගියේය. මාස තුන හතරකට පමණ පසු අලි හිමියාගේ නිවසට අමුත්තෝ පැමිණියහ. ගැබ්බර කාන්තාවක් සහ ඇගේ මව යැයි සිතිය හැකි තැනැත්තියක් ඒ අතර විය. අලි හිමියා මීටපෙර කෙදිනකවත් ඔවුන් මුණගැසී නැත. එනිසා ඔහු ඔවුන් සමඟ කතාබහා කොට ආ කාරණාව ගැන විමසා සිටියේය. කාන්තාවන් දෙදෙනා පැමිණ තිබුණේ ඔහුට අයත් අලියකු සහ ඇත්ගොව්වකු හමුවීමටයි.

අලි හිමියාගේ හිස කරකැවෙන්නට ගත්තේ ඉතිරි තොරතුරු විමසීමෙන් පසුවය. මව සහ දියණිය පැමිණ තිබුණේ සිය අලියා මාස කිහිපයකට පෙර රාජකාරි කළ ගමේ සිටය. දියණිය ගැබ්ගෙන ඇත. දරුවාගේ පියා අලියා භාරව සිටි ඇත්ගොව්වා බවත් එනිසා අලි හිමියාගෙන් වන්දියක් අවශ්‍ය බවත් මව කීය. මේ ඉල්ලීමෙන් උතුර දකුණ මාරු වුවද අලි හිමියා කල්පනාකාරීව පිළිතුරු දුන්නේය. ඔහු එහිදී අලියා තමාට අයත් බව එකහෙලාම පිළිගත්තේය. නමුත් ඇත්ගොව්වා තමාට අයත් නොවන බව හෙතෙම පැවසීය. එනිසා දරුවා හොඬයක් සහිතව ඉපදුණහොත් දරුවාගේ සියලු වගකීම් තමා දරන බවත් නොඑසේනම් තමාට වගකීම බාරගත නොහැකි බවත් ඔහු පෙන්වා දුන්නේය. පිළිතුරෙන් අසතුටට පත් මව සහ දියණිය පිටව ගිය අතර නැවත කිසිදු එහි පැමිණි බවක් දැනගන්නට නැත.

**රෂ්නිකා ලියනගේ**




F.A.Ads

ඔබට මුදල් හදිස්සියක්ද? නැත්නම් ඔබේ වටිනා රන් භාණ්ඩ සින්න වෙන්න යනවාද?

ඕනෑම බැංකුවක උකස් තබා ඇති රන් භාණ්ඩ ගණුදෙනුවක් සඳහා

පවුමට රු. 43,000/- ක් ම වැඩිපුර

1% ක අඩුම පොලියට ලබා ගන්න

ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න

විශේෂ සහන රැසක් සමගින්

නැවත බේරා ගැනීමේදී පහසු ගෙවීමේ ක්‍රමයට Loan එකකුත්

*කොන්දේසි අදාළවේ

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | මීගමුව | 0766 227 056 |
| කොටහේන | 0702 539 382 | ගම්පහ | 0779 230 549 |
| වැල්ලවත්ත | 0710 870 686 | කළුතර | 0776 167 149 |
| ග්‍රෑන්ඩ්පාස් | 0742 379 739 | හලාවත | 0779 256 191 |
| මොරටුව | 0766 227 059 | මාතර | 0705 979 237 |
| පානදුර | 0767 952 286 | ගම්පොල | 0710 870 735 |
| වෙන්නප්පුව | 0710 869 378 | නාවලපිටිය | 0710 870 706 |
| ගාල්ල | 0705 979 274 | හැටන් | 0778 790 372 |
| කුරුණෑගල | 0766 227 061 | කෑගල්ල | 0703 583 363 |
| දිගන | 0778 156 738 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බේරුවල | 0740 920 356 | පුත්තලම | 0771 201 861 |
| මතුගම | 0771 201 860 | මහියංගනය | 0771 201 862 |
| මොණරාගල | 0771 201 852 | වත්තේගම | 0742 551 103 |
| බදුල්ල | 0771 201 863 | හපුතලේ | 0760 677 018 |
| කල්පිටිය | 0761 605 803 | මාතලේ | 0702 539 389 |
| කටුගස්තොට | 0779 476 206 | තලවකැලේ | 0710 871 009 |
| නාඋල | 0763 226 230 | රාගල | 0710 870 703 |
| කන්තලේ | 0742 572 585 | පූඩළුඔය | 0740 929 541 |
| පොතුවිල් | 0771 201 855 | මස්කෙලිය | 0760 909 822 |
| වැලිමඩ | 0778 764 751 | පුස්සැල්ලාව | 0742 531 360 |
| බගවන්තලාව | 0742 588 267 | | |



# දැන් වැහි නැති හෙණ ගැහුවත් බයවෙන්න කාරි නෑ

වෙඩි ප්‍රහාරවලින් වැළකී සිටීම පිණිස පලඳින ආරක්ෂිත කබා ආදී මෙවලම් පිළිබඳව අපි කොතෙකුත් අසා ඇත. නමුත් වෙඩි සහ අකුණුවලින් මුළුමනින් ආරක්ෂා වීමට සූරයක බහා ගෙල පළඳින තෙලක් පිළිබඳ බොහෝදෙනෙකු අසා නැතුවාට සැක නැත. එම තෙල හැඳින්වෙනුයේ ‘හෙනරාජ තෛලය’ නමිනි. එක්දහස් නවසිය හැත්තෑව දශකයේ පොළොන්නරුව ප්‍රදේශය ආශ්‍රිත විවිධ සාපරාධී ක්‍රියාවන්ට සම්බන්ධ බවට සැක කළ එච්.එම්. විජයසුන්දර හෙවත් ‘පොඩි විජේ’ බොහෝදෙනෙකු හඳුන්වන ලද්දේ වෙඩි නොවදින විස්මිත බලයක් ඇත්තෙකු ලෙසය. ඊට හේතුව ඔහු නිතරම හෙනරාජ තෛලය සහිත සූරයක් ගෙලෙහි පැළඳ සිටි නිසා බව කියැවෙයි. නමුත් පසුකලෙක ඔහු මරණයට පත්වූයේද පොලිස් වෙඩි පහරකට ලක්වීමෙනි. ඒ සම්බන්ධයෙන් පැතිරගිය කටකතාව වූයේ පොඩි විජේ කිසියම් කිලි සහිත කාරියකට සම්බන්ධ වීමට එම මහා බලගතු සූරය ගලවා තැබූ අවස්ථාවක් සෝදිසියෙන් සිටි පොලිසිය ඒ මොහොතේ ඔහුට වෙඩි තැබූ බවය. කිලි සහිත කාරිය කාන්තා ඇසුරක් බව එවකට ප්‍රචාරය වුවද එය පදනම් විරහිත කටකතාවක් විය යුතුය යන්න මගේ පෞද්ගලික විශ්වාසයයි.

නමුත් එම කටකතාවට අනුව පැහැදිලි වෙන්නේ හෙනරාජ තෛලය කෙතරම් බලවත් එකක් වුවද ‘කිල්ල’ නමින් ජන සම්මත තත්ත්වයන් හමුවේ එහි බලය නිෂේධ වන බවකි.

මම ඉන්පසු මෙම හෙනරාජ තෛලය පිළිබඳ අප්‍රකට තොරතුරු විමසා දැනගනු පිණිස ඒ සම්බන්ධයෙන් කරුණු දැන සිටි කිහිපදෙනෙක් වෙත ගියෙමි.

ප්‍රදේශවාසීන් විපුලසේන අයියා නමින් හඳුන්වන ලද ගණේමුල්ලේ, තිබ්බටුගොඩ පියදාස විද්‍යාරත්න මහතා ප්‍රවීණ ජ්‍යෝතිර්වේදී පරපුරක සාමාජිකයෙකි. තම පරපුරේ පැරැණ්නන් විසින් පුස්කොළ පොත්වලින් උපුටාගෙන සටහන් කළ පැරණි යන්ත්‍ර මන්ත්‍ර රාශියක් සහිත අභ්‍යාස පොත් ගොන්නක් එවක විපුලසේන අයියා සතුව තිබිණි. ඊට අඩසියවසකට හෝ ඊටත් එපිට කාලයක කටු පෑනකින් හෝ තීන්ත පෑනකින් ලියන ලද ඒ සටහන් පසුකලෙක දුර්වර්ණ තත්ත්වයක තිබූ අතර, ඔහු මට එම පොත් පරිශීලනය කිරීමට දීම කාරුණිකව ප්‍රතික්ෂේප කරන ලද්දේ එය තම පරපුරේ ආදිතමයන් එදා මෙදා තුර අනුගමනය කළ සම්ප්‍රදායක් බව පවසමිනි. එහෙත් හෙනරාජ තෛලය ජීවම් කිරීමේ මන්ත්‍රය හැරුණුකොට සෙසු කරුණු පැවසිය හැකි බව කී ඔහු නැවත දිනයෙක පැමිණ හමුවන මෙන් ඉල්ලා සිටි අතර, මම මහත් කැමැත්තෙන් ඊට එකඟ වීමි.

**“ඔය හෙනරාජ තෛලය හිඳලා ජීවම් කරනවාය කියන එක ලේසි වැඩක් නෙවෙයි. ඕක හිඳින ක්‍රම කීපයක්ම තියෙනවා. අපේ පරම්පරාවේ මන්තර පොත්වල තියෙන්නේ මෙන්න මෙහෙමයි.”** විපුලසේන අයියා තම කතාව ඇරඹීය.

ඔහු කී පරිදි ඒ සඳහා රන් තැඹිලි ගසකින් ලබාගන්නා නෑඹුල් පලය ආරක්ෂිතව නෙළාගෙන ජ්‍යෝතිෂ්‍යයේ ඒ සඳහා සුදුසු බව හැඟවෙන නැකතක් මුල්කොට එය වියළා, තෙල් සිඳගත යුතුය. පසුව එම රන් තැඹිලි තෙල් හෙනරාජ තෛලය ජීවම් කරන මන්ත්‍රයෙන් ලක්ෂ වාරයක් ජීවම් කරගත යුත්තේ දහසකුත් බාධා අභිබවමිනි. එම මන්ත්‍රය ජීවම් කරන අතරේ කැරලයෙකුගේ හෝ කණකොකෙකුගේ හැඬීමක් සිදු වුවොත් එම ජීවමේ බලය මුළුමනින්ම සිඳී බිඳී යයි. ඒ අතරවාරයේ මරණයක් සිදුවීම සේම මාස් ශුද්ධිය සිදුවන කාන්තාවක් හෝ කොටහළු වූ හෙවත් අලුත වැඩිවිය පත්වූ දැරියක ඒ අහලින් පහලින් ගියද ජීවම මුළුමනින්ම බල රහිත වේ. එමෙන්ම එම ජීවම සිදු කරන්නා මස්, මාළු, කරවල, උම්බලකඩ ආදී මාංසමය ආහාරයන්ගෙන් මෙන්ම පුහුල් වැනි ඇතැම් ශාකමය ආහාරයන්ගෙන්ද මුළුමනින්ම වැළකී සිටිය යුතුය. ඔහු වෙතින් ඉහත සඳහන් වත් පිළිවෙත් සිඳී බිඳී ගියද ජීවම පුස්ස බින්දක් මෙන් බිඳී යයි.

**ලක්ෂ වාරයක් ජීවම් කරද්දී කණකොකෙක් ඇඬුවොත් තෙලේ බලේ ඉවරයි**

**“කොහොමත් ඒ මන්තරෙන් ලක්ෂ වාරයක් ජීවම් වෙනකොට හරියට තාච්චියක නටන තෙලක් වගේ ඔය තෙල බුබුළු දමමින් නටන්න ඕනේ කියලයි මන්තර පොත්වල තියෙන්නේ. ඊටපස්සේ ඒ තෙල්වලින් ටිකක් රත්තරන් හරි රත්තරන් ආලේප කරපු සූරයක හරි දාලා ආයෙත් ජීවම් කරන්න ඕනෑ. එතකොට තමයි ඒ හෙනරාජ තෛලයේ බලය පිහිටන්නේ කියලා පරණ මන්තර පොත්වල තියෙනවා.”** විපුලසේන අයියා කීය.

එමෙන්ම ඉන්පසු එම හෙනරාජ තෛලය නිසි පරිදි සැකසී තිබේද යන්න තහවුරු කරගත හැකි පාරම්පරික ක්‍රමයක් ගැනද විපුලසේන අයියා කීය. එනම් එම හෙනරාජ තෛලය සහිත සූරය කිසියම් ගසක අත්තක එල්ලා දක්ෂ වෙඩික්කරුවෙකු ලවා ඊට පතරොම් තුවක්කුවකින් වෙඩි තැබීමය. එවිට එම සූරය ඒ වෙඩි පහරට ලක් නොවුවහොත් එය බල පිහිට වූ හෙනරාජ තෛලය සහිත සූරයක් බව පිළිගැනෙයි. නමුදු තමන් මේවා අත්හදා බලා නොමැති අතර මේවායේ සත්‍යතාව තහවුරු කිරීමට තමන්ට නොහැකි බවද ඔහු වැඩිදුරටත් කීය.

**ඒ කාලේ ගාල්ල, මාතර පැත්තේ මිනිස්සු සබරගමුව, ඌව, මධ්‍යම පළාත්වල හිටපු ප්‍රභූවරුන්ගේ ඉන ඉහ අතගාගන්න දාපු උප්පරවැට්ටියක්**

**“ඕක ඔය ඕලන්ද කාලේ වගේ ඉඳලා මිනිස්සුන්ගේ අතරේ පැතිරුණු මිථ්‍යාවක්. විශේෂයෙන් ඕක ඒ කාලේ තරමක් දියුණු සංස්කෘතික ලක්ෂණ පළකරපු ගාල්ල, මාතර පැත්තේ මිනිස්සු සබරගමුව, ඌව, මධ්‍යම වගේ පළාත්වල හිටපු විශාල ධනස්කන්දයන්ට හිමිකම් කියපු ප්‍රභූවරුන්ගේ ඉන ඉහ අතගාගන්න කරපු උප්පරවැට්ටියක් විදියටයි මට හිතෙන්නේ.”**

ඉන්පසුව මෙම හෙනරාජ තෛලය සම්බන්ධ මන්ත්‍ර ගුරුකම් සහිත පැරණි පුස්කොළ පොත් සොයා කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයට ගිය මට එවක එහි අධ්‍යක්ෂ ධුරය හෙබවූ ආචාර්ය සිරිනිමල් ලක්දුසිංහ මහතා කීය.

**“මෙහේ පුස්තකාලේ ඔය වගේ එක එක යන්ත්‍ර මන්තර පොත් තියෙනවා තමයි. ඒත් බුද්ධිමත්ව පරිශීලනය කරනකොට තේරෙනවා ඒවායේ තියෙන්නේ අතේ පත්තුවෙන බොරු කියලා. මම හිතන්නේ ඒවා ලියපු ඒ කාලේ සාක්ෂරතාව තියෙන මිනිස්සු ඒ පුස්කොළ පොත් වගේම ඒවයින් ජීවම් කරපු තෙල් පරණ නින්දගම් හිමි ධන කුවේරයන්ට හොඳ ගණන්වලට විකිණුවා.”** ඔහු වැඩිදුරටත් කීය.

කිසියම් සියුම් ඉලක්කයකට වෙඩි තැබීමේදී ඒ සඳහා පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් තිබිය යුතුමය. එහෙත්, එසේ වෙඩි තැබීමට තුවක්කුවේ කොකා ගස්සන මොහොතේ එහි සාර්ථකත්වය පිළිබඳව නිෂේධනාත්මක මානසික ඇණවුමක් (Negative Suggestion) සිත තුළට පිවිසිය හොත් එසැණින් එම ඉලක්කය වැරදීමේ පැහැදිලි හැකියාවක් තිබේ. හෙනරාජ තෙල මහා බලගතුය යන හැඟීම මුල්කොට ඊට වෙඩි තැබීමට සැරසෙන වෙඩික්කරු තුළ ක්ෂණික මානසික ඇණවුමක් ස්ථාපිත වීම මත කුරුමානම වැරදීමේ ඉතා පහසු ඉඩකඩක් පවතී.

නමුත් මෙම වෙඩි තැබීම පිණිස උණ්ඩ වරුසා විහිදුවන නවීන ස්වයංක්‍රීය ගිනිඅවියක් යොදා ගතහොත් එමගින් මෙම හෙනරාජ තෛලයේ බලය පහසුවෙන්ම නිෂේධ කළ හැකි වෙතැයි මට සිතේ.



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

කෙටිකතාව

# අනේ ඔයා කුද ගහගන්න නැන්දම්මේ

මධුරි විවාහ වුණේ තනි පුතෙක් ඉන්න ගෙදරකට. ඒ නිසා ඇයට නවතින්න සිද්ධ වුණේ මහත්තයාගේ මහගෙදර.

**"අනේ අපේ ලේලි නම් හරිම සීදේවියි."**

නැන්දම්මා දකින දකින හැමෝමත් එක්කම කිව්වා.

**"අපේ පුතා වගේ රස්තියාදුකාර දඩබ්බරයෙක්ට මේ වගේ සීදේවි කෙල්ලෙක් හම්බවෙයි කියලා මම නම් හිතුවෙ නැහැ."**

මාමණ්ඩිත් යාළුවෝ එක්ක කිව්වේ මධුවිත එක්ක සතුට සමරන ගමන්.

හැබැයි සමන්තගේ බේබදුකම් ගැන, නාහෙට නාහන හිතුවක්කාර ගති ගැන මධුරි කලින් දැනගෙන හිටියේ නැහැ. සමන්තගේ ගතිගුණ තමන්ට කරදරයක් වන බව දැනෙද්දී මධුරි මුල් දිනවල සමන්තට අවවාද කරන්න පෙළඹුණේ හරිම ආදරණීය විදියට. හැබැයි ඒ වෙනුවට සමන්තගෙන් මධුරිට ලැබුණේ ගුටිබැට විතරයි. තොල පැලුණු, මුහුණ නිල්වුණු මධුරි දිහා බලාගෙන නැන්දම්මත් මාමණ්ඩිත් හීල්ලුවා.

**"අනේ මේ සීදේවි කෙල්ලට මේ නැහැදිච්ච තක්කඩියා මොන හිතකින් වද දෙනවද?"** දෙන්නම බැන්නේ තමන්ගෙ පුතාට.

**"පුතේ උඹේ ඔය පුරුදු වෙනස් කරගත්තේ නැත්තම් මේ අම්මාවයි තාත්තවයි උඹට නැති වුණා කියලා හිතාගනින්."** තමන්ගේ දෙමව්පියන්ගේ දෙස්කීම් සමන්ත ගත්තේ බොහොම සරල විදියට. විවාහ වෙන්නත් කලින් ඉඳලම ඔය වගේ බැණුම් අහලා පුරුදු නිසා සමන්ත කළේ ඒවා දකුණු කණින් අහලා වම් කනින් පිට කරලා දාපු එක.

ඒත් සමන්ත තමන්ගේ වැරදි හඳුගත්තේ නැහැ. පහර කන හැම දවසකම මධුරිව බදාගෙන හඬා වැටෙන්නත්, මධුරිගේ තුවාල තැලුම්වලට බේත් කරන්නත්, මධුරිගේ දුක බෙදාගන්නත් අම්මා වගේ ඉස්සරහට ආවේ නැන්දම්මා.



**"අනේ අපේ එකා නම් තිරිසනෙක්. අර අහිංසක සීදේවි කෙල්ලට වද දෙන තරම්."** නැන්දම්මා හතරවටේ ඉන්න නෑදෑයෝ එක්ක හරිම සංවේගයෙන් කිව්වා.

කාලය ගතවුණේ මධුරිගේ ඉවසීමේ උපරිම සීමාව පන්නමින්. ඒ සීමාව පැන්නට පස්සේ තවත් ඉවසන්න මධුරිට ඕන වුණේ නැහැ. නැන්දම්මත් මාමණ්ඩියත් තමන්ගේ පැත්තේ බව දන්නා නිසා මධුරිට බය වෙන්න හේතුවත් තිබුණොත් නැහැ. ඉතින් ටික දවසක් යද්දී එකට එක කියන්න පහරට ප්‍රති ප්‍රහාර එල්ල කරන්න මධුරි දෙවරක් හිතුවේ නැහැ.

හැබැයි නැන්දම්මයි මාමණ්ඩියි නම් වෙනස් වුණේ හිතාගන්න බැරිතරම් ඉක්මනට.

**"අපෝ අපි හිතුව තරම් මධුරි ළමයා අහිංසක නැහැ. පුතා එක්ක හරි හරියට රණ්ඩු. කොච්චරද කියන්නේ ගහ ගන්නවත් එක්ක."** නැන්දම්මා කිව්වේ සංවේගයෙන්.

වටේපිටේ හිටපු මිනිස්සු ඒකට තවත් පොහොර දැම්මා.

**"ඒක තමයි අක්කේ බැඳලා ආපු මුල් දවස් නිසා අහිංසකයි වගේ පෙන්නගෙන ඉන්න ඇති. දැන්නේ ඇත්ත මූණ එළියට පේන්නෙ."**

**"ගෑනියෙක් වුණාම ඉවසන්න දැනගන්න ඕනේ. ඔහොම රණ්ඩු කළොත් නම් පවුල රැකගන්න වෙන්නේ නැහැ."**

නැන්දම්මා මධුරිට උපදෙස් දෙන්න ගියේ මධුරිගේ කෝපය තවත් වැඩි කරමින්.

**"අම්මේ ඔයාලාට මාව අහිංසකයි කියලා පේන්නේ මම ගුටි කාගෙන හැමදේම ඉවසගෙන ඉන්නකම් විතරයිද? මමත් මනුස්සයෙක්. මට වෙන අසාධාරණකම්වලට විරුද්ධ වෙන්න මට අයිතියක් නැද්ද? අනිත් අය කරන අසාධාරණකම් ඉවසගෙන ඉන්නවා කියන්නේ නිවටකම මිසක් අහිංසකකම නෙවෙයි. ඔයාලට ඕනේ ඔයාලගේ පුතාගේ ඇනුම් බැණුම් ඉවසගෙන ලෝකෙට පේන්න අහිංසකව ඉන්න ලේලියෙක් නම් ඒ මම නෙවෙයි. මට නිවටයෙක් වෙන්න ඕනේ නැහැ. තව ටික දවසක් බලලා මම සමන්තගෙන් නීතියෙන්ම වෙන් වෙනවා."** මධුරි කිව්වේ නැන්දම්මාට කටඋත්තර නැති වෙන්න.

**සමාධි ඩයස්**






# වැඩියෙන් අය කළ රුපියල් 20ට අවුරුදු 22ක් නඩු කියූ අසල්වැසියා

> **මම මේක කළේ යුක්තිය වෙනුවෙන්. දූෂණයට එරෙහිව සටන් කරන එක හැම පුරවැසියෙකුගෙම වගකීමක්**

**"කොන්දොස්තර මහත්තයා ඉතුරු සල්ලි?"**

**"ඉතුරු කොහෙද? අලුත් බස් ගාස්තුව දන්නෙ නැද්ද?"**

කොන්දොස්තර මහත්තයා එහෙම කිව්වාහම 'මෙයාලා එක්ක කතා කරලා වැඩක් නෑ' වගේ බැල්මක් හෙළලා ඉතුරු සල්ලි ඉල්ලපු තරුණ මහත්තයා කට වහගෙන ජනේලෙන් එපිට බලාගත්තා.

මේ දවස්වල කාළගුණේ වගේ මොහොතින් මොහොත වෙනස් වෙන බස් ගාස්තුවේ වැඩිම වාසිය ගන්නේ කොන්දොස්තර උන්නැහෙලානේ. ඒ නිසා ඔය වගේ සිදුවීම් දැන් කාටත් හුරුපුරුදුයි.

එක් කෙනෙක්ගෙන් රුපියල ගාණේ වැඩිපුර ගත්තත් දවසට හොඳ ගතමනාවක් හඳුනගන්න පුළුවන් නිසා සමහර කොන්දොස්තර මහත්තුරු බලන්නේම මාරු නොදී මාරුවෙන්න. ඉතුරු ඉල්ලන්න ගිහින් බස් එකේ සෙනඟ ඉස්සරහා ලැජ්ජ වෙන්න වෙයිදෝ කියන දෙගිඩියාව නිසා ගොඩක් නෝනා මහත්වරු ඒ සල්ලි පිනට දුන්නාය කියලා හිත හදාගන්නවා. හැබැයි දුක් මහන්සියෙන් හම්බකරන රුපියල දෙකට වුණත් වංචා කරනවට අකමැති, ඒ වෙනුවෙන් කතා කරන උදවියත් ඔය අතරේ ඉන්නවා.

> **කීපවතාවක්ම ඒ අය මගේ නඩුව නිශ්ප්‍රභා කරන්නත් හැදුවා. ඒත් මම දිගින් දිගටම සටන් කරපු නිසා අධිකරණයට මගේ නඩුව විභාග නොකර බැරි වුණා**

හැබැයි එහෙමයි කියලා ඉතුරු සල්ලි වෙනුවෙන් නඩු කියන්න යන්නේ කවුද?

ඉතුරු රුපියල් 20කට අවුරුදු 22ක් තිස්සේ නඩු කියලා ඒ නඩුව ජයගත්තු මනුස්සයෙක් ගැන පහුගිය දවසක අපේ අසල්වැසි ඉන්දියාවෙන් වාර්තා වුණා. අපිට ඉතුරු නොදෙන්නේ බස්වලින්. හැබැයි මේ මහත්තයගේ රුපියල් ඉතුරු රුපියල් 20 නොදී ඇරලා තියන්නේ දුම්රිය කවුන්ටරෙන්. ඉතුරු සල්ලි හුටපටේ මේ දවස්වල හතරවටින් ඇහෙන නිසා මේ මහත්තයගේ කතාව කවුරුත් කියවලා බලන එක හොඳයි.

තුංගනාත් චතුර්වේදී ඉන්දියාවේ චතුර්වේදී ප්‍රදේශයේ පදිංචි නීතීඥවරයෙක්. 1999 වසරේදී ඔහු ඉන්දියාවේ උත්තර් ප්‍රදේශයේ ඉඳලා චතුර්වේදී ප්‍රදේශයට යන්න දුම්රිය ප්‍රවේශපත්‍ර දෙකක් ගන්න හිතාගෙන මථුරා කැන්ටූන්මන්ට් දුම්රිය කවුළුවට රුපියල් 100ක් දීලා තියෙනවා.

චතුර්වේදී ලබාගත්තු එක ටිකට්පතක මිල රුපියල් 35යි. ඉතින් ටිකට්පත් දෙකකට රුපියල් 70ක් අය කරගෙන ඉතුරු 30ක් දෙනවා වෙනුවට මුදල් අයකැමි නිලධාරියා ඔහුගෙන් රුපියල් 90ක් අයකරගෙන, ඉතුරු 10ක් දුන්නලු.

**"මෙතන රුපියල් 20ක් අඩුයිනේ..."**

චතුර්වේදී කීපසැරයක්ම කිව්වත් දුම්රිය මුදල් අයකැමි නෙමෙයිලු ඒ වචන තඹදෙයිතුවකට මායිම් කළේ.

මේක නම් ලේසියකට අතාරින්නේ නැහැයි කියලා තදේටම හිතට ගත්තු චතුර්වේදී එයිට පහුවෙනිදම ඉන්දීය දුම්රිය දෙපාර්තමේන්තුවට සහ මුදල් අයකැමි නිලධාරියාට එරෙහිව මථුරාහි පාරිභෝගික අධිකරණයේ නඩුවක් ගොනු කළා. එතකොට ඔහුගේ වයස අවුරුදු 44යි.



**"මේකට අවුරුදු ගාණක් ගියේ ඉන්දියානු අධිකරණයේ මන්දගාමීබව නිසයි. මේක මහ බොරු වැඩක් කියලා කීපවතාවක්ම ඒ අය මගේ නඩුව නිශ්ප්‍රභා කරන්නත් හැදුවා. ඒත් මම දිගින් දිගටම සටන් කරපු නිසා අධිකරණයට මගේ නඩුව විභාග නොකර බැරි වුණා."**

උත්සාහවන්තයා ජය ගනී කියනවනේ. ඒ කිව්වත් වගේ අවුරුදු 22ක දීර්ඝ නඩු කාලෙකට පස්සේ චතුර්වේදී දුම්රිය දෙපාර්තමේන්තුවට විරුද්ධව දාපු නඩුවෙන් ජයගත්තා. එතැනදී ඔහුට ඉන්දියානු රුපියල් 15,000 (ලංකා මුදලින් රුපියල් 69,000) ගෙවන්න දුම්රිය දෙපාර්තමේන්තුවට සිද්ධවුණා.

**"ඔය නඩුව මහ බොරු වැඩක්. කාලය නාස්ති කිරීමක් කියලා මගේ පවුලේ අය කීපසැරයක්ම කිව්වා. මට හම්බුණු වන්දිය ගැනත් ඒ අය සතුටු නැහැ. මට නම් ඇත්තටම සල්ලි වැඩක් නැහැ. මම මේක කළේ යුක්තිය වෙනුවෙන්. දූෂණයට එරෙහිව සටන් කරන එක හැම පුරවැසියෙකුගෙම වගකීමක්."**

චතුර්වේදී නීතීඥවරයෙක් නිසා නඩුව වෙනුවෙන් ඔහුට නීතිඥ මුදල් වැයවෙලා නැහැ. හැබැයි උසාවි යන්නයි එන්නයි ඔහුට හම්බුණු වන්දියටත් වඩා වැඩි මුදලක් වැය වුණාලු. දැන් ඔහුගේ වයස 66යි. ඔය අවුරුදු ගාණට චතුර්වේදී නඩු වාර 120කට සහභාගී වෙලා තියෙනවා.

කවුරු කොහොම කිව්වත් තමන් අයුක්තියට එරෙහිව නැගී සිටියා කියලා චතුර්වේදී සතුටු වෙනවා. "මේ මිනිහා පිස්සෙක්" ඔය අතරේ සමහරු ඔහුට හිනාවෙනවලු. වෙහෙස මහන්සිය ගැනවත් නොසිතා චතුර්වේදී අයුක්තියට එරෙහිව හඬ නැගීම වෙනුවෙන් ඔහුට ප්‍රශංසා කරන පිරිසකුත් ඉන්නවා.

තමන් මහන්සිවෙලා හම්බකරන රුපියලට දෙකට වුණත් වංචා කරන්න දීලා උඩබලන් ඉන්න අවශ්‍ය නැහැ කියලයි ඔහු කියන්නේ. නඩු දැමිල්ල කෙසේ වෙතත් ඒ වෙනුවෙන් කතා කරන්න නම් පැකිළෙන්න එපා කියලයි අපිත් කියන්නේ.

සෙව්වන්දි හෙට්ටිආරච්චි



# පස්ස ලොකු කරල පෙන්නන්න ගිහින් පස්සේ පසුතැවෙනවා එහෙම නෙවෙයි!

"සිසි වන උවන ඉඟ සුඟ ගත හැකි මිටින
නිසි පුළුලු'කුළ රිය සක යුරු තිසර තන
දිසි රන ලියෙව් රූ සිරි යුත් මෙපුරඟන
ඇසි පිය හෙළන පමණින් නොවෙති දෙවඟන"

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි කෝට්ටේ යුගයේ උන්නු ලලනාවන් ගැන වර්ණනා කරලා තියෙන්නේ ඔහොම. හැබැයි ඉඟ සුඟ මිටින් ගන්න පුළුවන් ගෑනු කෝට්ටේ යුගයේ විතරක් නෙමෙයි වික්ටෝරියානු යුගයෙත් ඉඳලා තියෙනවලු.

ඇලෙන්සැන්ඩ්‍රියානා වික්ටෝරියා කියලා තරුණ කුමාරිකාවක් 1819 දී එංගලන්ත රජ පුටුවේ ඉඳගන්නවා. එතැන ඉඳලා අවුරුදු 63ක් එංගලන්තේ පාලනය කළේ ඇය. ඔය කාලෙට තමයි වික්ටෝරියානු යුගය කියන්නේ. වැදගත් කුළ කාන්තාවක් නම් මිටින් ගන්න පුළුවන් ඉඟක්, විශාල පියයුරු යුග්මයක් තියෙන්න ඕනය කියලා මේ රැජින සම්මතයක් ගෙනාවලු.

විශාල පියයුරු කෙසේ වෙතත් එක මිටට ගන්න පුළුවන් ඉඟටියක් නම් ස්වභාවික පිහිටන්නේ නැහැනේ. ඉතින් එංගලන්ත නෝනලා ඇඳුම් පැළඳුම්වලින් මේ දේවල් මතු කරගන්න උත්සාහ කළා. ඒකට ඔවුන් උල් හැඩේට මහපු තිසර පටියි, මහ විශාලෙට පිම්බිලා පේන සායවලුයි ඉඟටිය එක මිටට ගන්න පුළුවන් කෝර්සෙට් (Corset) කියන ඇඳුමයි ඇන්දලු.

ඔය කෝර්සෙට් කියන ඇඳුම ඇන්දම ඉන සිහින් කරගන්න පුළුවන් හරියට වැලි ඔරලෝසුවක් වගේ. තල්මස් සමෙන් හදපු ඔය ඇඳුම අඳින කාන්තාව බිම දිගාවෙන්න ඕනෙලු. ඊටපස්සේ තවත් කාන්තාවක් පිටට කකුලක් තියලා ඉඟ එක මිටට එනකල්ම පටිය තද කරනවලු. ටිකක් පරණ කාලේ චිත්‍රපටවල ඔය කියන ඇඳුම දැකලා ඇති. ඇඟට කිටි කිටියේ තදවෙන මේ ඇඳුම අඳින බවලතියෝ පැය බාගෙන් බාගෙට ක්ලාන්ත වෙනවලු. ඉතින් වික්ටෝරියානු යුගයේ පාරවල්වල ගෑනු අය ක්ලාන්ත වෙන එක සුලබ දසුනක්ලු. කෝර්සෙට් නිසා මරණ පවා සිද්ධවෙලා තියෙනවා. දශක ගාණක් ගෑනුන්ට වද දීපු ඔය ඇඳුම දෙවැනි ලෝක යුද්දේ කාලෙදි තහනම් කරලා.



කොහොම වෙතත් ඉන, පපුව, පසුපස ප්‍රදේශය ටිකක් හැඩවෙලා, වැඩිවෙලා පේනවට දැන් කාලේ කාන්තාවොත් අකමැති නෑනේ. ඒ නිසා ඇඟ හැඩ කරලා පෙන්වන්න ගොඩක් අය දැන් අඳින්නේ ශේප්වෙයාර් (Shapewear). ආවට ගියාට මේවා අඳින එකත් ඉල්ලන් ලෙඩ දගන්නවා වගේ වැඩක් කියලයි වෛද්‍යවරු කියන්නේ. ඒ නිසා අවශ්‍යතාවයට අනුව හරියට ශේප්වෙයාර් එකක් තෝරගන්නේ කොහොමද? එව්වා හරියට පාවිච්චි කරන්නේ කොහොමද කියලා බලමු.

නෝනාවරුනි, පශ්චාත් පෙදෙස හැඩ කරන ශේප්වෙයාර් ගැන අපි මුලින්ම කතා කරමු. පසුපස ප්‍රදේශය කැපිලා පේන තරමට කාන්තාවකගේ ආකර්ෂණය වැඩිවෙනවා කියලා මතයක් තියෙනවනේ. ඒ නිසා ඔය ප්‍රදේශය ටිකක් වැඩි කරලා පෙන්නන්න සමහරු පැඩඩ් පෑන්ටීස් (Padded Panties) නැත්තම් බූටි ඉන්හෙන්සර් (Booty Enhancer) අඳිනවා. යට කලිසම් තුළ රඳවන්න පුළුවන් සිලිකන් නැත්තම් පුළුන් පෑඩ් වර්ගත් තියෙනවා. සම්පූර්ණ පැඩඩ් කලිසමක් අඳිනවට වඩා මේ වර්ගය හොඳයි කියලයි වෛද්‍යවරු නම් කියන්නේ. ඊට අමතරව ශෝට්ස්, බිකිනි වගේ වර්ගවලිනුත් පැඩඩ් කලිසම් ගන්න පුළුවන්.

සාමාන්‍ය ප්‍රමාණයට පසුපස තියෙන කෙනෙක්ට ටිකක් පසුපස උස්වට පෙන්න බූටි ලිෆ්ටර් ශෝට් (Booty Lifting Shorts) එකක් අඳින්නත් පුළුවන්.

පියයුරු ටිකක් කැපී පේන්න නම් පුෂ් අප් බ්‍රා (Push up Bra) එකක් අඳින්න පුළුවන්. තනපට ගැන මීට කලිනුත් කතා කරලා තියෙන නිසා ඒ ගැන අද වැඩිය කතා කරන්න යන්නේ නැහැ.

ඉන සිහින්වෙලා උකුල පළල්වෙන තරමට කාන්තා ලාලිත්‍ය වැඩිවෙනවාලුනේ. ඒ නිසා තමන්ගේ ඉන හැඩයි කියලා පෙන්වන්න කාන්තාවෝ කොහොමත් කැමතියි. ඉන හැඩ කරන්න අඳින්න පුළුවන් ශේප්වෙයාර් වර්ග කිහිපයක්ම වෙළඳපොළේ තියෙනවා. එකක් තමයි හයි වේස්ට් ශේප්වෙයාර් (High Waist Shapewear). ටිකක් මහත කාන්තාවකට උදර ප්‍රදේශ සඟවලා, ඉන හැඩ කරලා පෙන්නන්න මේ ඇඳුම හොඳයි.

ටිකක් කකුල් මහත කාන්තාවක් නම් හයි වේස්ට් ශෝර්ට් (High Waist Short) එකක් අඳින්න. ඉන හැඩ කරලා පෙන්නන ගමන් කකුල් අඩු කරන්නත් මේ ඇඳුමට පුළුවන්.

පැඩඩ් කලිසම්, ශේප්වෙයාර් ඝනත්වයෙන් වැඩි නිසා මේවගේ කුණු, දූවිලි, දහඩිය රැඳෙන්න තියෙන ඉඩ වැඩියි. ඒ නිසා එක පාරක් භාවිත කළාට පස්සේ මේවා හොඳින් පිරිසුදු කරලා ඉරඑළියේ දවස් දෙකක්වත් වියළා ගන්න ඕනේ. එහෙම නැත්තම් කැසීම්, රතුවීම්, දද, කුෂ්ඨ, බිබිලි වගේ ආසාත්මිකතා ඇති වෙන්න පුළුවන්. ඔසප් කාලෙට නම් පැඩඩ් කලිසම් සහ ශේප්වෙයාර් අඳින්නම එපා.

ශේප්වෙයාර් නිසා ශරීරය වැඩිපුර තදවෙන නිසා පෙනහලුවලට ඔක්සිජන් නොලැබෙන්න පුළුවන්. අනවශ්‍ය විදියට තද වුණොත් රුධිර සංසරණය සීමාවෙලා ශරීරය රතුවෙලා, හිරිවැටිලා, ඉදිමෙන්න, ක්ලාන්ත වෙන්න පුළුවන්. අනවශ්‍ය තදබව නිසා හුස්මගැනීමේ අපහසුතා, ස්නායු ගැටලු ඇති වෙන්නත් බැරි නැහැ.

ශේප්වෙයාර් ඕනවට වඩා වෙලාවක් ඇඳගෙන හිටියොත් ආමාශය තදවෙලා ආමාශයික අම්ල වැඩි වශයෙන් ස්‍රාවය වෙන්න පුළුවන්. අම්ල පිත්ත රෝගීන්ට තද ඇඳුම් අඳින්න එපා කියලා වෛද්‍යවරුන් උපදෙස් දෙන්නේ ඒකයි.

**පැඩඩ් කලිසම්, ශේප්වෙයාර් ඝනත්වයෙන් වැඩි නිසා මේවගේ කුණු, දූවිලි, දහඩිය රැඳෙන්න තියෙන ඉඩ වැඩියි. ඒ නිසා එක පාරක් භාවිත කළාට පස්සේ මේවා හොඳින් පිරිසුදු කරලා ඉරඑළියේ දවස් දෙකක්වත් වියළා ගන්න ඕනේ. එහෙම නැත්තම් කැසීම්, රතුවීම්, දද, කුෂ්ඨ, බිබිලි වගේ ආසාත්මිකතා ඇති වෙන්න පුළුවන්**

පිට ප්‍රදේශය එල්ලා වැටෙනවා නම් ස්ලිමින්ග් ටෑන්ක් ටොප් (Slimming Tank Top) ශේප්වෙයාර් එකක් අඳින්න පුළුවන්. ඉනත් එක්ක පිටත් හැඩ කරන්න මේ ඇඳුම තමයි හොඳම.

ඇඳුම්වලින් අරුම පුදුම දේ කරන්න පුළුවන් කියලා කතාවක් තියෙනවනේ. ඉතින් ටිකක් තද සායක්, ගවුමක් අඳිනකොට ශේප්වෙයාර් ස්කර්ට් (Shapewear Skirt) එකක් අඳිනවා නම් හොලිවුඩ් නිරූපිකාවක් වගේ කැපිලා පේන්න පුළුවන්. බඩ තියෙන කෙනෙක් නම් ටමි ටකර් (Tummy Tucker) එකක් පාවිච්චි කරන්න පුළුවන්. ඉන සහ බඩ හැඩ කරන්න හදපු බෙල්ට් එහෙමත් තියෙනවා. කකුල්, බඩ, ඉන, පියයුරු මේ හැම අංගයක්ම හැඩ කරන්න අවශ්‍ය නම් ෆුල් බොඩි ශේපර් (Full Body Shaper) එකක් ගැලපෙනවා.

ශේප්වෙයාර් මිලදී ගන්නකොට අනිවාර්යයෙන්ම ප්‍රමිතිය ගැන හිතන්න. නයිලෝන්, සිල්ක් වෙනුවට කොට්න්වලින් හදපු පැඩඩ් කලිසම්, ශේප්වෙයාර් මිලදී ගන්න බලන්න.

ඒ වගේම ශේප්වෙයාර් ඇඳගෙන ඉන්දැද්දි ආහාර ගත්තම ආහාර දිරවන්න අපහසුවෙලා බඩ පිපෙන්න ඉඩ තියෙනවා. මීට අමතරව ශේප්වෙයාර් නිසා මාංසපේශි ආශ්‍රිත ගැටලු, හෘද රෝග, මුත්‍රාශ රෝග ඇතිවෙන්නත් පුළුවන්ලු.

හැඩවෙන්න ගිහින් ලෙඩ වුණොත් වෙන්නේ තියෙන හැඩෙත් පිරිහෙන එක. ඒ නිසා මේ ශේප්වෙයාර් වගේ දේවල් විශේෂ අවස්ථාවලදි විතරක් අඳින එක වඩා හොඳයි. පැඩඩ් කලිසම්වලින් සිරුර අනවශ්‍ය විදියට තද නොවෙන නිසා ඒවා නම් දිනපතා ඇන්දත් ගැටලුවක් නැහැ.

හැබැයි මේ දෙකෙන් කොයිවත් උපරිම පැය අටකට වඩා ඇඳගෙන ඉන්න එපා. ඒ වගේම මේවා පැළඳගෙන නිදගන්නත් එපා.

වතුර ඇදීම, පිටි කෙටීම, මිරිස් ගලේ ඇඹරීම වගේ වැඩ කරන නිසා ඉස්සර බවලතියන්ගේ ඉඟ සුඟ ඉබේටම වගේ හැඩ වෙනවලු. ඔය වගේ දේවල් නොකෙරුවත් ස්කොට්ස් (Squats), පුෂ් අප්ස් (Push ups), සයිඩ් ප්ලෑන්ක්ස් (Side Planks), බර්පීස් (Burpees), ඩම්බෙල් රෝව්ස් (Dumbbell Rows) වගේ ව්‍යායාම කරනවා නම් ඉබේටම ඇඟ හැඩ කරගන්න පුළුවන් කියන එකත් අවසානෙදි මතක් නොකර බැහැ.



**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# මේ නිධානය මතු කරගන්න එක බිම් අඟලකුත් ඇති

## මේ වගාව අපි තුන්දෙනාගෙම කිව්වොත් හරි



ගෙදරදෙරේ වැඩ රාජකාරි කොතෙක් තිබුණත් ගෙවත්ත වෙනුවෙන් කාලය වෙන් කරගත් කාන්තාවෝ කවදාටත් දිනුම්ය.

වස විස නැති එළවලු ටිකක් අල බතල ටිකක් එවන් ගෙවත්තක කළඑළියයි.

**"මම විවාහ වුණේ 2014 අවුරුද්දේ. ඊටපස්සේ මේ ගේ හදාගෙන රාගම පදිංචියට ඇවිත් ඉස්සරවෙලාම කොළපලා වර්ග තමයි වගා කරන්න පටන්ගත්තේ. විවාහයට කලින් මම පුවත්පත් කලාවේදිනියක් විදියටත් කටයුතු කළා. මගේම පොත් සාප්පුවකුත් කළා. හැබැයි පුතා ලැබෙන්න ඉඳිද්දි මහත්තයා කිව්වා, දැන් ගෙදර හිටියානම් නේද හොඳ කියලා. බබා ලැබුණට පස්සේ එයාගේ වැඩ රාජකාරි ටිකෙන් ටික වැඩිවෙද්දී මමත් ඒකට කැමති වුණා. මුලින්ම මුකුණුවැන්න, ගොටුකොළ, තෙබු, කංකුං, මොනරකුඩුම්බිය, පොල්පලා, කුප්පමේනිය වගේ දේවල් වගා කළා. එළවලු පැළ හිටෙව්වේ පෝච්චිවල. ඒ එක්කම අපි පදිංචියට ආව මුල් කාලෙම රඹුටන්, පොල් පේර, කටු අනෝදා, වෙරලු, කටුලොවි, ඇඹරැල්ලා, කෙසෙල් වගේ ලොකු ගස් වර්ගත් හිටෙව්වා. ගේත් එක්ක තියෙන මුළු ඉඩමේ ප්‍රමාණය පර්චස් එකොළහයි. මම කියන්නේ ලොකුවට ඉඩ ඕන නැහැ. බිම් අඟලක් තිබුණත් මිරිස් පැළයක්, බටු පැළයක් හරි හිටවගන්න පුළුවන්නම් එයින් හිතට දැනෙන සතුට මිල කරන්න බැහැ."**

ඒ දිනූෂා කල්පනී මාකවිටගේ හඬය. කලක් පන්හිඳට පෙම් බැඳි ඇය දැන් මුළු කාලයම වෙන්කර ඇත්තේ පවුලේ කටයුතු වෙනුවෙනි. වරාය අධිකාරියේ සේවය කරන දම්මික ලසන්ත වීරසිංහ දිනූෂාගේ සැමියායි. ගෙදරදෙර වටපිටාව ලස්සනට තියාගන්නටත්, වගා කටයුතුවලට අවැසි උදව්පදව් සියල්ල ලබාදෙන්නටත් ඔහු කැමැත්තෙන් ඉදිරිපත් වන බව දිනූෂා කීවාය.

**"ඇත්තම කිව්වොත් මේ වගාව මගේ විතරක් නෙමෙයි අපි තුන්දෙනාගෙම කිව්වොත් තමයි හරි. මම එහෙම කියන්නේ මහත්තයත් ගෙදර ඉඳිද්දී වගා වැඩවලට ලොකු සහයෝගයක් දෙනවා. එයා තමයි මට කොම්පෝස්ට් බින් එක හදලා දුන්නෙත්. අපි වගාවට රසායනික පොහොර දාලා නැහැ. කුස්සියේ උයද්දි අහකදාන එළවලු කැබලි ටික පවා මගේ විශේෂ පොහොර එක හදාගන්න මම යොදනවා. ඒ නිසාම කුණු ප්‍රශ්නත් අපිට කවදාවත් නෑ. ගඳ ගහනවා, නගර සභාවෙන් එනකල් කියලා බලා ඉන්න උවමනාවකුත් නැහැ. මේ පස ඒ තරම් සරුසාර පසක් නොවෙන නිසා අපි වගාවට සුදුසු විදියට පස සකස්කර ගන්නවා. ඒ නිසාම වැඩිපුර පෝච්චිවල තමයි වගා කරන්නේ. කලින් කලට විවිධ එළවලු වර්ග වගා කළා. කඩෙන් ගෙනා එළවලු ඉවරවුණු දාට වත්තේ ඇවිද්දම එළවලු දෙක තුනක්, කොළපලා ටිකක්, ඇඹරැල්ලා ගෙඩි ටිකක් කඩාගන්න පුළුවන්. ඇඹරැල්ලා මාලුවට පුතත් හරි කැමතියි."**



හය හැවිරිදි පුංචි පුතු දෙව්නිජ සතිල් වීරසිංහ ජාත්‍යන්තර පාසලක එක වසරේ ඉගෙනුම ලබයි. ගෙදර හිඳින්නේ නම් ඔහුද අම්මා සමඟින් ගෙවත්තේ සිටින්නට වැඩිපුර කැමතිය. පුංචි පුතුද දැන් සිටම පරිසරයට ගහකොළට ආදරේ දැක්වීම ගැන ඔවුන් සිටින්නේ සතුටිනි. ඒ සතුට හැමදාමත් ළඟ තබා ගන්නට දිනූෂා කැමතිය. ඊට ලොකු ලොකු දේවල් උවමනා නැතැයි ඇය සිතන්නීය.



## කුස්සියේ කුණු ටිකත් මම පොහොර කරනවා

**"නිවාඩු දවස්වලට අපි තුන්දෙනාම ගෙදර ඉන්නවනම් මම කොළකැඳ හදනවා. වත්තෙන් ගන්න හාතවාරිය, වැල්පෙනෙල කොළ වගේ කොළපලා වර්ග ගෙවත්තේ තියෙනවා. සමහර දවස්වලට උදේට මඤ්ඤොක්කා තම්බලා කොච්චි සම්බෝලයක් හදලා ගන්නවා. මේ දවස්වල වත්තේ මඤ්ඤොක්කා වගේම රාජඅලත් තියෙනවා. ඒ වගේම පැහුණු අලුකෙසෙල් කැනකුත් තියෙනවා. නාරං වර්ග කිහිපයක් තියෙනවා. තිබ්බටු, දඹල, බණ්ඩක්කාත් තියෙනවා. කාලයක් යද්දි එළවලු පැළ මැරෙනවා.**

## කඩෙන් ගෙනා එළවලු ඉවර වුණදාට වත්තේ ඇවිද්දම එළවලුවක් දෙකක් හොයාගන්න අපහසු නෑ





**එතකොට ඒවට අලුතෙන් පැළ හිටවන්න ඕන. ඒ වගේම අපි කරපිංචා, රම්පේ කවදාවත් කඩෙන් ගේන්නේ නැහැ. ළඟදි කරඳමුංගු පැළයකුත් හිටෙව්වා."**

එසේ අලුත් අලුත් දේ වගාවට එක්කර ගනිද්දී එම ගහකොළ ගැනද අලුත් අලුත් දේ ඉගෙනගන්නට ලැබෙන්නේය.

දිනූෂා පුංචි සන්ධියේ ඇගේ මව ගෙදර පරිභෝජනයට අවශ්‍ය දේ ගෙවත්තේම වගාකරගත් අයුරු සිහිවෙද්දී ඇගේ හිතත් නිතැතින්ම වගාවට බැඳුණි. කිරිබත්ගොඩ මාවරමණ්ඩිය ගමේ ගහකොළවලින් පිරි එම සොඳුරු පරිසරයට අදටත් ඇය මහත් සේ ඇලුම් කරන්නීය.

**"මට මතකයි ගෙවත්තකට ඕන කරන ගොඩක් දේවල් අම්මගේ වගාවේ තිබුණා. ගෙදරින් වෙන්වුණාට පස්සේ, මගේ ගෙවත්තත් ඒ වගේ වගාවකින් පොහොසත් කරගන්න එක මගේ හීනයක් වුණා. ඒ වගේම මම මැහුම් ගෙතුම්වලට වගේම කේක් හදන්නත් කැමතියි. පුතාගේ උපන්දිනේටත් මම ලස්සනම කේක් එකක් ගෙදර හදනවා. ඒ කඩෙන් ගන්න බැරි නිසා නෙවෙයි. අපිට තියෙන හැකියාවන් අපි හඳුනාගෙන ඒවා ප්‍රායෝගික ජීවිතයට එක්කරගත්තම ජීවිතේ බොහොම අපූරුවට දැනෙන්න ගන්නවා. ගෘහණියක් විදියට, මවක් විදියට, බිරිඳක් විදියට මට ලොකු ලොකු බලාපොරොත්තු නැහැ. ඒත් හැමදාම සතුටින් ජීවිතය ගෙවන්න ඕන පරිසරය අපි විසින්මයි සකස් කරගන්නත් ඕන. අපේ ගෙදර ඇතුළේ ඒ පරිසරය තියෙනවා. අපේ හිත්වලට සතුට ගෙනෙන්න අපේ ගෙවත්තේ හරිත පැහැයත් අපිට ලොකු උපකාරයක් කියනෙක නොකියා බැහැ."**

සාර්ථක ගෙවතු වගාවක් ආර්ථිකයටද සවියක් බව අමුතුවෙන් කිව යුතු නැත.

**"පසුගිය කාලේ කහ හිඟවුණා. ඒ කාලේ වෙනකොට මම ගෙවත්තේ කහ වගා කරලා තිබුණේ. ඒ නිසා කහ සොයමින් වෙහෙස වෙන්නවත් මිල වැඩියි කියලා ලතවෙන්නවත් ඕන වුණේ නැහැ. අදටත් අවුරුද්දට වරක් අල ටික ගලවලා ගෙදරට අවශ්‍ය කහ ටික හදාගන්නවා. වගාව සරු කරගන්න මම ඉවතදාන කෙසෙල් ලෙලි, බිත්තර කටු පොහොරක් විදියට හදාගන්නවා. ඒ වගේම මම පොලිතින් ප්ලාස්ටික් පුළුස්සලා පරිසරයට හානි කරන්නෙත් නැහැ. අපේ ගෙදර අවට හරිම සංවේදී පරිසරයක් තියෙන්නේ. වත්තේ හැමතැනම සමනල්ලුත් ඉන්නවා. කුරුල්ලොත් ඉන්නවා."**

ඒ පරිසරය ඇයගේ හිතට ගෙනෙන්නේ සතුටත් සැහැල්ලුවත්ය. නිදහසේ ඒ සතුට විඳිමින්, ඒ සුන්දර ගෙවත්ත තවත් සුන්දර කරගැනීම ඇයගේ අදිටනයි.

දීපා වසන්ති එදිරිසිංහ



කවරයේ කතාව



# මගේ ඇඳුම්වලට වගේම මම කතාබහ කරන විදියටත් පරිභෝගිකයෝ කැමතියි

## 'Redpierrot' බතික් හා බීරළු ඇඟලුම් ආයතනයේ හිමිකාරිණී

## දුලීකා රත්නායක

සාරා බ්ලැක්ලි කියන්නේ ලෝක ප්‍රසිද්ධ 'SPANKX' කියන ඇඳුම් සන්නාමයේ හිමිකාරිණිය. ඇය වරක් ලොව බලගතුම පුද්ගලයන්ගේ නම් ලැයිස්තුවට පවා ඇතුළත් වුණු තරුණ ව්‍යාවසායිකාවක්. ඉතින් එකපාරක් ටයිම්ස් සඟරාවේ මාධ්‍යවේදියෙක් මෙහෙම අහනවා.

**"ඇමරිකාවේ මෙච්චර ඇඳුම් ප්‍රදර්ශනාගාර තොගයක් තියෙද්දි තවත් ඇඳුම් ව්‍යාපාරයකට ආයෝජනය කරන්න බය හිතුණේ නැද්ද?"**

සාරා උත්තර දෙනවා,

**"ව්‍යාපාරයක් පටන්ගන්නකොට අපිට ඉන්න තරඟකරුවන් ප්‍රමාණයට වඩා අපේ නිර්මාණ ඔවුන්ගේ ඒවට වඩා කොච්චර වෙනස්ද, ප්‍රමිතියෙන් ඉහළද කියන එකයි වැදගත්"** කියලා.

ලෝක ප්‍රසිද්ධ ව්‍යවසායිකාවක් කිව්ව ඒ කතාව ඇත්ත කියලා සහසුද්දෙන්ම ඔප්පු කරලා පෙන්නපු අපේ ව්‍යාවසායිකාවක් තමයි අද 'ධරණී' කවරය දරාගෙන ඉන්නේ. දුලීකා රත්නායක, කවුරුත් දන්න 'Redpierrot' බතික්



හා බීරළු ඇඟලුම් සන්නාමයේ හිමිකාරිය ඇයයි.

බතික් සහ බීරළු ව්‍යාපාර කොච්චර තිබුණත් ඒ අය අතුරින් සාර්ථකත්වයේ හිනිපෙත්තටම යන උදවිය ටිකක් දුලබයි. මොකද බතික් කර්මාන්තය තුළ සාර්ථක වෙන්නනම් නිර්මාණාත්මක බව, තාක්ෂණික දැනුමට අමතරව තවත් අභියෝගවලට මුහුණ දෙන්නත් හැකියාවක් තියෙන්න ඕන. හැබැයි නිෂ්පාදනවල ප්‍රමිතිය සහ අද්විතීය බව නිසා බිංදුවෙන් ගමන පටන්ගත්තු දුලීකා අද වෙනකොට ලංකාවේ ප්‍රමුඛතම සන්නාමයක් දක්වා ඇගේ ව්‍යාපාරය දියුණු කරගෙන අවසානයි.

**"මම ඉගෙනගත්තේ නාරම්මල මයුරපාද විද්‍යාලයෙන්. උසස් පෙළින් පස්සේ මොරටුව විශ්වවිද්‍යාලයෙන් විලාසිතා නිර්මාණකරණය සම්බන්ධයෙන් උපාධිය ලබාගත්තා. වෙනත් කෙනෙක් යටතේ වැඩ කරනවට වඩා මගේම ව්‍යාපාරයක් කරන ගමන් තවත් කීපදෙනෙක්ට හරි රැකියා දෙනවා කියලා බලාපොරොත්තුවක් පුංචි කාලේ ඉඳලම මගේ හිතේ තිබුණා. හැබැයි පටන්ගන්න ඕනේ මොනවගේ දෙයක්ද කියන එක ගැන මට ලොකු අදහසක් තිබුණේ නැහැ."**

විශ්වවිද්‍යාල අවසාන පුහුණුවේදී ලංකාවේ සුප්‍රකට ඇඳුම් නිර්මාණ ශිල්පිණී යොලැන්ඩි අලුවිහාරේගෙන් පුහුණුවීමක් ලබාගන්න දුලීකාට අවස්ථාව ලැබෙනවා.

**"බතික් සහ බීරළු නිර්මාණයෙන් මගේම කියලා බ්‍රෑන්ඩ් එකක් හදාගන්න ඕනේ කියන අදහස මට ආවේ ඇගේ පුහුණුවෙන්. හැබැයි මුලදී මට බිස්නස් ගැන ලොකු දැනුමක් තිබුණේ නැහැ. එහෙමයි කියලා වැඩේ අතාරින්න බැරි නිසා බොහොම පුංචි මුදලකින් ඇඳුම් දෙකක් හදලා ෆේස්බුක් එකට දාලා බැලුවා. එදා ඒ ඇඳුම් දෙකට මට හිතාගන්න බැරිතරමේ ඉල්ලුමක් තිබුණා. පස්සේ දිගටම මම මුහුණුපොත හරහා ඇඳුම් අලෙවි කළා."**

දුලීකා මේ විදියට ඇගේ ව්‍යාපාරය පටන් අරන් තියෙන්නේ 2012දී. ඔන්ලයින් ව්‍යාපාරයේ සාර්ථකත්වය නිසාම 2014 වසරේදී ඇය කොළඹ හය, ස්ටැෆර්ඩ් ඇවනියුහි 'Redpierrot' නමින් ඇගේ ඇඟලුම් ව්‍යාපාරය ආරම්භ කරනවා.

**"මේ ඇඳුම්වල පාටටයි, මෝස්තරවලටයි තමයි ගොඩක් අය කැමති. ව්‍යාපාරය පටන්ගත්තු මුල් කාලේ අපේ ප්‍රදර්ශනාගාරයේ විකුණන්න තිබ්බේ ඇඳුම් පොඩි ප්‍රමාණයක්. ඉතින් වෙලාවකට ඉල්ලුමේ තරමට දෙන්න අපි ගාව ඇඳුම් තිබුණේ නැහැ. බිස්නස් එක තනියම කරගන්න බැරිතරමට ඇණවුම් ලැබුණු නිසා මගේ සැමියා තරංග වික්‍රමාරච්චි රැකියාවෙන් ඉවත්වෙලා මගේ ව්‍යාපාරයට සම්බන්ධ වුණා. ඔහුත් මොරටුව විශ්වවිද්‍යාලයේ මෝස්තර නිර්මාණකරණ උපාධිධාරියෙක්."**

> **බිස්නස් එක තනියම කරගන්න බැරිතරමට ඇණවුම් ලැබුණු නිසා මගේ සැමියා තරංග වික්‍රමාරච්චි රැකියාවෙන් ඉවත්වෙලා මගේ ව්‍යාපාරයට සම්බන්ධ වුණා. ඔහුත් මොරටුව විශ්වවිද්‍යාලයේ මෝස්තර නිර්මාණකරණ උපාධිධාරියෙක්**

ගොඩක් ඇඟලුම් ව්‍යාපාරිකයෝ ප්ලස් සයිස් ඇඳුම් නැත්තම් විශාල ප්‍රමාණයේ ඇඳුම් ගැන ලොකු අවධානයක් දක්වන්නේ නැහැ. විශාල ප්‍රමාණයේ ඇඳුම් අඳින පාරිභෝගිකයන් වෙනුවෙන් වැඩි අවධානයක් දැක්වීම දුලීකාගේ ව්‍යාපාරයේ තවත් විශේෂත්වයක්.

**"හස්බන්ඩ්නුයි මමයි එකතුවෙලා ඇඳුම්වල හැඩය, මෝස්තර, වර්ණ, පතොරම් ඔය හැමදේම ඩිසයින් කරනවා. පස්සේ නිර්මාණ**



**ශිල්පීන් ලව්වා ඇඳුම නිර්මාණය කරගන්නවා. මුලදී අපේ කාර්යයමණ්ඩලයේ හිටියේ සාමාජිකයින් තුන්දෙනයි. මේ වෙනකොට අපේ කාර්යයමණ්ඩලයේ සාමාජිකයින් දහතුන්දෙනෙක් සේවය කරනවා."**

මේ ගමනේදි ඇයට මතුවෙන බාධා අභියෝග එහෙමත් නැතුවම නෙමෙයි.

**"අපේ වැඩේට හරියට බතික් සහ බීරළු නිර්මාණකරුවන් හොයාගන්න සෑහෙන මහන්සි වුණා. අනික සමහර කාලෙකට වෙළඳපොළේ බතික් අමුද්‍රව්‍ය හිඟ වෙනවා. කාලෙකට ඒවගේ මිල ඉහළ යනවා. ඔය හැමදේම කළමනාකරණය කරගෙන තමයි මේ ව්‍යාපාරය කරගෙන යන්නේ."**

සාර්ථකත්වය කියන්නේ නිකන් ලැබෙන දෙයක් නෙමෙයි. ඒ වෙනුවෙන් නිරන්තර කැපවීම අත්‍යවශ්‍යයි කියන එක ඇය කිව්වේ මෙහෙම.

**"ව්‍යාපාරය පටන්ගත්තු මුල් කාලේ රෑ එක දෙක වෙනකල් නිදිමරාගෙන වැඩ කළා. හදිස්සි ඇණවුම් ලැබුණොත් අදටත් එහෙමයි. නිකන් බලාගෙන ඉඳලා බිස්නස් එකක් දියුණු කරගන්න බැහැ. ව්‍යාපාර පටන්ගත්තට කැපවීමෙන් ඒක කරන්න ගොඩක් අය කම්මැලියි. තමන්ගේ බ්‍රෑන්ඩ් එක මාර්කට් කරන එක ඊළඟ දේ. නිර්මාණ හැකියාව තිබුණාට ඒක අලෙවි කරගන්න ගොඩක් අයට දැනුම නැහැ. දෙයක් මිලදී ගන්න එන පාරිභෝගිකයාව නොසලකා හැරලා උවමනාවට එපාවට කතා කරන අයත් ඉන්නවා. මුලින්ම තමන්ගේ පාරිභෝගිකයන්ට ගෞරවයෙන් කතා කරන්න ඉගෙනගන්න ඕනේ. මගේ ගොඩක් පාරිභෝගිකයෝ මම කතාබහ කරන විදියට කැමතියි. අනික දැන් සමාජ මාධ්‍ය දියුණු නිසා ඒකට ඉඩහසර ඕනතරම්. අපි අලුතෙන් හදන හැම ඇඳුමක්ම සමාජ මාධ්‍යවල පළකරනවා. ඒ නිසා අපේ ඇඳුම්වලට පිටරටවල ඉන්න ශ්‍රී ලාංකිකයින්ගෙන් පවා හොඳ ඉල්ලුමක් තියෙනවා."**

මේ වෙනකොට දුලීකාට අවුරුදු එකහමාරක පුංචි පුතෙක් ඉන්නවා. ඉතින් ව්‍යාපාරයේ වැඩකටයුතුවලට වගේම ගේදොර කළමනාකරණයටත් සැමියගෙන් විශාල සහායක් ලැබෙන බවයි ඇය කිව්වේ. ඔය අතරේ ඇගේ ආදරණීය මව, පියා සහ මොරටුව විශ්වවිද්‍යාලයේ මෝස්තර නිර්මාණකරණ අංශය එහෙමත් සිහිපත් කරන්න දුලීකා අමතක කළේ නැහැ.

**"ඉඩක් ලැබෙන හැමවෙලාවකම බබාටයි හස්බන්ඩ්ටයි පුංචිවට හරි රස කෑමක් හදලා දෙනවා. පුළුවන් වුණු ගමන් තුන්දෙනාම ඇවිදින්න යනවා. වෘත්තීය දියුණුව ගැන හිතනවා වගේම පෞද්ගලික ජීවිතේ සමබරතාවය රැකගන්නත් කාන්තාවක් දක්ෂ වෙන්න ඕනේ."**

ඇත්ත. සාර්ථකත්වය තියෙන්නේ සමබර වෙන තැන කියලා ප්‍රසිද්ධ කියමනකුත් තියෙනවනේ. ව්‍යාපාරයක් පටන්ගන්න ආසාවෙන් ඉන්න කෙනෙක් වෙනුවෙන් වචනයක් කියන්නත් ඇය අමතක කළේ නැහැ.

**"ගෑනුන්ට බිස්නස් කරන්න බැහැ කියලා සමාජයේ මතයක් තියෙනවානේ. ඒ නිසා සමහර කාන්තාවෝ දෙයක් පටන්ගන්න හරි බයයි. බිස්නස් කරන්න ගෑනු, පිරිමි බේදයක් නැහැ. ව්‍යාපාර කරලා දියුණුවෙච්චි කාන්තාවෝ ලංකාවෙම කොච්චර නම් ඉන්නවද? කැපවීම ඉස්සරහා ගෑනු, පිරිමි කියන්නේ නිකන්ම නිකන් වචන විතරයි. අනික ව්‍යාපාරයකින් සල්ලිවලට අමතරව සතුටත් හොයන්න පුළුවන්. කෙනෙක් අපි මහන්සියෙන් හදන ඇඳුම් ඇඟට දාලා ඒක ලස්සනයි කිව්වහම දැනෙන සතුට සල්ලිවලටවත් ගන්න බැහැ. ඉතින් මම අනිත් අයටත් කියන්නේ ව්‍යාපාරයක් කරන්න ආසාවක් තියෙනවා නම් බය නැතිව උත්සාහ කරලා බලන්න කියන එකයි."**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**ඡායාරූප : ප්‍රදීප් දඹරගේ**

# දරුවෙකුට දරුවෙක් බිහි කරන්න බෑ කියලා අම්මයි කියාදෙන්න ඕන

දැනගෙන ගියොත් කතරගම නොදැන ගියොත් අතරමග යැයි කියන්නා සේම, යොවුන් වයසේ දරු දැරියන් තීන්දු තීරණ ගත යුත්තේ කල්පනාකාරීවය. අප එසේ කියන්නේ ඒ වයස බොහෝ වැරදීම් සිදුවිය හැකි කාලයක් බැවිනි.

**“මේ දවස්වල රටේ තියෙන ප්‍රශ්නත් එක්ක ඔසුසැල්වල ඖෂධ හිඟයක් තියෙනවා. ඒ වගේම උපත්පාලන කොපුවල (කොන්ඩම්) හිඟයකුත් තියෙනවා. ඒ අතර පොස්ටිනෝර්-2 (Postinor-2) වගේ ඖෂධවල හිඟයක් තියෙනවා. මේ තත්ත්වය තුළ කොන්ඩම් වගේම පොස්ටිනෝර්-2 පෙති මිලට ගන්න තියෙනවද අහලා දවසකට දුරකතන ඇමතුම් රැසක් එනවා. ඒ අතරින් වැඩි දෙනෙක් බාලවයස්කාර දැරියන්. බොහෝ අසරණව ඔවුන් හඬා වැළපෙන අවස්ථා අපි ඕනතරම් දකිනවා.”**

ඒ සමස්ත ලංකා ඔසුසැල් හිමියන්ගේ සංගමයේ සභාපති චන්දික ගන්කන්ද මහතායි.



ජාතික ළමා රක්ෂණ අධිකාරියේ මනෝ සමාජයීය අංශයේ අධ්‍යක්ෂ **ලක්මාල් පොන්නම්පේරුම මහතා**

අනාරක්ෂිත ලිංගික සබඳතා නිසා බාලවයස්කාර දැරියන් ගැබ්ගැනීමේ ප්‍රතිශතයද ඉහළ යමින් පවතින බව විආශ්‍රිත දත්ත වාර්තා මගින්ද අනාවරණය වී තිබේ. අප ඒ පිළිබඳව විමසා සිටියේ ජාතික ළමා රක්ෂණ අධිකාරියේ මනෝ සමාජයීය අංශයේ අධ්‍යක්ෂ ලක්මාල් පොන්නම්පේරුම මහතාගෙනි.

**“සාමාන්‍යයෙන් රටේ නීතියට අනුව අපි ළමා මවක් විදියට හඳුන්වන්නේ වයස අවුරුදු එකොළහත්-දාසයත් අතර දැරියක් කියලා කියන්න පුළුවන්. ඒ වයස ගැහැනු පිරිමි භේදයක් නැතුව ලිංගික හැඟීම් උද්වීපනය වෙන කාලසමයක්. එතැනදී දරුවන් තුළ කුතුහලයක් තියෙනවා. ඒ වගේම ගැහැනු දරුවන්ට තම පළමු ලිංගික අත්දැකීම ඉක්මනින් සිදුවීමේ ඉඩකඩක් තියෙනවා. හෝර්මෝනවල සිදුවන වෙනස්කම් හෝ වෙනත් සමාජ බලපෑම් හේතුවෙන් මෙවැනි දේවල් ඉක්මන් වෙන්න ඉඩකඩත් තියෙනවා. එය දෙමාපියන්ගේ සොයාබැලීම්, රැකවරණය සහ පහදාදීම් මත පමා කළ හැකියි. විශේෂයෙන්ම මේ නොතේරුම් වයස පහුවෙන තුරු දෙමාපියන් දරුවන් පසුපස සිට මේ ආදීනවයන් කියාදෙන්න ඕන. මේ විදියට දැරියක් ලබන පළමු ලිංගික අද්දැකීම ප්‍රමාද කරගන්නා තරමට ළමා මව්වරුන් බිහිවෙන්න තියෙන ඉඩකඩ පමාවෙනවා. ඒ වගේම ඇයත් දරුවෙක් කියලත්, දරුවෙකුට තවත් දරුවෙක් බිහි කරන්න තරම් ශරීරය සැකසිලා නෑ කියලත් මනසට කාවැද්දීම ඉතාම අවශ්‍යයි.”**

**බාල වයස්කාර දැරියන් ගැබ් නොගැනීමේ ඖෂධ සොයන ප්‍රවණතාව වැඩිවෙලා**

ඔහු කියනා පරිදි ලෝකය හඳුනාගන්නට, ඒ හොඳ නරක හඳුනාගන්නට දෙමාපිය ආදරය, රැකවරණය සොයාබැලීම තරම් ඔසුවක් තවත් නොවේ. මේ තුළ ඇතිවන හිස්තැන තුළ විශේෂයෙන්ම ගෙදරින් නොලැබෙන ආදරය සොයායාමේ අවධානම කොතෙක්දැයි වටහෙන විට ජීවිතයට බොහෝ අඳුරු පැල්ලම් එක්වී තියෙන්නට පුළුවන.

**“අපි ළඟට එන ගොඩක් ගෑනු දරුවෝ කියන කතාවක් තමයි එයාලට දෙමව්පියෝ ආදරේ නෑ කියන එක, හොයලා බලන්නේ නෑ කියන එක. අන්තිමේදී ඒ ආදරේ පිටින් හොයාගෙන ගිහින් ජීවිතේ විනාස වුණා කියලා තමයි ඒ අය කියන්නේ. ඒ වගේම ගොඩක් ගෑනු ළමයින්ගේ කතා ඇහුවම ඒ අයට ගැබ්ගැනීමක් වෙන්න කලින් අවශ්‍ය ආරක්ෂාව සලසගන්න අවස්ථාව තිබිලා තියෙනවා. නමුත් ඒ අය දෙමාපියන්ට තියෙන බය නිසා සිද්ධ වුණ දේවල් වසන් කරගෙන ඉඳලා අවසානයේ නොදැනුවත්වම ළමා මව්වරු බවට පත්වෙලා. අන්න ඒ නිසා මොන ප්‍රශ්නයක් ආවත්, මොන වැරැද්දක් කළත් දෙමාපියන් නිතරම දරුවා සමඟ ඉන්නවා කියන එක එයාලට දැනෙන්න දෙන්න. ඒකෙන් මං අදහස් කළේ දරුවන්ගේ වැරදි හොද හෝදා මඩේ දාන්න කියන එක නෙවෙයි. දරුවෙක් තනිවුණ ගමන් පිටස්තරයින් ඒකෙන් ප්‍රයෝජන ගන්න උත්සාහ කරන නිසා ඒකට කිසිම අවස්ථාවක ඉඩක් දෙන්න එපා.”**

**එකම හිංසනය විසි තිස් වතාවක් වෙනතුරු තමන්ට සිද්ධ වෙන්නේ මොකක්ද කියලා ගොඩක් දැරියෝ දන්නේ නැහැ**

එමෙන්ම බාලවයස්කාර දැරියකට යම් අතවරයක් සිදුවුවද ඔසුසැල්වලින් උපත්පාලන ඖෂධ ලබාගැනීමට හැකියාවක් බොහෝවිට නැත. වෙනත් පාර්ශවයක් ලවා ඒවා මිලදීගත්තද ඒවා භාවිත කිරීමට දැනුමක් නොමැතිකමද මෙවැනි ගැබ්ගැනීමකට තවත් එක් හේතුවකි.

ඒ වාගේම ඉකුත් කාලය තුළ තම පියා, සහෝදරයා, නෑදෑයින් සහ සමීපතමයින්ගෙන් අපයෝජනයට ලක් වූ දැරියන් ගැනද අසන්නට ලැබුණි. එවැනි අවස්ථාවලදී එම පුද්ගලයින්ගේ හැසිරීම් රටාවේ විලාසයන් තේරුම්ගෙන හෝ ප්‍රවේසම්වීමට දරුවන්ට ලිංගික දැනුමක් නොමැති වීම ගැටලු සහගත බවද ඔහු පැවසීය.

**“ගොඩක් වෙලාවට මේ වගේ බාලවයස්කාර දැරියන්ට ළංවෙන පිරිමින් එක්වරම ඔවුන්ව ලිංගික කටයුතුවලට පොළඹවා ගන්නේ නැහැ. මුලින් මුලින් ස්පර්ශ කිරීම්, සිප වැළඳගැනීම් වගේ දේවල්වලට යොමුකරවගන්න බලනවා. උදාහරණයක් වශයෙන් ඕනෑම වැඩිහිටි පිරිමියෙක් අනවශ්‍ය විදියට දරුවව තුරුලට, උකුලට ගන්නවා නම් ඒ දේවල් තේරුම්ගන්න තරම් දරුවන්ට සියුම් හැකියාවක් තියෙන්න ඕනේ. අනික අපේ සායනවලට එන ගොඩක් දැරියෝ පළවැනි ලිංගිකව එක්වීමෙන්ම ගැබ්ගත්තු අය නොවෙයි. හැබැයි එකම හිංසනය විසි තිස් වතාවක් වෙනතුරුත් තමන්ට මොකද්ද සිද්ධ වෙන්නේ කියන එක තේරුම්ගන්න එයාලට අවබෝධයක් තිබිලා නෑ.”**

මේ හේතු නිසාම ඉදිරියේදී ලිංගික අධ්‍යාපනය පිළිබඳව කරුණු පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීමේ වැදගත්කමද ඔහු පෙන්වා දුන්නේය.

ළමා මව්වරුන්ගේ ප්‍රතිශතය කොතරම්දුරට වැඩිවී ඇද්දැයි ඊළඟට අප විමසුවේ පවුල් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂිකා චිත්‍රමාලි ද සිල්වා මහත්මියගෙනි. ළමා ගැබිනියන් බිහිවීම වළකා ගැනීමට කළ හැකි දේ මොනවාද යන්නත් අප ඇයගෙන් විමසුවෙමු.

**“2021 අවුරුද්දේ 3.9% තිබුණ ළමා මව්වරුන්ගේ ප්‍රතිශතය මේ වනවිට 4%ක් දක්වා වැඩිවීමක් වෙලා තියෙනවා. දැනට අපේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් එවැනි ළමා මව්වරුන්ව හඳුනාගැනීමක් කරලා, ඔවුන්ගේ අනාගතය යහපත් කරන්න, ගත යුතු නීතිමය පියවර සොයා බලමින් ඉන්නවා. ඒ වගේම බොහොමයක් දෙනා ඒ සත්‍ය සමාජයෙන් වසන් කරන අවස්ථා තියෙනවා. ඒ අය ඒවා අපෙන් හංගන්නේ පරිවාසගත වෙන්න වෙයි කියලා බයට. නමුත් අපි කිසිම වෙලාවක කරුණු විමර්ශණයක් කරන්නේ නැතුව දරුවෙක් පරිවාසගත කරන්න කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා අපි දෙමාපියන්ට කියන්නේ ඔබේ දරුවාත් මේ විදියේ ගැටලුවලට මුහුණදීලා තියෙනවානම් ඒවා වසන් කරන්නේ නැතුව අදාළ බලධාරීන් දැනුවත් කරන්න. එය දරුවාගේ අනාගතය සුබදායී කරන්න හේතුවක් වෙනවා.”**



ලිහිණි මධුෂිකා



# අලුත්නුවර සිට මහනුවරට සුරනිමල එක්ක පයින් ගිය සුනඛයා

ඒ දෙදහස් දසය අවුරුද්දේ දවසකි. සත්තු කෙරෙහි උණුවන හදවතක් ඇති සුසන්ත නෙතට කඳුළු උණන සංවේදී දසුනක් එදා දුටුවේය. ඒ ඔහු ව්‍යාපාර කටයුතු කරන අලුත්නුවර දේවාල භූමියට ආසන්න මහමග සිටි බලු පැටවුන් සිව්දෙනෙකුගෙන් තුන්දෙනෙක්ම වාහනවලට අසුවී මියගොස් සිටි අයුරුය. ඒ පැටවුන්ගේ අම්මාද එහි සිටියත් මිනිස් අම්මෙකුට මෙන් පාර පුරා දුවන බලු පැටවුන් එකතු කරන්නට ඒ අම්මාට බැරි නිසා පැටවුන් වාහනවලට බිලිවී තිබුණි. ඉතිරිව සිටි එකම පැටවාත් ඒ අම්මාගෙන් වෙන් කිරීම දුකක් වුවත්, පැටවාගේ ජීවිතය ගැන සිතා සුසන්ත බලු පැටවා දෝතට ගත්තේය. දේවාල භූමියේ සිට කිලෝමීටර් බාගයක් පමණ දුරින් ඇති සුසන්තගේ ගෙදරට ‘ෂීබා’ ආවේ එහෙමය. ඒත් සුසන්ත පාරේ සිටි ෂීබාගේ අම්මා අමතක කළේ නැත. උදේ හවස යද්දි එද්දී මොනවම හෝ දෙයකින් ඔහු ඒ කුස පිරෙව්වේය.

සුසන්ත ප්‍රේම කුමාර මාවනැල්ලේ කොටබෝගොඩ පදිංචිකරුවෙකි. ඔහුගේ බිරිඳ නිශාන්ති නිල්මිණී කුමාරිය. සුසන්තටත් නිශාන්තිටත් දහසය හැවිරිදි හා නව හැවිරිදි දියණියක් හා පුතෙකුද වෙයි. මේ සියලුදෙනාම සුසන්ත සේම සත්තුන්ට බොහෝ ආදරයක්, කරුණාවක් ඇත්තෝය. ෂීබාට කලින් පාරෙන් ගෙනවිත් හද නැතිවුණ බ්‍රවුනිගේ අඩුව යන්නත් එක්ක ෂීබාට ලොකු ආදරයක් ඒ ගෙදරින් ලැබුණේය. ඒ ආදරයට ෂීබා ද කළගුණ සලකන්නට අමතක නොකළේය. ගෙදරින් පිටව සුසන්ත එළියට යන හැමවිටම තරමක් පැටවා කාලයේ පටන් සුසන්ත ෂීබා පස්සේ වැටුණේය.

**“එක ෂීබගේ ජීවිතේට අනතුරුදායක දෙයක්. අපේ ගෙවල්වල තාප්ප ගේට්ටු නෑනේ. ඒ නිසා ෂීබාට ඕන වෙලාවක එළියට බහින්න පුළුවන්. මේ හින්දා අපි ෂීබව චේන් එකක් දාලා ගේ ඇතුළෙන් බැඳලා තියාගත්තා. කාලයක් එහෙම කරද්දී ඒකේ නරක ප්‍රතිවිපාකයක් අපිට ලැබුණා. ඒ ඉස්සර කා එක්කත් බොහොම හීලෑවට හිටපු ෂීබා සැර බල්ලෙක් වුණා. කවුරුහරි දැක්ක ගමන් ගොරවන්නත්, හපන්නත් ලෑස්තිවුණා. මේ නිසා අපි ෂීබාට ආයෙත් නිදැල්ලේ ඉන්න දුන්නා.”**

ඒ නිදැල්ලේ ඉඳිල්ල ෂීබා අපූරුවට වින්දේය. ගෙදර ඉන්නවා හා සමානම වෙලාවක් සුසන්තගේ පස්සෙන් ඇවිද්දේය. බඩගිනි එන හැම වෙලාවෙම ගෙදර ඇවිත් නිශාන්තිට කතා කළේය.

**“උදේ පාන්දර හය වෙනකොට ඇවිත් කුං කුං ගාලා බුරනවා, ක්‍රීම් කැකර් බිස්කට් එකක් ඉල්ලලා. ඒක කාලා ආයේ බඩගිනි වෙනකොට ගෙදර ඇවිත් කෑගහනවා බත් ඉල්ලලා. ඒ ටෝන් එක වෙනස්. ගෙදර කවුරුත් පේන්න නැත්තම් එහෙම ආයෙ තව හඬකින් කෑ ගහලා කතා කරනවා. ෂීබා වැඩිපුර මස් මාළුවලට කැදර නෑ. පරිප්පු, පොල්සම්බෝලවලට ගොඩක් කැමතියි. එළවලුයි, බතුයි දුන්නත් කනවා. හැම පෝයකටම අපේ ගේ ළඟ තියෙන ඉඩම්පිටිය සේතගිරි**

**කොච්චර එළෙව්වත් එයා මං පස්සෙන් එන බව දන්න හින්දා මං එන්න ඉඩ දීලා නිකම් හිටියා. මෙයාට කිලෝමීටර් විසිපහක් විසිහයක් එකදිගට යන්න පුළුවන් වෙයිද කියලා බයත් හිතුණා. ඒත් මූණෙන්වත් ගමනෙන්වත් වෙහෙසක් පෙන්නුවේ නම් නෑ**

**විහාරයට යනවා. එදාට නිශාන්තිගෙ අම්මා සිල් ගන්නවා. එදා දවසම පන්සලේ ඉඳලා පහුවදා අම්මා සිල් පවාරණය කරලා ගෙදර එද්දි තමයි ෂීබත් එන්නේ.”**

ඒ වගේම ෂීබාට හැම ඉරිදටමත් ඒ පන්සලේ තව රාජකාරී කටයුත්තක් ඇත්තේය. ඒ සුසන්තගේ හා නිශාන්තිගේ දරු දෙදෙනා දහම් පාසල් යද්දී පස්සෙන් යාමය. ඒ ගොස් ටික වෙලාවකින් පන්තියක් පන්තියක් ගානේ ගොස් මොවුන් සොයා ළඟට වී ඉඳගෙන සිටියි. දහම් පාසල ඇරුණු පසු ඔවුන් දෙන්නා පස්සෙන් ගෙදර එයි. වෙනත් සතුන්ට වඩා ගෙදර මිනිස්සුන් පස්සෙන් ගොස් ඔවුන් රකින්නට ෂීබාට උවමනාවක් ඇත. ගෙවුණු ජූලි 28 වැනිද උදේ පාන්දර යන්නේ කොහෙදවත් නොදැන ෂීබා සුසන්ත පස්සෙන් වැටුණේ එනිසාමය. ෂීබා නොදැන සිටියාට සුසන්ත ගියේ පූජනීය කටයුත්තක් වෙනුවෙන් අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලයටය. ඒ පසුගියද අවසන් වූ ඇසළ පෙරහරේ ආරම්භක දිනයයි.

**“මහනුවර ඇසළ පෙරහරට කප කැපීම සිදුකරන්නේ මහනුවර ශ්‍රී මහ විශ්ණු දේවාලයේ ප්‍රධානත්වයෙන්. මහනුවර ශ්‍රී මහ විශ්ණු දේවාලයට අනුබද්ධිත මාවනැල්ලේ අලුත්නුවර ශ්‍රී දැඩිමුණ්ඩ දේවල භූමියෙන් තමයි ඒ කප කපන්නේ. ඒකට හේතුව වන්නේ මහනුවරට විශ්ණු දේවාලය අරගෙන යන්නට කලින් ඒ දේවාලය තිබුණේ අලුත්නුවර වීම. මේ දේවාලය මහනුවරට රැගෙන ගිහින් තියෙන්නේ එක්දහස් හයසිය ගණන්වලයි. එදා ඉඳලා අලුත්නුවර දේවාලේ ඉඳලා තමයි කප කපාගෙන අරගෙන ගිහින් තියෙන්නේ.**

**අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලයේ ඉඳලා මහනුවර විශ්ණු දේවාලයට ඇති දුර කිලෝමීටර් විසි පහකට ආසන්නයි.**

**අලුත්නුවර දේවාල භූමියේදී ඒ රාජකාරීකරුවන් විසින් චාරිත්‍රවලට අනුව කැපූ කප මහනුවර කරා රැගෙන යන්නේ කුඩා පෙරහරකින්. ඒ පෙරහරේ කප රැගෙන යන්නේ ඇතෙකු පිටින් වන්නකුරාල විසින්. මෙදා වතාවේ දේවාලේ අලියා, සුරනිමල තමයි කප අරන් ගියේ. එතකොට මේ පෙරහරට දේවාලයේ රාජකාරී කටයුතු කරන පිරිසක්, කොඩි කණ්ඩායමක්, හේවිසි කණ්ඩායමක් සහ දේවාලය අවට ගම්වල ගම්වැසියන් ඇතුළත් සීයකගේ විතර කණ්ඩායමක් එකතු වෙනවා. එදත් උදේ හයට විතර මේ පිරිස අලුත්නුවර දේවාල භූමියෙන් පිටත් වුණා.”**

අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලයේ තේවාව භාර දම්සිරි බණ්ඩාර කරුණාරත්නත් එදා මේ පෙරහරට එක්වුණේය. සුසන්ත ඒ උදේම පේවී ගියේත් මේ පෙරහරේ යන්නටය. උදේ හයට චාරිත්‍රානුකූලව කැපූ කපත් සමඟ චාරිත්‍රානුකූලව පෙරහර අලුත්නුවර දේවාලයෙන් ගමන් අරඹද්දී සුසන්තත් සමඟ ෂීබාත් ගමන් ඇරඹුවේය.

**“ඒ වෙලාවට එළෙව්වට වැඩක් නෑ. කොච්චර එළෙව්වත් එයා මං පස්සෙන් එන බව දන්න හින්දා මං එන්න ඉඩ දීලා නිකම් හිටියා. මෙයාට කිලෝමීටර් විසිපහක් විසිහයක් එකදිගට යන්න පුළුවන් වෙයිද කියලා බයත් හිතුණා. ඒත් මූණෙන්වත් ගමනෙන්වත් වෙහෙසක් පෙන්නුවේ නම් නෑ. අතරමගින් අපිට කෑමබීම දන්සැල් ලැබුණා. ඒ සංග්‍රහයන් ෂීබටත් ලැබුණා. ඔය විදියට ගිහින් සවස තුනට කලින් අපි මහනුවර ශ්‍රී විශ්ණු දේවාලයට ගියා. ගමෙන් ගිය අය දේවාලය වැඳ පුදාගත්තා. ෂීබා ගස් හෙවණකට වෙලා මහන්සි අරිනවා මං බලාගෙනයි. කට්ටියට කෑම දෙනකොට දේවාලෙන් ෂීබටත් කෑම ලැබුණා. දේවාලයෙන් රාජකාරිවලට ගිය කට්ටිය කපත් එක්ක අනෙක් රාජකාරි සඳහා නවතිද්දී අපි ආපහු එන්න සූදානම් වුණා.”**

ගියේ පයින් වූවාට කවුරුත් ආපහු එන්නේ වාහනවලය. සාමාන්‍යයෙන් සුරනිමල අලියා පටවන වාහනයේත් මිනිසුන් පිරිසකට යන්නට තරමක ඉඩක් ඉතුරුවෙයි. ඒ ඉඩට ගමෙන් ගිය පිරිසක් නගිද්දී සුසන්තද ෂීබාත් සමඟ අලියා රැගත් වාහනයට නැගුණේය. වාහනයේ අලියෙකු සිටියා කියා ෂීබාට ගානක්වත් නැත. ඌ උගේ පාඩුවේ අලුත්නුවර දේවාලයට ආවේය. ඉන්පසු සුසන්තත් සමඟ ගෙදර ආවේ සවස හයට විතරය.

ඒ වනවිට ෂීබා සුසන්ත හා විශ්ණු දේවාලයට පෙරහරේ ගිය පුවත නිල්මිණීටත් ආරංචි වී තිබුණි. ගෙදර ආ ෂීබාට වෙනදටත් වඩා විශේෂකොට ඈ කෑම දුන්නේ සතා ඒ සා දුරක් ගෙවාගෙන ගියේ සුසන්ත ආරක්ෂා කිරීමට වීම නිසාය.

**“මීට කලින් ඒ තරම් දුරක් ෂීබා මාත් එක්ක ඇවිත් නෑ. කලින් අවුරුද්දකත් හිඟුල පැත්තෙ බල්ලෙක් ඔහොම පෙරහරේ ගිහින් තියෙනවා කියලා මං අහලා තියෙනවා. මං මේ පෙරහරේ ගිය දෙවැනි අවුරුද්ද නිසා එයා මට හමුවෙලා නෑ. කොහොම වුණත් සත්තුන්ගෙනුත් මං දැක්ක විශේෂම ගතිගුණ තමයි ෂීබා ළඟ තියෙන්නේ.”**

සුසන්තගේ ගෙදරට ෂීබා සේම ‘නෝනා’ත් පාරෙන් ආව අසරණියකි. දරුණු ලෙස අතක් තුවාල වී සිටි නෝනාට සුසන්තත් කොස්තාත් එක්ව බෙහෙත් කළ පසු දින කීපයකින් නෝනා සුසන්ත පස්සෙන් ගෙදරම ආවාය. දැන් ඇය සති තුනක් වයසැති දරුවන් පස්දෙනෙකුගේ අම්මා කෙනෙකි. සුසන්තගේ දියණියගේ සුරතලා වන ‘චූටි පූස්’ ද පාරට වැටුණු කෙනෙකි. ඇගේ මිතුරියක් පාරෙන් අහුලාගත් චූටි පූස් ඒ ගෙදරට ලැබුණේ පුතුගේ උපන්දිනයදය. ගෙදරින් පිට වෙනත් කිසිම සතෙක් හා මිතුරු සමාගම් පවත්වන්නට කැමති නැති ෂීබා මේ කොයි කවුරුත් සමඟ මිතුරුය.



**බියංකා නානායක්කාර**

**ඡායාරූප - චන්දන උඩුවාවල**

එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධව සිට පුනරුත්ථාපනය වූ කතුන්ගේ සුඛිත මුදිත ජීවිත කතා පෙළ - 24 වැනි කොටස



# මරාගෙන මැරෙන්න
## බලාගෙන හිටපු අයට
## මූණ සුදුවෙන ක්‍රීම් ගාන්න හිතිලා



**සංගීත ගුරුවරියක් මෙන්ම ක්‍රීඩිකාවක ලෙසද දස්කම් දක්වා ඇති කපිතාන් ජයනි හේරත් කලක් අධ්‍යාපන අමාත්‍යංශයේ ක්‍රීඩා සංවිතයේත් රාජකාරි කර ඇත. 1996දී දෙවන ලුතිනන්වරියක ලෙස ජාතික ශිෂ්‍ය භට බළකායට එක්වූ ඇය 2006 වසරේදී සක්‍රිය හමුදා සේවයට එක්වී ඇත. පසුව ඇය යුද සමයේ අවසාන කාලයේදී හමුදා භාරයට පත්වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකාවන්ගේ පුනරුත්ථාපන රාජකාරියටද එක්වූ අතර එලෙස පුනරුත්ථාපනය වූ කොටි සාමාජිකාවන් ගැන කපිතාන් ජයනි හේරත් කියන කතා පෙළයි මේ.**

එවකට පුනරුත්ථාපන කඳවුරු තුළ සිටි අභ්‍යාසලාභීන්ට අවශ්‍ය ආහාර ඇතුළු සියලුම පහසුකම් සපයන ලද්දේ රජය විසිනි. නමුත් ඔවුන් සමාජගත (නිදහස්) වීමෙන් පසු තත්ත්වය වෙනස් විය. ඉන්පසු තමන්ට අවශ්‍ය සියලු දේ සපයාගැනීමේ වගකීම ඔවුන්ටම පැවරිණි. ඒ නිසා ඊට පිළියමක් ලෙස පුනරුත්ථාපනය වන තරුණියන් ඇඟලුම් කර්මාන්තශාලාවල රැකියා සඳහා යොමුකිරීමට පුනරුත්ථාපන නිලධාරීන් කටයුතු කළහ. එම කටයුත්තේදී තමන් ලද අත්දැකීමක් කපිතාන් ජයනි මෙසේ විස්තර කළාය.

“මගේ මතකයේ හැටියට ළමයි 450ක් මුල් වටයේදීම පුහුණුවට සහ රැකියාවට කොළඹට ගියා. මේ 540 ඇඟලුම් කර්මාන්තශාලා 6කට දැම්මා. ඒකෙන් 5ක් කුමාර් දේවපුර මහත්තයා හිමිකාරීත්වය දරපු ‘ට්‍රයිස්ටාර්’ කර්මාන්තශාලා. රත්මලානෙ තිබුණ ගාමන්ට් දෙකකට මම ළමයි 120ක් එක්ක ගියා. නවාතැන් පහසුකම් සේරම ලැබුණා. හැබැයි මට දවස් 15ක් එහේ ඉන්න වුණා. එහෙම ඉන්නකොට එවකට පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්, මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ සර්ගෙන් දවල් කාලයේ හදිසියේම දුරකතන ඇමතුමක් ලැබුණා.”

> සමහර ළමයි ඇවිත් කියනවා, මැඩම් දෙමළ චිත්‍රපටවල ඉන්න නිළියෝ වගේ ළමයිනුත් වැඩ කරනවා. සිංහල ළමයි හරිම ලස්සනයිනේ කියලා

“ජයනි ඔයාට සුදානම් වෙන්න පැයක් දෙන්නම්. වහාම නිට්ටඹුවට ගිහින් එහේ ඉන්න ළමයින්ව භාරගන්න.”

ජෙනරාල්වරයාගෙන් උපදෙස් ලැබිණ.

“ඊටපස්සේ බ්‍රිගේඩියර් ඇහැලමල්පේ සර් මට කතා කළා. ඒ සර් කීවා එතැන හිටපු නිලධාරිනියට හදිසියේම එම ස්ථානයෙන් යන්න සිද්ධ වෙලා තියෙනවා, ඒ නිසයි මට එහෙට යන්න වෙලා තියෙන්නේ කියලා. හරියටම පැයක් යද්දි මම නවාතැන්ගෙන ඉඳපු තැනට වාහනයක් ආවා. ඒකේ නැගලා නිට්ටඹුවට ගියා. නිට්ටඹුවේ ඇඟලුම් කර්මාන්තශාලා තුනක වැඩ කරන ළමයි 320ක් හිටියා. වහපු ඇඟලුම් කර්මාන්තශාලාවක් තමයි ළමයින්ගේ හොස්ටල් විදියට සකස් කරලා තිබුණේ. කෑම කේටරින් සර්විස් එකකින් ගෙනැත් දුන්නා. හැමදාම උදේට බස් 4ක් ඇවිත් ළමයින්ව අරගෙන ෆැක්ටරිවලට යනවා. ආයිත් හවසට එනවා. මගේ උදව්වට යුද හමුදා කාන්තා බළකායේ දෙන්නෙකුයි, නාවික හමුදා කාන්තා නිලධාරිනියන් දෙන්නෙකුයි දීලා තිබුණා. මේ හතරදෙනා උදේ හවස නිල ඇඳුම් ඇඳගෙන බස් හතරේ ළමයින්ව අරගෙන යන එන එක කළා. ගිරිඋල්ල, ගොම්මළුව කියන තැන්වල තමයි මේ ෆැක්ටරි තිබුණේ. නවාතැන්පොළට ගියාට පස්සේ මට තේරුණා මේ ළමයින්ට ආරක්ෂාව මදි කියලා. ඒ නිසා උපදෙස් අරගෙන මේ ගැන වරකාපොළ පොලිසියට කීවා. එතැන කාරියවසම් කියලා මහත්තයෙක් හිටියේ. එයා අපේ ආරක්ෂාවට රාත්‍රියට විශේෂ මුර සංචාරයක් දාලා දුන්නා. හැබැයි එල්.ටී.ටී.ඊ. එකේ හිටපු ළමයි කියලා ඒ පැත්තෙ කිසිම කෙනෙක්ගෙන් වචනයකින්වත් කිසිම වරදක් වුණේ නැහැ.”

“එතකොට ආයතනයේ වැඩ කරද්දි සිංහල ළමයින්ගේ ප්‍රතිචාරය කොහොමද?” මා ඇසීමි.

“මේ ළමයි යන්න කලින් ඒ ආයතනවල ප්‍රධානීන් සිංහල ළමයින්ව දැනුවත් කරලා තිබුණා. සිංහල ළමයින්ට කියලා දීලා තිබුණා මේ ළමයින්ව සහෝදරියක් විදියට බලනවා මිසක් එල්.ටී.ටී.ඊ. සාමාජිකාවක් විදියට බලන්න එපා කියලා. සිංහල ළමයි කොහොමද? කියලා මම අහද්දි එයාලා දීපු උත්තරේ තමයි, අපේ දෙමළ ළමයි වගේ නෙමෙයි හරි හොඳයිනේ කියලා. ඒ අතරේ සමහර ළමයි ඇවිත් කියනවා, මැඩම් දෙමළ චිත්‍රපටවල ඉන්න නිළියෝ වගේ ළමයිනුත් වැඩ කරනවා. සිංහල ළමයි හරිම ලස්සනයිනේ කියලා.





 බ්‍රිගේඩියර් **මංජුල ගුණසිංහ** හිටපු පුනරුත්ථාපන සම්බන්ධීකරණ නිලධාරී

“යුද්ධය අවසාන වෙද්දී හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් 12,000ක් විතර පුනරුත්ථාපන සඳහා වව්නියාවට ආවා. මේ පිරිස අතර 2,000ට වැඩි පිරිසක් කාන්තාවෝ හිටියා. පුනරුත්ථාපනය සඳහා මේ අය භාර කරද්දි අපට පැවරුණු මූලික වගකීම වුණේ සමාජගත (නිදහස්) කරද්දි නැවත ආයුධ අතට නොගන්න රටට වැඩදායී පිරිසක් විදියට සමාජගත කරන එකයි. ඒ සඳහා ගත යුතු විසඳුම්, තීන්දු, වැඩපිළිවෙල ගැන විවිධ සංවිධාන, රජයේ බලධාරීන් වගේම පුනරුත්ථාපන ප්‍රධානීන් නිතර නිතර සාකච්ඡා කළා. එතැනදී ගත්ත ප්‍රධානම තීරණයක් තමයි සමාජගත වෙද්දී රැකියාවක් එක්ක සමාජගත කරන එක. ඒ නිසා වඩු, මේසන්, රූපලාවණ්‍ය, මැහුම් වගේ පාඨමාලා කළා. හැබැයි ගෑනු ළමයි එක්ක කතා කරද්දි ගොඩක් අය කැමති වුණේ ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියාවකට. ඇඟලුම් ක්ෂේත්‍රයේ ඕනතරම් රැකියා තිබීම, එළිමහනේ නැතිව වායු සමීකරණ කරපු ආයතනයක රැකියාව කිරීම වගේ දේවල් නිසා කැමති වෙන්න ඇති. මේ අදහස මූලස්ථානයට දැනුම් දුන්නා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට ඇඟලුම් ආයතන කීපයක්ම මේ අයට රැකියා දෙන්න ඉදිරිපත් වුණා. ඇත්තටම ඒ වෙද්දි ඇඟලුම් ක්ෂේත්‍රයේ පුරප්පාඩු ගොඩක් තිබුණා. ඒ වගේම රටට විදේශ විනිමය ලැබෙන ක්‍රමයක් නිසා අපිත් මේ තරුණියන්ව දිරිමත් කළා. වැඩි දවසක් යන්න කලින් ‘ට්‍රයිස්ටාර්’ අධිපති කුමාර් දේවපුර මහත්තයා පුහුණු කටයුතු සඳහා ජුකී මැෂින් 20ක් අපට ලබාදුන්නා. පුහුණුකරුවන් ලබාදුන්නා. ඒ ජුකී මැෂින්වලින් වව්නියාව පට්පමඩු පුහුණු මධ්‍යස්ථානයේදී කෙටිකාලීන පුහුණුවක් ලබාදුන්නා. කොළඹ ගිහින් අපෙන් ඉල්ලීම් කරපු ඇඟලුම් කර්මාන්තශාලා පරීක්ෂා කළා. වැටුප්, ආරක්ෂාව, නවාතැන් පහසුකම්, ආහාර වගේ දේවල් අපි බලාපොරොත්තු වන තරමට තිබෙන ආයතන බලලා එම ආයතනවලට ළමයින්ව යොමු කළා.”

> LTTE එකේ ඉඳපු ගෑනු ළමයි ගොඩක් කැමති වුණේ ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියාවකට. එළිමහනේ නැතිව වායු සමීකරණ කරපු ආයතනයක රැකියාව කිරීමට ලැබීම නිසා කැමති වෙන්න ඇති

අව්වට යන්නෙ නැතිව ඒසී (වායුසමීකරණ) එකේ කාලයක් ඉද්දි ඔයාලත් ලස්සන වේවි කියලා මම කීවා.

මේ ළමයින්ට සැලකිය යුතු වැටුපකුත් ලැබුණා. ඉරිදා දවස නිවාඩු. නිවාඩු දවසේ දෙමව්පියන්ට ඇවිත් බලලා යන්න අවස්ථාව දීලා තිබුණා. ටික දවසක් යද්දි වැටුප් ලැබුණාට පස්සේ ළමයි කියන්න ගත්තා බඩු ගන්න එළියට යන්න ඕන කියලා.

‘මොනවද ළමයි ගන්න තියෙන බඩු?’ කියලා මම අහද්දි, ‘මූණ සුදු වෙන්න ගාන ක්‍රීම්, කුරුලෑ නැතිවෙන ක්‍රීම්, සෙන්ට් (සුවඳ විලවුන්), කොණ්ඩ කටු, වූල් බෑන්ඩ්, ටී ෂර්ට්’ ඔය වගේ ලැයිස්තුවක් කීවා. එක දවසක 20ක වගේ කණ්ඩායමක් හදලා වරකාපොළ නගරයට ගිහින් බඩු අරගෙන දුන්නා. මේ වැඩේ කරදර නිසා එක වෙළඳසැලකට කතා කළාම ඒ කඩේ අයිති ව්‍යාපාරිකයා ඉරිදට විතරක් ළමයින්ගේ හොස්ටල් එක ළඟ තාවකාලික කඩයක් දාන්න කැමති වුණා. අපේ හොස්ටල් එකට අල්ලපු වැටේ තිබුණේ හිස් ඉඩමක්. ඒ ව්‍යාපාරිකයා ඒ ඉඩමේ තාවකාලික කඩයක් දැම්මා. හැම ඉරිදටම ළමයින් සාමාන්‍යයෙන් ගන්න දේවල් වගේම රෙදිපිළි වගේ දේවල් අරගෙන එනවා. ළමයිනුත් ඒවා මිලදී ගත්තා. ළමයින්ටත් පහසුයි, ව්‍යාපාරිකයාටත් හොඳ වෙළඳමක් තිබුණා. හින්දු ළමයින්ව එයාලගේ ආගමික කටයුතු සඳහා වරකාපොළ කන්දක් උඩ තිබුණු කෝවිලකට එක්කරගෙන ගියා. කතෝලික ළමයිනුත් එයාලගේ දේවස්ථානයකට එක්කරගෙන ගියා. ඒ වගේම අලුතෙන් කියලා නැහැ සමහර ළමයි දක්ෂතා නිසා ෆැක්ටරියේ ‘ලීඩර්’ වගේ තනතුරුවලටත් ගියා.”

**සනත් ප්‍රියන්ත**

# නම්බුකාර විදියට බුරන බල්ලෙක්

පිංකියි, බටු මැක්කියි, කොණ්ඩ කිරිල්ලියි රාජකාරී වෙලාවේ අල්ලාප සල්ලාපයක.

**"බලන්න ඒයි! අපේ පැත්තේ දැන් හරියට හොරු. ඊයෙත් ගෙවල් තුනක් බිඳලා."** පිංකි පැවසුවේ සෑඩ් මූඩ් එකෙන්.

**"ගෙදර ආරක්ෂාවට බල්ලෙක්වත් නැද්ද?"** කොණ්ඩි මූණ බෙරි කළා.

**"නෑනේ බං."**

**"හරි! මං දෙන්නං හොඳ බලු පැටියෙක් ලාබෙට."** බටු මැක්කි පැනලා දුන්නා.

**"අන්න හොඳයි."** පිංකි කීවේ මැක්කි ඉඹගෙන ඉඹගෙන යන තරම් සතුටින්.

පසුදිනම මැක්කි ලොකු මුදලකට පොඩි හුරතල් ලොම් පිරුණු බලු පැටියෙක් ගෙනැත් දුන්නා.

**"මේකාගේ සීයාගෙත් සීයා එළිසබෙත් රැජිනිගේ හුරතල් බල්ලා. හොඳ නම්බුකාර බල්ලෙක්. මෙයා රෑට එළියට දාලා දොර වහන්න. පොඩි එකා වුණාට සද්දයක් ඇහුණු ගමන් බුරයි."** මැක්කි බලු කුක්කාගේ පට්ටන්තරය දිගහැරියේ උජාරුවෙන්.

**"දැන් නම් හුඟක් බලු කුක්කෝ නම්බුකාර විදියට තමයි බුරන්නේ."** කොණ්ඩි පෑවේ කෝචොක් සිනහවක්.






**"කොහොමද? දැන් හොඳට බුරනවද?"** මාසයකට පමණ පසු මැක්කි බලු සුවදුක් විමසුවා.

**"හරි ෂෝක් අනේ! හොඳට බුරනවා."** පිංකිගේ මුහුණ හිනාවෙන් පිරිලා.

**"එහෙම තමයි මං හොයලා දෙන කුක්කෝ. ඩියුටිය හරියට කරනවා."** මැක්කිට හිනා කටයි.

**"කෙහෙම්මල! ඔයාගේ බලු කුක්කා නෙවෙයි අනේ බුරන්නේ."**

**"එහෙනම්? තවත් බලු කුක්කෙක් ගෙනාවද? මේ කාලේ නම් එක කුක්කෙක් මදි තමයි."** මැක්කි කෙඳිරි ගෑවා.

**"බම්බුව! වෙන කුක්කෙක් ගෙනාවේ නෑ අනේ!"** පිංකි පැවසුවේ දෙනෙත් බබළවමින්.

**"එහෙනම්?"** බටු මැක්කි දැන් කරකවා අතහැරී ගානයි.

**"ඔයා දුන්න වර්ගයේ බලු කුක්කෝ දැන් හරි මිලයි. මේ දවස්වල ළඟ ගෙවල්වල හිටපු බලු කුක්කෝ කීපදෙනෙක්ම හොරකම් කරලා තිබුණා. මගේ කුක්කත් හොරකම් කළොත් අපරාදෙනේ. ඉතින් මං චුට්ටංම චුට්ටං බලු පැටියා මගේ හබී චූටික්කගේ ඇඳේ නිදි කරවලා රෙද්දක් පෙරෙව්වා. රෑට චූටික්කා මිදුලට තල්ලු කරලා දොර වහලා, සද්දයක් ආවොත් බුරන්න කිව්වා. හරි ෂෝක් අනේ! එයා දැන් රෑට මිදුලට වෙලා බුරනවා."** පිංකි පැවසුවේ ඉහ වහා ගිය සතුටින්.

**සංඛ සඳරුවන්**

දැන්වීමකි





# අම්මට ගොඩක් ආදරේ දුවෙක්ගෙන්
# මං එහෙම අහපු එක වැරදියි

## ඈවසරයි

බියංකා නානායක්කාර ලියයි

84 කොටස

සෙනෙහෙලතා මැණිකේගේ දුරකතනය නාදවෙනු තේනුක අසා සිටියත් ඇය ඊට කතා කළේ නැත. සාමාන්‍යයෙන් ගෙදර වැඩිපුර නරඹන රූපවාහිනී චැනලය තේනුක දනියි. චතුමිණී කීවේ අයියා ගැන ප්‍රවෘත්තියක් යන බවයි. ඔහු වහා ටෙලිෆෝනයෙන් අදාළ රූපවාහිනී චැනලය ටියුන් කළේය. ඒත් ඒ මොහොතේ ඒ ප්‍රවෘත්තිය නිමවී තිබුණි. නියත වශයෙන් සහෝදරයා පසුගිය කාලයේ සේම අප්පච්චිගේ ඇමති පට්ටමේත් මඩගාන වැඩක් ආයෙත් කරන්නට ඇත. නැත්තම් ඔහු ගැන ප්‍රවෘත්තියක් යන්නට තරම් දෙයක් නැත.

මේනක තෙන්නකෝන් තමන්ගේ ජීවිතයට වද කරදර ගෙන ආවත් සහෝදර හැඟීමට ඔහු ගැන හොයා බලන්නට හිත වෙහෙසුණේය. ඒත් වෙලා ඇති දෙය දැනගන්නට අම්මා කතාකරන තුරුම සිටිය යුතුය. තේනුකගේ නොඉවසිලිවන්ත ඇඟිලි යළිත් වතාවක් අම්මාගේ දුරකතනයේ අංකය එබුවේය. එවර එය කාර්යබහුල වී තිබුණි. ඔහුට ඒ ප්‍රවෘත්තිය මොකද්දැයි දැනගන්නට කතා කරන්නට කෙනෙකු ඒ ගෙදරම සිටින බව මතක් වුණත් චතුමිණීට කතා කරන්නට ඔහුට සිත් වුණේ නැත. ඒ වෙනුවට තේනුක තෙන්නකෝන්, බණ්ඩාර ඇමතිවරයාගේ දුරකතනයට ඇමතුමක් ගත්තේය. දුරකතනය නාද වූ සැනින් ඔහු ඇමතුම ගත්තේය.

**"අප්පච්චි කොහෙද ඉන්නෙ...?"**

**"පොලිසියේ."**

**"එහෙනම් මං පස්සෙ ගන්නම් අප්පච්චි. ඒත් අප්පච්චි මේ වෙලාවෙ පොලිසියේ ඉන්නෙ ඇයි කියලා විතරක් මට දැනගන්න පුළුවන්ද?"**

**"අයියා ආයෙත් ලෙඩක් දාගෙන. අම්මා දැන් කතා කරලා කිව්වා ඒක ටීවී නිව්ස්වලටත් ගියා කියලා. මං පුතාට පස්සෙ කතා කරන්නම්. මං මේ ඕඅයිසී මහත්තයා එක්ක අයියා ගැන කතා කරන ගමන් පොඩ්ඩ පුතා."**

**"හොඳයි අප්පච්චි..."**

තේනුක බණ්ඩාර තෙන්නකෝන් දුරකතනය අනෙක් පුටුව මතින් තැබුවේය. අනතුරුව දෑත දෙපසට ඔසවා ඇඟ මැලි කඩා ඒ දෑත හිස දෙපස තබාගෙන මොහොතක් වෙලා සිටියේය. අප්පච්චි පොලිසි යන්නට තරම් ඔහු මේ පාරත් හොඳම අලුගුත්තේරු වැඩක් කරන්නට ඇතැයි තේනුකගේ සිත කීවේය.

**"දැන් මං ආවට කමක් නෑ නේද...?"**

පිටුපසින් අංජනාගේ කටහඬ ඇසෙද්දී ඔහු ඒ ඉරියව්වෙන්ම ගෙල කරකවා බැලුවේය. මද අඳුරේ අංජනාගේ දිලිසෙන දෑස් ඔහුගේ නෙතට හසුවිය.

ඔහු කතා නොකරම ඉඳසිටි ඉරියව්ව වෙනස් කර ඇගේ දකුණතින් සිරකර අල්ලා ළඟට ගත්තේය.

**"මං අතන දොරකඩට වෙලා බලාගෙන හිටියේ ඔයාගේ කෝල් එක ඉවරවෙනකල්..."**

ඇය ඔහුගේ හිස මතින් වම් අත තැබුවාය.

**"ඒ මොකද?"**

**"මේ රෑ තනියම එළියට කරලා තියන්න බයයිනෙ..."**

**"ඇයි හොරු අරන් යයි කියලා බයද?"**

ඇගේ ඉඟ වටා අත දමා තවත් ළඟට ගනිමින් තේනුක ඇසුවේ සැහැල්ලුවෙනි. පරිසරයෙන් දැනුණු සීතල බව මොහොතකට උණුසුම් වෙනු අංජනාට දැනුණි. ඒ නිසා කතා නොකරම ඇය ඒ සුවය වින්දේ දෑතින්ම ඔහුගේ හිස පිරිමදිමිනි.

**"අපේ ආදරේට වෙන අයට තියෙන කිසිම ප්‍රශ්නයක් නෑ. ඒත් නෝනා අපි දෙන්නට මේ වගේවත් ආදරේ කරන්න වෙලාවක් නෑනේ..."**

තේනුක කීවේ ඇත්තටමය. ඔහු ඇගේ ඇඟට යාන්තමින් හිස හේත්තු කළේය.

**"සුවඳයි..."**

සෙමින් ඇයට ඇසෙන්නට කියද්දී අංජනාගේ ඇස් නිවසේ දොරවල් දෙසටද යොමුවුණේය. ඔවුන් දෙන්නා එළියේ බව දන්නා නිසා අම්මා එළියට එන්නේ නැත. නංගීත් මල්ලීත් හිටියේ රූපවාහිනිය ළඟය. නිවස අයිති විජේසිංහ මහත්මිය නිවසින් එළියට බැස්සොත් හොඳ නැත.

**"ඔයා කැමති නැද්ද නෝනා කොහේ හරි රටකට ගිහින් ජීවත් වෙන්න?"**

තේනුක අංජනාගෙන් ඇසුවේ ටික දිනක සිට අසන්නට හිත තබාගෙන සිටි ප්‍රශ්නයකි.

**"ඔයා ඉන්නවනම් මං ඕන තැනක ඉන්න කැමතියි. ඒත් මේ වෙලාවෙ නම් ඒකට මට කැමති නෑ කියන්න තමයි වෙන්නේ..."**

**"ඒ මොකද?"**

අංජනා ඔහු ළඟම තිබූ අනෙක් ප්ලාස්ටික් පුටුවෙන් ඉඳගත්තේ තේනුකගේ අතේ පැටලීගෙනමය.

**"අපේ අම්මා පව්. අම්මා ඔය හිතේ හයියට මෙහෙට වෙලා හිටියට මං දන්නවා එයාට හරි අමාරු ඇති අපේ පවුල බලාගන්න. මොකද අප්පච්චි ඉන්න කාලෙ ඒ ඔක්කොම කළේ අප්පච්චිනෙ. මේ මාසේ අන්තිමට අප්පච්චිගෙ තුන් මාසේ දානෙ දුන්නම අපි ඔක්කෝටම කොළඹ ගිහින් එකට ඉන්න පුළුවන්..."**

**"සොරි..."**

සැබෑම පසුතැවිල්ලකින් තේනුක අංජනාගේ මුහුණට එබී කීවේය. ඒ තමන් කළේ ආත්මාර්ථකාමී යෝජනාවක් කියා ඔහුට ඒ මොහොතේ දැනුණ නිසාය.

**"ඇයි ඉතින් සොරි කියන්නේ... ඔයා ඒ දේ ඇහුවේ අපි දෙන්නගෙම හොඳටනේ."**

**"ඔයා අම්මට ගොඩක් ආදරේ දුවෙක් කියලා දැන දැන මං එහෙම අහපු එක වැරදියි කියලා හිතුණෙ ඊටපස්සෙ..."**

**"ඒකට කමක් නෑ... නංගිගෙයි මල්ලිගෙයි ජීවිතේ පිළිවෙළක් කළාට පස්සෙ මට අම්මව මගේ ළඟ තියාගන්න පුළුවන්..."**

**"එහෙම හොඳයි. අපි බලමු මේ දෙන්නා විභාගේ පාස් වුණාම පිටරටකට යවන්න. ඉගෙනගන්න ගමන් ඒ රටවල්වල රස්සා කරන්න පුළුවන්."**

**"මේගොල්ලොන්ට අම්මා නැතුව මේ ගෙදර වැඩ ටික තනියම කරගන්න බැරි එකේ කොහේ යන්නද අනේ..."**

> **"ඔයාට අම්මා කතා කරනවා. මං යන්නද?" අංජනා ඔහුගෙන් ඇසුවේ ඒ ඇමතුමට ඔහු කලින් කතා කළේද තනියම වීම නිසාය. ඔහු කිසිවක් නොකියාම ඇයගේ අත තවත් සිරකර අල්ලාගත්තේය**

**"එහෙම කියන්න එපා. ළමා කාලෙ ඉවරවෙද්දී දරුවන්ට ස්වාධීන වෙන්න අම්මලාත් ඉඩ දෙන්න ඕනි. එහෙම නොකරනවා කියන්නේ අම්මලා දරුවන්ගෙ කොඳු කඩනවා කියන එක. විශේෂයෙන් පිරිමි දරුවන්ගේ. එහෙම හැදුණ කොල්ලෙක් කසාද බඳින කෙල්ලත් අන්තිමට පව්."**

අංජනා ඇල්ලේපොල ඔහු කියන්නක් නිහඬව අසා සිටියාය.

**"ඔයාලගෙම බලන්න. කවුද හිතුවෙ අප්පච්චිට මෙහෙම වෙයි කියලා. හදිස්සියේ හරි අම්මත් නැති කාලයක් ආවොත් එයාලට ජීවත්වෙන්න ආත්මශක්තියක් තියෙන්න ඕන."**

ඔහු කියන්නේ ඇත්ත බව අංජනා දැන සිටියාය.

**"බලමුකෝ..."**

ඇය කීවේ ඒ ගැන පසුවට සිතන්න හිතාගෙනයි. කොහොමත් මේ ජීවිතෙන් ගොඩ යන්නට නම් හොඳින් සල්ලි හම්බ කරන්නට ඕනෑය. ඊට පිටරටකට ගොස් හෝ රැකියා කළ යුතුය. දෙදෙනා අතර නිහඬ බව බිඳුණේ තේනුකගේ අතේ වූ දුරකතනය හැඬවීමෙනි. තිරයට වැටුණු එළියට ඇමතුම කාගෙන්දැයි තේනුක මෙන්ම අංජනා ද දුටුවාය. ඒ අපේ අම්මාගෙනි. අංජනා මද එළියට පෙනෙන ඔහුගේ මුහුණ දෙස බැලුවාය.

**"ඔයාට අම්මා කතා කරනවා. මං යන්නද?"**

අංජනා ඔහුගෙන් ඇසුවේ ඒ ඇමතුමට ඔහු කලින් කතා කළේද තනියම වීම නිසාය. ඔහු කිසිවක් නොකියාම ඇයගේ අත තවත් සිරකර අල්ලාගත්තේය.

**"ඔය කෝල් එක කට්වෙයි..."**

**"එතකොට එයා ආයෙත් ගයි..."**

ඇමතුම ගනිමින් ඔහු කීවේය.

**"මේ ලොකු පුතා කවදාවත් මට සැනසිල්ලෙ මැරෙන්නවත් දෙන්නෙ නෑ පොඩි පුතා..."**

සෙනෙහෙලතා මැණිකේගේ කටහඬේ ඇති කණස්සල්ල ඒ ළඟ සිටි අංජනාටත් දැනුණේය.

**"ඒ පාර මොකද අම්මා...?"**

ප්‍රශ්නය තේනුකගෙනි. අංජනා ඇසෙන දේ අසා සිටියාය.

ලබන සතියට...

# කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.

"කවි යාය"
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න
සංස්කරණය - මනෝරා ප්‍රේමතිලක



## අම්මා

යහගුණ කියා දුන් මගෙ ආදර අම්මේ
නිමක් නොමැති සෙනෙහෙ ගඟකිය අම්මේ
පියකරු වත හරි සොඳුරුයි මගෙ අම්මේ
හැම භවයක ඔබ මගෙ වේවා අම්මේ

යහගුණ කියා දුන්නා ගුරුවරිය වෙලා
නිරෝගීව හැදුවා වෙදැදුරිය වෙලා
අපෙ කන්නලව් ඇහුවා දෙව්දුවක් වෙලා
ආදර මව්නි ඔබ මගෙ මුළු ලොවම වෙලා

**තිලිණි නිලුෂිකා
හිඹුටුවැල්ගොඩ
කැලණිය**

## නිමා නොවුණු සෙනෙහෙ හැඟුම්

මතකයි පෙර දිනයක අපි දෙදෙනා
සිහින විමානෙ පෙම්සුව වින්ද
ඔබ නොදුටුව මා, මා නොදුටුව ඔබ
අසීමිතව සෙනෙහෙන් බැඳුණා

පියවි ලොවේදී අපේම වන්නට
මගේ බොළඳ සිත බියවූවා
මේ විඳිනා සෙනෙහස යම් දිනයක
අහිමි වෙතැය සිත ගතු කීවා

අද අපි දෙතැනක ළඟපාතක නැත
අපේම වන්නට නොහැකි වුණා
එහෙත් සුහද ඔබ මගේම සිත තුළ
මිහිරි සෙනෙහසේ සුවඳ වුණා

සිහින විමන් තුළ විඳිනා සෙනෙහස
කෙදිනකවත් විරසක වෙන් නෑ
ඔබහට පිදු පෙම සැමද එලෙසය
සැබෑ පෙමට විරහව හිමි නෑ

වෙනතක සිටියද සතුටින් ඉනු මැන
එද දුන්නු සෙනෙහස අඩු නෑ
අපේම නොවුණ ද සෙනෙහස අහිමිව
මතු කවදවත් වෙන්වෙන් නෑ

**කල්යානි
බුත්තල**

## ඔහු ද පියෙකි

දිවි මං තලාවේ
ජය දද නංවා
මිනිස්කම ආත්මය කරගත්
ළබැඳි පියාණනි
සැමට යහපත පතමින්
යුක්තියට යුක්තියක් වෙමින්
සව්ලෝ සතහට
පරමාදර්ශයක් වෙමින්
උපේක්ෂාවෙන් බලන්නට
මාවත පෙන්වා
අනියත මනු දිවියට
කොමාවක් තබා
අප වෙතින් සමුගත්තද
මතක පොතේ රන් අකුරෙන්
ලියැවී ඇත ඔබෙ අමිල නාමය
මෙහෙවර සුගන්ධය
සදතනිකව විදුරණය වෙමින්
සියලු දිනවල රාව ප්‍රතිරාව නංවමින්
සක්වල ද පසුකොට
තුන්කල් දුටු
මුනිවරයෙක් නොවූ මුනිවරයාණනි
උත්තුංග පෞරුෂයාණනි
ජීවන තක්සලාවේ
ඇදුරෙන් නොවූ ඇදුරාණනි
සුහදණනි සහෘදයාණනි
ඔබට සුව නින්දක්
දෙව්ඳුන් දකින්නට
වතට වත දෙමින්
මුනිවර සුරදූත කැල ද සමගින්
සව්දිය පුරන්නට

**මලින්ත බෝපෙආරච්චි
දළුගම
කැලණිය**

## මහරු මල්ගස

දිගු කලකට පසුව
අහම්බෙන් පසුකර යන විට
එදවස අප විසූ කුලි නිවහන
එතැන වූ රතු මල් පැලඳි
නම නොදන්නා විසල් ගස යට
කුඩා දැරියන් දෙදෙනෙක්
බෝනික්කි සෙල්ලමක

එසඳ නම් කර තිබිණි අප එය
කතන්දර පොත්වල මෙන්ම
සුරඟනන්ගේ පුදුම ගස ලෙස

අරුමයකි!
පෙර මෙන්ම ඒ පුදුම ගස යට
ඒ මොහොතේ සිටියේ මා ය
අසල්වැසි ගෙදර අරුණීත් සමඟ
අරුණී... නොදනිමි දැන් ඔබ කොහිද?
මම ද දැන් ඒ මිහිරි අතීතෙන්
බොහෝ දුර ඈතක ය
ඒ නමුදු
අපේ රතු මල්ගස අතු වසා මල්බරව
තවමත් එතැනම ය
එසේ වුව
බෝනික්කන්ට මල් මාල පළඳන්ට
එද අප මල් නෙලූ ඒ ගස
දැන් අපට නගින්නට බැරිතරම්
උස වැඩිය

**ඉන්ද්‍රා පුෂ්පානි ජයවර්ධන**

## නොමළ සිහින

අදත් ඇවිද යනවිට තනියම
මතක හැංගුණ මංපෙතේ
ඔබ සුවඳ රැඳි මදනල
යළි අවුත් මතකයේ එතේ

කියා ගන්න බැරිව ගොළුවුණ
නොමළ හැඟුමක් සිතේ
හද පාරන රිදුමක් ඇත තවම
මඟහැරුණු මිටියාවතේ

සඳ වැසී අඳුරු වලාවෙන්
තරු විසිරී සඳ නැති සොවින්
ආදරේ වෙලනුයේ ඇයිද
මෙතරම් විරහවක් ප්‍රේමයේ

හිමි නැතත් තුරුළු වන්නට
ඇස් වසා ඔබ සිපගන්නට
හැම රැයකම ඔබට නොදැනිම
මගේ කරගන්නවා මම ඔබව

**හි.බ.හේරත් මාකඩුවාව
රාජරත්න වත්ත
මහව**

## අත් යන්ත්‍ර

දුකත් සතුටක් ලෙස සිතාගෙන
තැවුල් සඟවාගෙන සිනාසෙන
දැරීම ම දිරියෙන් දරාගෙන
වියන්නේ ජීවිත රටාවද

වෙහෙසුණේ අත් යන්ත්‍ර කරගෙන
තමන් වෙනුවෙන් නම් පුදුම නැත
ස්වාත්මය කර අප සැමගෙ සුව
නුඹ සදිසි කැපවුණේ කවුරුද

නිවස නිදහස් උල්පතක් කර
සුවය ගෙනෙනා සිරිදුවක ලෙද
ඉසිඹුවක් ලද තැන ද අප ගැන
සිතන පිය බඳ ඔබය සැම කල

**පමෝදි මේකලා**

## දියණියට

සොඳුරු සමනල නුඹෙ යොවුන් විය
බොළඳ පෙම්බස්වලින් රවටන
මිනිස් වෙස්ගත් සහස් සුවහස්
නරුමයන් අපමණයි මේ ලොව

නිමේශයකින් නුඹෙ වසන්තය
සොරාගෙන අඳුරේ දවන්නට
සෙනෙහසේ සළුවෙන් මුවාවුණු
වංක හදවත් අපමණයි අද

යොවුන් නුඹෙ හද නිබඳ අයදින
ප්‍රේමයේ රස දනිම් අපමණ
ඒ නමුත් ලොව විෂම බව දැන
'සැබෑ'ප්‍රේමය හඳුනගනු මැන

**දිස්නා රංජනී පිගේරා
මීගහවත්ත**

දිවයින පුරා නිවෙස් වල නැවතී වැඩ කිරීමට කැමති ගෘහසේවිකාවන් අවශ්‍යයි.
ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම්, දරුවන් බලාගැනීමට හා මහළු හෝ රෝගී වූ අය බලාගැනීමට කැමති අය අමතන්න.
වැටුප රුපියල් 30,000 - 35,000
ආහාර ඇතුළු සියලු පහසුකම් නොමිලේ
072 945 9247

ප්‍රධාන පෙළේ රූපලාවණ්‍යාගාරයක් සඳහා කාන්තා රූපලාවණ්‍ය ශිල්පිනියක් ඉතා ඉක්මණින් අවශ්‍ය කර තිබේ.
(අවු 02 පළපුරුද්ද) ඉහළ වැටුප්
සැලොන් අනෝමා - දෙහිවල
දුරකථන : 011 2731603

උකස් රත්තරන්
ඔබගේ සින්නවීමට යන රන් භාණ්ඩ පැමිණ බේරා දී වැඩිම මිලට ගනු ලැබේ.
(දිවයින පුරා සේවා)
071 720 5121 / 077 824 2352

# ආදරය නිසා කඳුළු සැලූ මට පිහිටවූ එකම තැන

- පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා/පෙම්වතිය ලඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2022 / 2023 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රැකියා ලබාගැනීමට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට

**ක්ෂණික ඇමතුම් -0777 444908**

බිංගිරියේ ගුරු හාමුදුරුවෝ
සමග සේන මහතා 037 22 48 828
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

හමුවීම
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස
- 3.00 දක්වා

ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වැවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැඟ හොරොම්බා හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

careteker
— Guru Dewa Shanthi Services —
Post Code No ' 60181
Gurugalagoda "Molawatta"
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව"
තැ. ස අංකය 60181
ගුරුගල්ගොඩ
මෝලවත්ත
හොරොම්බාව

විදේශගත අයගේ රැකියා, ගේ දොර ඕනෑම ප්‍රශ්නයක් සඳහා මුහුදෙන් එතරට බලපාන පරිදි සකසා DHL මගින් ඔබ අතට ඉක්මනින් විසඳුම් 0094 37 22 48828



**ENGLISH** නිවසට පැමිණ ඉගැන්වීම මහනුවර හා අවට

- රජයේ ඉංග්‍රීසි ගුරුවරයෙකු විසිනි.
- 3 ශ්‍රේණිය සිට 10 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය (අ.පො.ස. සා/පෙළ)
- උසස් පෙළ - GENERAL ENGLISH
- වැඩිහිටි අයට නිවැරදිව ලිවීම හා කථාව

◆ විවිධ දැනුම් මට්ටම් වල සිසු සිසුවියන්ට වසර 30කට වැඩි කාලයක් ඉගැන්වීම තුලින් ලද අත්දැකීම් මත, ඔවුනට පහසුවෙන් අවබෝධ කරගත හැකි පරිදි සකස් කර ඇති පාඩම් හා අභ්‍යාස මගින් ක්‍රමානුකූලව භාෂාව භාවිතය හුරු කෙරේ.
◆ සතියකට පැය 1 1/2 බැගින් මාසයකට පන්ති වාර 4කි.

විමසන්න- 077-6459650



ධරණී

කර්තෘ,
ධරණී පුවත්පත
ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07.

දුරකතන: 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් :
dharanee.editor@liberty.lk

දැන්වීම් :
0112 672601,
0112 672603
ෆැක්ස් : 0112 672648

බෙදහැරීම් :
0112 127204,
0112 127210
ෆැක්ස් : 0112 455134



**මූල්‍ය බැංකු ඇබෑර්තු**

★ බැංකු ක්ෂේත්‍රයේ පවතින පුරප්පාඩු සඳහා ප්‍රාදේශීය මට්ටමින් තනතුරු කිහිපයක අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.

මුළු 38,000/-
18/40 ගැ/පි
(මැන් පවර් නොවේ)

0712 564 715 | 0702 725 731
0742 916 140 | 0718 853 997
0703 346 072 | 0774 024 155



**රැකියා ඇබෑර්තු**

නිවසක නැවතී සේවය කිරීමට කාන්තාවක ඉක්මණින් වුවමනායි.

091 22 74 999 / 076 37 92 043
076 22 99 750 / 078 47 26 188



**රු. 35000/- කට වැඩි ආදායමක්**

විලාසිතා අත්පලඳනා, කරාබු සැකසීම.

- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ

වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.

070-6128955



# මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්

**විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.** නැතහොත් ලිපියක් මගින් විමසන්න. (පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

**ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?**
**ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?**
**අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?**

**මෙන්න!** එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම

* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට

මත්කුඩු සහ සුරාව

* රැකියා ලබා ගැනීමට
* සියලු විභාග සඳහා
* නොවිකිනෙන ඉඩම් විකිණීමට

*විවාහ පමා අයට
*හැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

# මාතර වෙද හාමුදුරුවෝ

ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යයකට
**ඇබ්බැහි වූ අයෙක් ද?**
එසේ නම් ඉන් මිදීමට අමතන්න.

වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න

අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත **මාතර වෙද හාමුදුරුවෝ**

භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

## පාඩම් අංක 35

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.

ස්වයං රැකියා



# වෙහෙර ගිලපු එකාට අග්ගලාවත් කප්පක්ද කියන්නැහේ හදලම බලමු



සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා
පාඨමාලා උපදේශිකා

මහෝෂධ කියලා මහා නුවණැති පඬිවරයෙක් ගැන අපි ජාතක කතාවල අහල තියනවනේ. මේ පඬිවරයාගේ නුවණ ගැන පැහැදුණු රජතුමා ඔහුව වාසලේ ප්‍රධාන උපදේශකවරයා බවට පත් කළා. ඉතින් මහෝෂධ පඬිතුමා එක්ක ඊර්ෂ්‍යාවෙන් ඉඳපු පණ්ඩිතයන් හතරදෙනෙක් දවසක් රජුට මහෝෂධ ගැන බොරු කේලම් කියනවා. මේ කේලම් අහලා කුපිත වෙච්චි රජතුමා පහුවදා උදෑසනම මහෝෂධව මරා දන්න අණ දුන්නා. මේ කතාව අහගෙන උන්නු රජ බිසොවුන් රාත්‍රියේම මේ විස්තරේ තල්පතක ලියලා අග්ගලාවක සඟවලා මහෝෂධ පඬිවරයාට යැව්වලු. කාරණාව දැනගත්තු පඬිතුමා පණ්ඩිතයන්ගේ කේලම් බොරු බව උපාය මගින් රජුට පැහැදිලි කරලා ජීවිතේ බේරගත්තලු.

මහෝෂධ පඬිතුමාගේ පණ බේරන්න අග්ගලා ලියමනක් යැව්වය කියන මේ කතාව තියෙන්නේ උම්මග්ග ජාතකයේ. ඉතින් එහෙම බැලුවහම අග්ගලා කියන්නේ බොහෝම පැරණි කෑමක් නොවෑ.

හැබැයි අග්ගලා කියන්නේ සිංහලයන්ට ආවේණික වෙච්චි සිංහල රස කැවිල්ලක්ය කියලත් සමහරු කියනවා. ඔන්න රාවණා රජතුමා සීතා දේවියව ලංකාවේ සඟවගෙන ඉන්න කාලේ සීතා දේවිට සුව නොවෙන උදරාබාධයක් හැදුනලු. ඉතින් ඕක අහලා සංතාප වෙච්චි රාවණා රජ, සීතා දේවිට තමන්ගේ අතින්ම අග්ගලා හදලා, එව්වට ඖෂධ මිශ්‍ර කරලා සීතට යැව්වලු. අග්ගලා ගෙඩි දැකලා කුපිත වෙච්චි සීතා ඒ අග්ගලා ටික රාස්සාව කියන කන්ද උඩට වීසි කළාලු. ඊට අවුරුදු ගාණකට පස්සේ ඒ ගම්පළාතේ උදවියට රාස්සාව කන්දෙන් සීතා විසි කළාය කියන අග්ගලා ගුලි ලැබෙන්න ගත්තලු. ඔය ගුලියක් ගෙදර ගෙනල්ලා ගල ගාලා බිව්වහම බඩේ අමාරු, ඇඟපත රුදා නැති වෙනවා කියලයි ජනවහරේ කියැවෙන්නේ.

එව්වයේ ඇත්ත නොදන්නවා වුණත් අග්ගලා කියන්නේ සිංහලයාගේ කැවිල්ලක් බව රොබට් නොක්ස්ගේ 'එදා හෙළදිව' පොතේ මෙන්න මෙහෙම ලියලා තියෙන බව නම් ඇත්තක්.

**"අග්ගලා නමින් සිංහලයන්ගේ තවත් අලුමුසුවක් වෙයි. බැදි හාල් පිටි පැණියෙන් අනා ගම්මිරිස්, කරඳමුංගු හා කුරුඳු මුසුකොට මේ ගුලි සාදනු ලැබේ. මේවා ගුලි කිරීමෙන් පසු තද වේ. මේවා දීර්ඝ කාලයක් තබාගෙන කා හැකිය."**

ගෙදර කුස්සියේ ඉතිරිවෙන බත් ඩිංගිත්ත වේලලා ඒ ඉතුරුම් බත්වලින් අග්ගලා හදන එක ඒ කාලේ ඉඳලම අපේ ගෘහණියන්ගේ පුරුද්දක්. ආහාර අහේනියක් ආවම සිංහලයා අග්ගලා කකා වතුර බොනවලු. අනික ඒ කාලේ මිනිස්සු ගමන්බිමන් ගියේ පයින්මනේ. ඉතින් දවස් ගණන් පයින් යද්දි කෑම හොයාගන්න අමාරු නිසා අග්ගලා හදාගෙන මග දිගට කන්න අරගෙන යනවලු.

**"අග්ගලා කන්ඩෝං පුතා
හෙළේ නගින් ඩෝං පුතා
අපේ බුදුන් අපි වඳින්ට
පෙරළි පෙරළි අපි වඳින්ට"**

ඒ කාලේ ඇත්තෝ සිරිපා කරුණා කරන්නත් අග්ගලා අරගෙන යනවලුනේ. අග්ගලා හප හපා සිරිපා කරුණා කරද්දි සීතල නැති වෙනවයි කියලයි කියන්නේ.

සිංහලකම එක්ක බැඳිච්ච ආ හා ර ය ක් නිසාදෝ අදටත් අග්ගලා ගෙඩියක් කාලා ඉඟුරු දාපු ප්ලේන්ටියක් බොන්න අකමැති කෙනෙක් මේ රටෙන් නම් හොයාගන්න බැරිවෙයි. වෙහෙර ගිල්ල එකාට අග්ගලාවත් කප්පක්ද කියලා කියමනක් තියෙනවා. වෙනින් කෑම කෙසේ වෙතත් අග්ගලා ගිලින එක නම් කාටත් කිරිකපු වැඩක්. ඒ නිසා ස්වයං රැකියාවක් විදියට අග්ගලා හැදුවොත් අත උඩින් විකුණාගන්න පුළුවන්.

පොලිතින්වල හරි ප්ලාස්ටික් බඳුන්වල හරි අග්ගලා ඇසුරුම් කරන්න පුළුවන්. අග්ගලාවක් අවුරුද්දක් වුණත් නරක් නොවී තියාගන්න පුළුවන්. ඒත් ඇසුරුම්වල නිෂ්පාදනයෙන් මාස හයක් වගේ කාලයක් සඳහන් කරන එක වඩා හොඳයි. සාමාන්‍ය ප්‍රමාණයේ එක අග්ගලා ගෙඩියක් දැන් රුපියල් 50කට වගේ අලෙවි කරන්න පුළුවන්. වැඩි විස්තරවලට වෙනදා වගේම 0714766819 මේ අංකයට කතා කරන්න.

මුලින්ම අපි සහල් 250g කින් අග්ගලා ගෙඩි හදලා බලමු. අලෙවියට අග්ගලා හදනවා නම් සම්බා සහල් නැත්තම් නාඩු අවශ්‍ය වෙනවා. සහල්වලට අමතරව සීනි 125g, පොල්පැණි 125g, ගම්මිරිස් ඇට 10ක් සපයාගන්න.

**පියවර 1**

මුලින්ම සහල් ටික සෝදලා වේළගන්න. ඊටපස්සේ සහල් ටික පොරි වෙන්න නොදී කබලේ බැදගන්න.

**පියවර 2**

බැදගත්තු සහල් ටික ගම්මිරිස් එක්ක එකතු කරලා කොටලා හලාගන්න. අග්ගලාව උඩ තවරන්න පිටි 25gක් විතර අරන් තියාගන්න.

**පියවර 3**

පැණි ටිකයි, සීනි ටිකයි නූලක් වගේ ඇදෙනකල් උණු කරගන්න. ඊටපස්සේ මේ මිශ්‍රණය ලිපෙන් බාගෙන ඒකටම පිටි ටික එකතු කරලා රස්නේ පිටින්ම ගුලි කරන්න. අර තියාගත්තු පිටි ටික තවරලා රස්නේ ගියාට පස්සේ ඇසුරුම් කරන්න.





එස්. හෙට්ටිආරච්චි




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.